නි/4023 ලුතිනන් කේආර්එම්ජ් කරුණාරත්න ශ්‍රීලපාහ 95.08.14 දින ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදී. නි/19020 2/ලුති පී කුලරත්න, ශ්‍රීලපාහ 96.06.09 දින ජයන්තිපුර වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/21209 සරයන් නවරත්න එම්එච්පීයූ 95.09.05 දිනවැලිකන්දප්‍රදේශයේ ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/21193 සැරයන් කන්න්ගර ඩීඑල්පී 96.06.09දින වැලිකන්ද ප්‍රදේශයේදී ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/21608 කෝප්‍රල් ගුණරත්න එස්පී 95.09.03 දින වැලිකන්දප්‍රදේශයේ ත්‍රස්ත ප්‍රහාරයෙන් මිය යන ලදි. සෙ/21758 කෝප්‍රල් මුනිදස ඩබ්ඩී 95.09.03 දින වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/21567 කෝප්‍රල් ප්‍රේමසිරි ජීඑල් 95.09.03 දින වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී සෙ/21009 ලාකෝ අශෝක් කුමාර එම්ආර් 95.09.03 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී සෙ/21963 ලාකෝ ආරියදස ඩබ්ඒඑම් 95.09.03 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී සෙ/22010 ලාකෝ විජේසිංහ ඩබ්ඒඑම් 95.10.06 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/21719 ලාකෝ විල්බට් ඒඩබ් 95.05.06 ජයන්තිපුර වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/22107 ලාකෝපියරත්න එච්පීඑම්පීජ්. 95.05.09 ජයන්තිපුර වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/20485 ලාකෝ පෙරේරා එච්ඩබ්එෆ් 95.05.09 ජයන්තිපුර වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/23130 සාසෙ රණසිංහ එම්පීඑම් 95.09.05 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/22907 සාසෙසුනිල් ජයරත්න යූපී 95.09.05 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී සෙ/23308 සසෙලසන්ත ඩබ්ජ්පීජ්ජ් 95.09.05 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/22547 සාසෙ පාලිත ප්‍රේමසිරි ජීඅයි 95.09.03 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/23063 සාසෙ නිමල් ප්‍රසන්න කේජී 95.09.03 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/23328 සාසෙ ප්‍රසන්න ඩීපීඑස් 95.09.03 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/22547 සාසෙ ආනන්ද ජයරත්න පීපී 95.09.03 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/22841 සාසෙ මනෝජ් කුමාර ජී 95.09.03 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/22164 සාසේ රත්නසිරි පීකේජී 95.09.03 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/22007 සාසෙ නිමල්සිරි ජේ

බී 95.09.03 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/22833 සාසෙ පුෂ්පකුමර ඩබ්එම්එම් 95.09.03 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/20657 සාසෙ හේමපාල එස්එම්ඩී 95.10.06 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/21724 සාසේ පෙරේරා පීඑම් 95.10.06 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/21773 සාසෙ පුෂ්පකුමාර කේඩබ් 95.10.06 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/22881 සාසෙ ප්‍රේමතිලක එල්එච්පී 95.10.06 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී.සෙ/23072 සාසෙ ප්‍රේමචන්ද්‍ර ආර්එස් 95.10.06 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/23325 සාසෙ කරුණාරත්න ඩබ්ජ් 95.10.06 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/23255 සාසෙ පුවර්ණපාල කේජී 95.10.06 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/22633 සාසෙ ශාන්තකුමාර ඒආර්එස් 95.12.31 මඩකලපුව වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/23247 සාසෙ මෙන්ඩිස් එම්එස් 96.03.18 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/22858 සාසෙබාලසූරිය බීජ් 96.05.09 ජයන්තිපුර වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/23487 සාසේ ගාමිණී ප්‍රියන්තසිරි අයිඑස් 96.05.09 ජයන්තිපුර වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/23498 සාසෙ චන්දන ඩබ්එම්එච් 96.05.09 වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/23498 සාසෙ චන්දන ඩබ්එම්එච් 96.05.09 ජයන්තිපුර වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී.සෙ/23500 සාසෙ චමින්ද කේජ් 96.05.09 ජයන්තිපුර වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී.සෙ/23508 සාසෙ ආරියවංශ කේපීඑස් 96.05.09 ජයන්තිපුර වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/23488 සාසෙ රත්නායක ආර්එම්එස් 96.05.09 ජයන්තිපුර වැලිකන්ද ප්‍රදේශයේ දී ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදී.

9 (සෙව්) ශ්‍රීලපාහ

සෙ/9 ඩී 00869 සාසෙ අනුරරත්නායක ඒපී 96.03.12 දින ඉලෙයිකාඩු ත්‍රස්ථප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/9ඩී00725 සාසෙ බංඩාර පීඩී 96.03.28 දින පලාලි ප්‍රදේශයේ රැකසිට පහරදීමකදී මියයනලදී. සෙ/9ඩීවීඑජ්0281 සාසෙ රණසිංහ ආර්ජ්ඩබ් 96.03.28 දින පලාලි ප්‍රදේශයේ රැකසිට පහරදීමකදී මියයන ලිදි. සෙ/9 ඩී00308 සාසෙ සිරිසේන ටීජී 96.05.27 දින පලාලි ප්‍රදේශයේ ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදදි. සෙ/9ඩී00249 සාසේ රණසිංහ ආර්එම්එස්කේ 96.06.21 දින ත්‍රස්ථප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/9ඩී00486 ලාකෝ චන්දිම වසන්ත ඩීඑම් 96.05.27 දින වැල්වැටිතුරෙ ත්‍රස්ථප්‍රහාරයෙන් මියයන ලදී.

5 (සෙව්) ශ්‍රීලපාහ

නි/2526 මේජර් ඩීආර්යූබී රාජකරුණා, ශ්‍රීලපාහ 96.05.27 දින ත්‍රිමලේ ප්‍රදේශයේ ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදි. නි/2787 කපිතන් පීජ් රත්නායක, ශ්‍රීලපාහ 96.01.29 දින පුල්මුඩේ ප්‍රදේශයේ ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදී. නි/3100 ලූතිතන් එල්එස් රණපුර, ශ්‍රීලපාහ 96.05.19දින ත්‍රිකුණාමලය ගොමරන්කඩවල ප්‍රදේශයේ ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/5ඩී00037 බනිII දිසානායක ඩීඑම්එස් 96.01.29 දින පුල්මුඩේ ප්‍රදේශයේ ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදී.සෙ/5ඩී00073 ව/සැරයන් හියුබට් බීඩබ්එල් 96.03.25 දින පුල්මුඩේ ප්‍රදේශයේ ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදි. 5 ඩී000122 සැරයන් දයානන්ද අරුණසිරි ඩබ්එම් 96.01.29 දින ත්‍රිකුණාමලය ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/5ඩී000397 කෝප්‍රල් කරුණාරත්න ආර්එම් 96.01.29දින ත්‍රිමලේ ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/5ඩී00946 කෝප්‍රල් බංඩාර බීඑම්එම්ජී 96.05.14 දින 40 මිමි බෝම්බයක් පිපිරීමෙන් මියයන ලදි. සෙ/5 ඩී00647 ලාකෝ නිමල් ධර්මරත්න ආර්ඩී 96.03.29දින පුල්මුඩේ ප්‍රදේශයේ ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මියයන ලදි. සෙ/5ඩී00644 ලාකෝ නිමල් ධර්මරත්න ආර්ඩී 96.03.25 දින පුල්මුඩේ ත්‍රස්ථප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/5 ඩී01837 සාසේ ප්‍රියන්ත එන්ඩීපී 96.01.29 දින ත්‍රිමලේ ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/5ඩී01367 සාසේ දිනේෂ් නවරත්න ආර්එච්ඩීකේ 96.01.29 දින ත්‍රිමලේ ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/5 ඩී01656 සාසේ කුලරත්න ආර්එම් 96.01.29 දින ත්‍රිමලේ ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/5ඩී01050 සාසේ විජේසිංහ ආර්ජීඑන් 96.01.29 දින ත්‍රිමලේ ත්‍රස්ථප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/5ඩී1832 සාසේ උදිත කුමාර ආර්එම් 96.01.29 දින ත්‍රි/මලේ ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදින සෙ/5ඩී01230 සාසේ මලින්ත රංගජීව එම්පී 96.01.29 දින ත්‍රි/මලේ ප්‍රදේශයේ දී ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මියයන ලදි. සෙ/5ඩී01614 සාසේ ජයසුන්දර ඩීකේ 96.01.29 දින ත්‍රි/මලේ ප්‍රදේශයේ ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් මිය යන ලදි. සෙ/5ඩී0131 සාසේ රාජපක්ෂ එස්බී 96.01.29 දින ත්‍රි/මලේ ප්‍රදේශයේ ත්‍රස්ථවාදී ප්‍රහාරයකින් මියයන ලදි. සෙ/5 ඩී001199 සාසේ ගුණරත්නබංඩා පීඩීඩබ් 96.03.25 දින පුල්මුඩේ ප්‍රදේශයේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මියයන ලදි. සෙ/5ඩී0631 සාසේ ප්‍රියන්ත ඩබ්ජ් 96.03.25 දින පුල්මුඩේ ප්‍රදේශයේ දී ත්‍රස්ථවාදී ප්‍රහාරයකින් මියයන ලදි. සෙ/5ඩී1666 සසේ ප්‍රශාන්ත ප්‍රියංකර බීඑම් 96.03.25 පුල්මුඩේ ප්‍රදේශයේ ත්‍රස්ථ ප්‍රහාරයෙන් මියයන ලදින සෙ/5ඩී01878 සාසේ අලහකෝන් ඒඑම් 96.03.25 දින පුල්මුඩේ ප්‍රදේශයේදි ත්‍රස්ථ ප්‍රහාරයකින් මියයන ලදි. සෙ/5ඩී01959 සාසේ දිසානායක බීජී 96.03.25 දින පුල්මුඩේ ප්‍රදේශයේ දී ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/5ඩී01959 සාසේ දිසානායක බීජී 96.03.25 පුල්මුඩේ ප්‍රදේශයේ දී ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/1617 සාසේ ප්‍රසන්න බීජ් 96.03.21 දින පුල්මුඩේ ප්‍රදේශයේ දී ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදී. සෙ/5ඩී01924 සාසේ දිසානායක පීජී 96.03.25 පුල්මුඩේ ප්‍රදේශයේ දී ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් මිලදී, සෙ/5ඩී00996 සාසෙ ඩයස් විජේවර්ධන පීඑච්එන් 96.05.19 දින ත්‍රි/මලේ ප්‍රදේශයේ ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/5ඩී01242 සාසේ අනුරසිරි එම්එම්එස් 96.05.19 ත්‍රි/මලේ ප්‍රදේශයේ ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/5ඩී00124 සාසේ ධර්මසේන කේ 96.05.19 ත්‍රි/මලේ ප්‍රදේශයේ දී ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/5ඩී001179 සාසේ විජේ වික්‍රම ඩබ්ජ් 96.05.19 ත්‍රි/මලේ ප්‍රදේශයේදී ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/5ඩී01755 සාසේ ඒකනායක එච්එම් 96.05.19 ත්‍රි/මලේ ප්‍රදේශයේ දී ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදි. සෙ/5ඩී01971 සාසෙ කුමාර ජයතිලක ඩීකේජ් 96.06.08 ත්‍රස්ත ප්‍රහාරයෙන් මියයන ලදි.

# "බෞද්ධ ඉගැන්වීම් වලට අනුව නායකත්ව මූලධර්ම"

යුධ හමුද පරිපාලන රටාව තුළ විවිධ මට්ටම්වල අණදීමට අදල තනතුරු ඇත. මෙම අණදීම පෙළ අණදීමෙහි සිට හමුදපති තත්ත්වය දක්වා පුළුල් ක්ෂේත්‍රයක පැතිරී ඇත. මෙවැනි අණ දෙන්නන් හට තමන් දරණු ලබන අණදීමට සාපේක්ෂව හට පිරිස් පරිපාලනය කිරීමට සිදුවනු ඇත. එ බැවින් ඔවුන් සියළු දෙනා ම එක්තරා පිරිසකගේ වෘත්තීමය නායකයන් බවට පත් වේ. මෙම නායකයන් හට හමුද නායකත්ව මූල ධර්ම පිළිබඳව වැටහීමක් ලබා දී ඇත. එහෙත් නායකත්වය පිළිබඳ විවිධ දර්ශණ සහ ඉගැන්වීම් විශ්ලේෂණාත්මකව සංසන්දනය කිරීම මගින් නායකත්ව පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ගැනීමත්, එමගින් සාර්ථක නායකත්වයක් ගොඩනගා ගැනීමටත් හැකියාව ලැබේ.

මෙම ලිපිය මගින් විශ්ලේෂණයට භාජනය කරණුයේ බෞද්ධ ආගමික ඉගැන්වීම් වල එන දසරාජ ධර්මයන් ය. මෙම ධර්මයන් බොහෝ කලක් තිස්සේ භාරතය සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනයේ යෙදුණු රජවරුන් විසින් ප්‍රායෝගිකව භාවිතයට ගෙන ඇති බව ඔප්පු වේ. පැරණි ඉතිහාස ග්‍රන්ථ සහ පැරණි සාහිත්‍ය ග්‍රන්ථ වල එවැනි දසරාජ ධර්මයෙන් රජකම් කල රජවරුන් පිළිබඳව විස්තර සුලභව දක්නට ලැබේ. එහෙත් මෙම ධර්ම රාජ්‍ය පාලනය සඳහා පමණක් නොව වෙනත් සංවිධාන, රාජ්‍ය ආයතන, ව්‍යාපාර සමාගම් සහ සමිති සමාගම් ආදියෙහි නායකත්ව දරන්නන් හට අනුගමනය කිරීමට සිදුසු බව පෙනී යයි. ඊට අමතරව මෙම ධර්ම අනුගමනය කිරීමෙන් යම් අයෙකු හට සැනසිලි දායක ජීවිතයක් සහ ආකර්ෂණීය පෞරුෂයක් ගොඩනගා ගැනීමට හැකිවේ. මෙම දසරාජ ධර්මයන් පහතින් දක්වා ඇත.

**01. දානය**

බෞද්ධ දර්ශනයට අනුව ද්‍රව්‍ය වලින් සංග්‍රහ කිරීම ආමිස දානය ලෙසත් උපදෙස් නිවැරදි මග පෙන්වීම් ධර්ම දානය ලෙසත් දක්වා ඇත. මෙයින් වඩාත් උතුම් වන්නේ ධර්ම දානයයි. එනම් ඔබ නායකත්වය දෙන සංවිධානයට අයත් දුකට පත් හෝ අසරණ භාවයට පත් අයවලුන් හට එම තත්ත්වයන් ගෙන් අත් මිදීමට මග පෙන්වීමයි. එමගින් ඔවුන් හට ප්‍රශ්ණ පිළිබඳ යථා තත්ත්වය අවබෝධ කරගැනීම සහ එමගින් සිත් තැවුල් විසඳ ගැනීමට ද, හැකිවනු ඇත. මීට අමතරව ඔබ විසින් නායකත්වය දරණ පිරිසකගේ අභිවෘර්දිය සඳහා ඔබ විසින් කරනු ලබන ඕනෑම ආධාරයක් හෝ උපකාරකයක් දානය යනුවෙන් අදහස් කෙරේ.

**02 පරිත්‍යාගය:**

මෙයින් අදහස් කරණුයේ ඔබගේ කාලය, ශ්‍රමය, ධනය, සැප සම්පත්, පහසුකම් සහ විවේකය ආදී සියල්ලම ඔබ විසින් නායකත්වය දෙනු ලබන ආයතනයේ සුභ සිද්ධිය සඳහා පරිත්‍යාග කිරීමයි. ආත්ම පරිත්‍යාගය නායකත්වයට අත්‍යවශ්‍ය ගුණාංගයකි. ඔබගේ සම්පූර්ණ කාලය ඔබ සතුව පවතින විශේෂ දක්ෂතා එම ආයතනය හෝ සංවිධානය වෙත පැවරී ඇති අරමුණු, වගකීම් ඉටුකිරීම සඳහාම යෙදවිය යුතු ය. නායකයෙකු හට සිය පෞද්ගලික ජීවිතයේ කටයුතු සහ ඇතැම් විට පවුල් වල උවමනා එපාකම් ආදිය සඳහා වැය කළ හැක්කේ ඉතා සීමිත කාල වේලාවක් පමණි. තමන්ගේ දෛනික වේලාවෙන් වැඩි කොටස පෞද්ගලික සහ පවුලේ අවශ්‍යතාම සඳහා කැප කරන්නෙකු හට සාර්ථක නායකයෙකු වීමට නොහැකිය. දිගු පැය ගණන් වැඩ කිරීමට සිදුවීම, දුෂ්කරම වැඩ කටයුතු සහ විශාලම වගකීම යනු නායකයෙකුගේ උරුමයයි.

**03 ශීලය :-**

මෙයින් අදහස් කරණුයේ පෞද්ගලික ජීවිතයේ විවෘත සහ පිරිසිදු භාවයයි. පෞද්ගලික ජීවිතයේ පිරිසිදු භාවය ඔබ වෙත ප්‍රභූත්වයක් සහ ආකර්ෂණීය පෞරුෂයක් ලබා දෙයි. ඔබ නායකයෙකු නම් ඔබ යටතෙහි සිටින්නන් හට ආදර්ශයක් වන පරිදි ඔබගේ ජීවිතය හැඩගසා ගත යුතු ය. එයින් ඔබ ද පිරිස් අතර ප්‍රිය මනාප පෞද්ගලිකත්වයක් හිමිකර දෙයි. ඔබට, ඔබේ අනුගාමිකයන්ට ද, යහපත හෝ විපත් ගෙන දීමේ බලවේගයක් බවට පත් විය හැකිය. ඔවුන්ට බණ කීම නිෂ්ඵල ප්‍රයත්නයකි. ඔවුන් ගෙන් දැකීමට බලාපොරොත්තු වන්නේ කුමන ආකාරයක පැවැත්මක් ද, ඔබ ඒ ආකාරයෙන් පැවතිය යුතු ය. විශාල කමක් ඇති මාගේ බාහිර පෙනුම ගැන සැලකිල්ලක් නැති දුෂ්ඨ නායකයෙකු හට ලැබෙනුයේ එවැනිම විශාල කටක් ඇති දුෂ්ඨ කැත මිනිසුන් පිරිසකි, මෙහි දී මා ඔබට අවධාරණය කළ යුතු එක් කරුණක් ඇත. එනම් ඔබ විසින් නායකත්වය දෙනු ලබන පිරිස ඔබගේ පැවැත්මේ නියම පිළිබිඹුවකි. ඔබට සිටින්නේ දූෂිත නපුරු මිනිසුන් කණ්ඩායමක් නම් එයට හේතුව වන්නේ ඔබේ දූෂිත නපුරු කමය.

**04. තපස:-**

තපස යන්නෙන් අදහස් කරනුයේ චාම් සහ සරල ජීවන රටාවකි. ලැබෙන දෙයින් සතුටු තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමයි. බොහෝ නායකයින් සිය අනුගාමිකයින්ගේ ගෞරවය අපේක්ෂා කරන්නේ විශාල සැප සම්පත් සංඛ්‍යාවක් තමා සතුව තිබෙන බව පෙන්වීමට උත්සාහ දැරීමෙනි. විශාල අලංකාර නිවසක් සහ සුඛෝපභෝගී වාහනයක් ආදිය මගින් තමන් හට ශෝභාවක් ලැබේ යැයි බොහෝ අනුචරයින් විශ්වාස කරති. එම විශ්වාසය නිසා ධාර්මික ක්‍රම වලින් ඒවා සපයා ගැනීමට නොහැකි නම් පොදු දේපල සොරකම් කිරීම පොදු දේපල පෞද්ගලික පරිහරණයට යොද ගැනීම සහ සිය නිළ බලය යොද වංචනික ලෙස මුදල් රැස් කිරීමට ඔවුන් පෙළඹේ. එසේ සපයා ගත් මුදලින් ඉදිකල සුවිසල් නිවාස සහ සුඛෝපභෝගී වාහන ආදිය නිසා නායකයෙකු හට අත්වනුයේ අපකීර්තියක් පමණි. එබැවින් සෑම නායකයෙකුම තමන්ට දරාගත හැකි තරමට විය පැහැදම් කිරීමට හුරුවිය යුතු ය. ඔබගේ පෞද්ගලික සුඛ විහරනය සඳහා රජයට හෝ ඔබ අයත් ආයතනයට වියදම් දැරීමට නොහැකිය. එබැවින් සෙස්සන්ට බරක් නොවන චාම් සරල ජීවිතයකට ඔබ හුරු විය යුතු ය. එම පැවතුම් ඔබට සැබෑ ප්‍රභාවක් ගෙනදෙනු ඇත. එම ප්‍රභාව ඉහත සඳහන් කළ අයතා මාර්ග වලින් රැස්කළ ධනයෙන් කිසි දිනක ලබා ගැනීමට නොහැක.

**05. ඍජුභාවය:-**

ඍජුභාවය යනු සැමවිටම සත්‍ය ගරුක වීමයි. හැම විටම යම් නීතියකට සහ සම්මතයකට අනුව වැඩ කිරීමයි. සියල්ලන් හට එකසේ සාධාරණත්වය ඉටු කිරීමයි. ඍජුභාවය යනු අණුවන අහංකාර කම නොවෙයි. බොහෝ විට නායකයෙකු හට සත්‍යයට විරුද්ධව වැඩ කරන ලෙස බලපෑම් ඇතිවේ. එහෙත් ඍජුභාවය තහවුරු වූ තැනැත්තා එවැනි බලපෑම් වලට යටවන්නේ නැහැ. කිසිවිටක පෞද්ගලික වාසිය සඳහා නිවැරදි ප්‍රතිපත්ති පාවාදෙන්නේත් නැහැ. කොතෙක් දුෂ්කරතා විඳීමට සිදුවුවත් සිය සත්‍ය ගරුක භාවය කෙලෙසා ගන්නෙත් නැහැ. ඍජුභාවයේ එක් ජයග්‍රාහී ගුණයක්

අඩංගු වෙනවා එනම්, කොතරම් දුෂ්කරතා ඇති වුවත් අවසානයේ දී සත්‍ය ජයගැනීමයි.

**06. අවිහිංසාව:-**

අවිහිංසාව යනු අනුන්ට හිංසා නොකිරීමයි. ඇතැම් නායකයින් සිය ආධිපත්‍ය අන් අය වෙත පතුරුවන්නේ හිංසාවෙන්. ඔබ සැබෑ නායකයෙකු නම් ඔබේ නායකත්වය භීෂණය මගින් අන් අය වෙත පැතිරවීම අවශ්‍ය වන්නේ නෑ. ඔබට නායකත්වය ලැබී ඇත්තේ එම බලතල පාවිච්චි කර අන් අයට හිරිහැර කිරීමට නොවෙයි. නායකයෙකු වශයෙන් ඔබට ඔබ යටතේ සිටින්නන් හට විරුද්ධව යම් තීරණ ගැනීමට සිදු විය හැක. එහෙත් එවැනි තීරණ සත්‍ය සහ සාධාරණත්වය මත පමණක්ම පදනම් විය යුතු ය. ඔබ අප්‍රිය කරන අයවලුන් හටත්, ඔබට එකඟ නොවන අයවලුන් හටත්, හිංසා කිරීමෙන් වැළකී සිටීමට ඔබ හට උදර පෞරුෂයක් තිබිය යුතුය. අවිහිංසාව දුර්වල කමක් නොව ඔබේ චරිත ශක්තියෙහි සහ පෞරුෂයෙහි ප්‍රබලතාවයයි.

**07. මෘදු භාවය:-**

මෘදුභාවය යනු නිහතමානී සැහැල්ලු ගතිපැවතුම් ඇති කර ගැනීමයි. ඇතැම් අය මෘදුභාවය දුර්වලතාවයක් හැටියට සලකනවා. එහෙත් ඍජුභාවයත්, මෘදුභාවයත් එකට ගමන් කරන දේවල් මක් නිසා ද ඍජුව පැවතිය හැක්කේ කරුණාවන්ත මෘදු සිතකට පමණයි. එනම්, ඍජුභාවය වැඩිවීමේ දී සත්‍ය ආරක්ෂා කිරීමේ දී, ඉවසීම සහ දරාගැනීම අවශ්‍ය වනවා. ඉවසීමට සහ දරාගැනීමට හැකිවන්නේ මෘදු සිත් වලට පමණයි. මා අත් දැක තිබෙන එක කරුණක් නම් ඉතා භයානක බැරෑරුම් අවස්ථා වල දී වඩාත්ම ධෛර්ය වන්නට නිර්භීතව ක්‍රියා කරන්නේ සාමාන්‍ය අවස්ථා වල ඉතා මෘදු ගතිපැවතුම් ඇති අයයි. දෛනික ජීවිතයේ දී දැඩි සැඩපරුෂ ගති ඇති අය භයානක අවදානම් සහිත අවස්ථා වල ඉතා බියසුළු ලෙස හැසිරෙනවා.

**08. අක්‍රෝධය:-**

අක්‍රෝධය යනු වෛරයෙන් තරහෙන් ඊර්ෂ්‍යාවෙන් වැලකීමයි. නායකයෙකු වනු ඔබ අනිවාර්යයෙන්ම ඉහත සඳහන් වැරදි වලින් වැලකියයුතු යි. ඊට අමතරව මෛත්‍රිය, කරුණාව, මුදිතාව සහ උපේක්ෂාව වඩවා ගත යුතු යි. මෛත්‍රිය සහ කරුණාව අප පැහැදිලිව දන්නවා. මුදිතාව යනු අන් අයගේ දියුණුව සහ සතුට දැකීමෙන් සතුටට පත්වීමේ හැකියාවයි. උපේක්ෂාව යනුවෙන් ජයග්‍රහණය දැක අධික ප්‍රීතියට පත් වීමෙනුත් පසු බැසීමකදී, කම්පාවට පත්වීමෙනුත්, වැලකී සිටීමයි. මේ සඳහා සන්සුන්, තැන්පත් ඉතා ප්‍රබල සිතක් අවශ්‍යයයි.

**09. ශාන්තිය :-**

ශාන්තිය යනු ඉවසීමයි. විඳදරා ගැනීමේ ශක්තියයි. නායකත්වය දැරීමේ දී ඔබට නිතර බාධා කිරීම්, නින්ද අපහාස, පසුබැසීම් ආදියට මුහුණ දීමට සිදුවෙනවා. මෙවැනි අවස්ථා වල දී, ඔබට සතුරුකම් කල අයට පෙරලා පහර නොදී ඔබට සිදු වූ පාඩුව සහ සිත් තැවුල් නිසොල්මන්ව, සන්සුන්ව ඉවසීම නම් ශාන්තියි. මෙම තත්ත්වය දීර්ඝකාලීනව මෙන්ම ස්ථිරසාරව ඔබ වෙත ජයග්‍රහණය ලබා දෙනවා.

**10. අවිරෝධතාව :-**

මෙය ඉතාමත් දුෂ්කර, එහෙත් ඉතා වටිනා බලවත්, ගුණාංගයක්, පිරිසක් වශයෙන් කටයුතු කරගෙන යන අවස්ථාවල සෑම කරුණක් සම්බන්ධයෙන්ම එකඟතාවයක් ඇති වන්නේ නැහැ. එය ලෝක ස්වභාවයයි. අවිරෝධතාවයෙන් ජීවත් වන්නන් එවැනි ප්‍රශ්ණ ඇතිවන අවස්ථාවන්හි විරුද්ධව කැළඹීම් කරන්නේ නැහැ. බොහෝ විට නිසොල්මනේ වැඩ කරගෙන යනවා. එහෙත් තමන්ගේ නිවරදි ක්‍රියා මාර්ගය අත් හරින්නෙත් නැහැ. භේදයක් හෝ විරුද්ධතාවයක් මතු වූ පලියට තමන් නිවැරදිව අවබෝධ කරගත් සත්‍යය අතහරින්නේ නැහැ. එහෙත් ඒවාට කලහා කරගන්නේත් නැහැ. එසේ කරන විට එවැනි වාද භේද ඉබේම නැති වෙනවා. එවිට ඔබගේ කාර්ය නැවත නිසොල්මනේම කරගෙන යාමට පිළිවන් වෙනවා.

දසරාජ ධර්මය නම් මේවායි! මෙම කරුණු මගින් නව ජීවන ක්‍රමයක් ද, ප්‍රකාශ වෙනවා. මේවා අනුගමනය කිරීමෙන් ඔබට සාර්ථක නායකයෙකු වීමට ද, හැකි වෙනවා.

**මේජර් එස්සී කරුණාරත්න, ශ්‍රීලපාහ**
අණදෙන නිලධාරී 4 ශ්‍රීලපාහ

# යුද බිම පුද බිමක් කර ගත්තෙමි...

බුදු දහම ඇත සිතේ...
එහෙත් නැත සඟුන් අප ලඟ.....
රුදුරු අවි ගත්තත් අතට....
නමදිමි තෙරුවන් සැවොම එකට....

1996 වෙසක් පුන් පොහොය දිනයේ යාපනයේ දී 8 ශ්‍රීලපාහ 'බී' කන්ඩායමේ සියලුම නිළධාරීන්/සෙනීන් එක්ව තෙරුවන් සිහිකල අවස්ථාවයි මේ.... සෑම සෙබලෙක් තුලම ධර්මය කෙරෙහි සිත ඇතත්, ධර්මය දේශනා කිරීමට සංඝයා වහන්සේලා අප ලඟ නැත.... එහෙත් අප දන්නා තරමින් සිහි කලෙමි තෙරුවන් ගුණ මෙලෙස....



මේ.... 8 ශ්‍රීලපාහ 'බී' කණ්ඩායමේ සෙ/304133 සාසෙ චන්ද්‍රසිරි ඩබ්ජ් විසින් සියලුම දෙනා පංචශීලයෙහි පිහිටුවා ධර්මය දේශණා කරන' ආකාරයයි....

ගිණි අවිය දැත හොවා, නිරතුරුව වෙඩි හඬ පමණක් හුරු අපට තෙරුවන් ගුණ සිහි කිරීමෙන්.... අප මොහොතකට හෝ ලැබුවේ අසීමිත සතුටකි.... සිසිලකි....

නිර්මාණය - 8 ශ්‍රීලපාහ 'බී' කණ්ඩායමේ
**සෙ/304133 සාසෙ චන්ද්‍රසිරි ඩබ් ඒ.**

# ආබාධිත රණවිරුවන් හා මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ට ස්වයං නිවාස තනාගැනීම පිණිස රු. 150000/= ක් ලබාදීමේ ව්‍යාපෘතිය

යුද්ධයේ දී තුවාල ලබා ආබාධිත තත්වයට පත් වූ ආබාධිත රණවිරුවන් සඳහා හා මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ට ස්වයං නිවාස තනාගැනීම පිණිස යුහමු අතිසුසාඅම වෙතින් රු. 150000/= ක් ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ නිත්‍ය/ස්වේච්ඡා ශ්‍රීලපාහ ඒකකවලට අදියර 02කින් මුදල් ලබාදෙන ලදී.

ඉහත කී ව්‍යාපෘතිය යටතේ 1 වන අදියර වශයෙන් 3 ශ්‍රීලපාහ ඒකකයේ සිට ආබාධිත තත්ත්වයට පත් වූ සෙ/301009 සාසේ තිස්ස ඒකේපී රණවිරුවා වෙනුවෙන් 'සමන්' ලී වෙළඳසැල, බොරළුකැටිය, කරතොට, හක්මන යන ලිපිනයේ සම්පූර්ණයෙන් තනා නිම කරන ලද නිවස 1996 ක් වූ මැයි මස 22 දින 0856 පැයට යෙදුණු ශුභ මොහොතින් රෙජිමේන්තු ආධාරක බළඇණිය, ශ්‍රීලපාහි නිලධාරී අණදෙන කපිතන් අයිජීආර්ජී බෝගොඩවත්ත, ශ්‍රීලපාහ අතින් විවෘත කර එම රණවිරුවා හට භාර දෙන ලදී. එම උත්සවය සඳහා පහත සඳහන් නිලධාරීන් හා ආරාධිත අමුත්තන් සහභාගී වන ලදි.

i. රෙම ශ්‍රීලපාහ සුභසාධක නිලධාරී කපිතන් (උපා) අයිකේයූ දයානන්ද, ශ්‍රීලපාහ
ii. කඹුරුපිටිය සහකාර ප්‍රාදේශීය ලේකම් ගුණපාල විජේසිංහ මහතා.
iii. හෙට්ටියාවෙල ග්‍රාම නිළධාරී ලයනල් එදිරිවීර ගමගේ මහතා.
iv. හෙට්ටියාවෙල මහ විදුහලේ ආචාර්ය එස්ජී සේනාධීර මහතා.
v. මාතර මහ බැංකු ලිපිකරු ඒ ආර් ඉඳුරුවගේ මහතා
vi. කරතොට විදුහලේ ආචාර්ය ඩී ආර් වීරසූරිය මහතා.
vii. හක්මන පොලිස් ස්ථානයේ උප පොලිස් පරීක්ෂක පී ඒ පියසේන මහතා.

තවද, එම අදියර යටතේ 6 ශ්‍රීලපාහ ඒකකයේ රාජකාරියේ යෙදී සිටියදී මියගිය සෙ/11591 සැරයන් ප්‍රේමරත්න ඩබ් ඒ යන රණවිරුවා වෙනුවෙන් ඔහුගේ බිරිඳ හා දරුවන් වෙනුවෙන් නො: 495/8, මොරගහහේන පාර, පිට්පන දකුණ යන ස්ථානයේ සම්පූර්ණයෙන් තනා නිම කරන ලද නිවස 1996 ක්වූ මැයි මස 29 දින 0931 පැයට යෙදුණු ශුභ මොහොතින් ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු ආඥාපති බ්‍රිගේඩියර් එස්එච්එස් කෝට්ටේගොඩ, ආර්ඩබ්පී, ආර්එස්පී මැතිතුමා අතින් විවෘත කර එම රණවිරුවාගේ බිරිඳ හා දරුවන් හට භාර දෙන ලදී. එම උත්සවය සඳහා පහත සඳහන් නිලධාරීන් හා ආරාධිත අමුත්තන් සහභාගී වන ලදී.

i. රෙජිමේන්තු සේනාවිධායක ලුතිනන් කර්නල් ඩබ්එම්ආර් විජේසුන්දර, ආර්එස්පී, ශ්‍රීලපාහ
ii. රෙජිමේන්තු මාණ්ඩලික නිලධාරීන් මේජර් ඩබ්ඩබ්එස්එල් ප්‍රනාන්දු, ආර්එස්පී, ශ්‍රීලපාහ
iii. රෙජි: ආබ ශ්‍රීලපාහ නිලධාරී අණදෙන කපිතන් අයිජීආර්ජී බෝගොඩවත්ත, ශ්‍රීලපාහ
iv. 6 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිළධාරී තුමා වෙනුවෙන් කපිතන් සේනක වීරසූරිය, ශ්‍රීලපාහ
v. රෙම ශ්‍රීලපාහ සුභසාධක නිලධාරී කපිතන් (උපා) අයිකේයූ දයානන්ද, ශ්‍රීලපාහ
vi. පළාත් සභා මන්ත්‍රී සහ හෝමාගම මැතිවරණ කොට්ටාශයේ පොදු පෙරමුණේ ප්‍රධාන සංවිධායක ගාමිණී තිලකසිරි මහතා.
vii. පිට්පන ග්‍රාම නිලධාරී මහතා.

එමෙන්ම එම අධියර යටතේ 2(සෙව්)ශ්‍රීලපාහ ඒකයේ රාජකාරියේ යෙදී සිටිය දී මියගිය සෙ/22824 ලාකෝ ඩයස් එම්එස්එස් රණවිරුවා වෙනුවෙන් ඔහුගේ දෙමව්පියන් හට නො: 528/1, නැදුම්ගමුව පාර, වැලිවේරිය යන ස්ථානයේ සම්පූර්ණයෙන් තනා නිම කරන ලද නිවස 1996 ක් වූ මැයි මස 30 දින 0917 පැයට යෙදුණු ශුභ මොහොතින් කර්නල් යුධ සේවා ලේකම් කර්නල් ටීටීආර් ද සිල්වා, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී විසින් විවෘත කර එම රණවිරුවාගේ දෙමව්පියන් හට භාර දෙන ලදී. එම උත්සවය සඳහා පහත සඳහන් නිලධාරීන් හා ආරාධිත අමුත්තන් සහභාගී වන ලදි.

i. රෙජිමේන්තු මාණ්ඩලික නිලධාරී මේජර් ඩබ්ඩබ්එස්එල් ප්‍රනාන්දු, ආර්එස්පී, ශ්‍රීලපාහ
ii. රෙජි:ආබ ශ්‍රීලපාහ නිලධාරී අණදෙන කපිතන් අයිජීආර්ජී බෝගොඩවත්ත, ශ්‍රීලපාහ
iii. රෙම ශ්‍රීලපාහ සුභසාධක නිලධාරී කපිතන් (උපා) අයිකේයූ දයානන්ද, ශ්‍රීලපාහ
iv. 2 (සෙව්) ශ්‍රීලපාහ ඒකකය වෙනුවෙන් කපිතන් ජයසේන, ශ්‍රීලපාහ
v. ගනේමුල්ල පොලිස් ස්ථානයේ පොලිස් පරීක්ෂක දයානන්ද සමරවීර මහතා සහ මැතිණිය.
vi. ගම්පහ පාර්ලිමේන්තු මන්ත්‍රී හා කර්මාන්ත සංවර්ධන අධීක්ෂණ මන්ත්‍රී ලයනල් ගුණවර්ධන මහතා.
vii. ගම්පහ පළාත් සභා මන්ත්‍රී සුනිල් විජේරත්න මහතා.
viii. ඌරුවෙල සභාවේ පන්සලේ සීවලී ස්වාමීන් වහන්සේ ඇතුළු ස්වාමීන් වහන්සේලා කිහිපදෙනෙක්.

එසේම ඉහත කී ව්‍යාපෘති යටතේ II වන අදියර වශයෙන් 6 ශ්‍රීලපාහ ඒකකයේ සිට ආබාධිත තත්ත්වයට පත් වූ සෙ/300205 සාසෙ ගුණරත්න අයිපීඑල්පී රණවිරුවා වෙනුවෙන් දුම්රියපල ඉදිරිපිට නිවස, බලන, කඩුගන්නාව යන ලිපිනයේ සම්පූර්ණයෙන් තනා නිම කරන ලද නිවස 1996 ක් වූ මැයි මස 20 දින 1057 පැයට යෙදුණු ශුභ මොහොතින් 3 වන බළඇණිය, ශ්‍රී ලංකා පාබල හමුදවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එල්බී තල්ගහගොඩ, ආර්ඩබ්පී, ශ්‍රීලපාහ විසින් විවෘත කර එම රණවිරුවා හට භාර දෙන ලදී. එම උත්සවය සඳහා පහත සඳහන් නිලධාරීන් ආරාධිත අමුත්තන් ලෙස සහභාගී වන ලදී.

i. රෙජි:ආබ ශ්‍රීලපාහ නිලධාරී අණදෙන කපිතන් අයිජීආර්ජී බෝගොඩවත්ත, ශ්‍රීලපාහ
ii. රෙම ශ්‍රීලපාහ සුභසාධක නිලධාරි කපිතන් (උපා) අයිකේයූ දයානන්ද, ශ්‍රීලපාහ
iii. බලන ග්‍රාම නිලධාරී සුනිල් තිලකරත්න මහතා.
iv. මහනුවර දුම්රිය ස්ථානයේ සේවය කරන ගාමිණී පියතිස්ස මහතා.
v. හැරම්ටිගල ශ්‍රී ධීරානන්ද විදුහලේ ආචාර්ය ආනන්ද සමරජීව මහතා.

# ආබාධිත රණවිරුවන්ට හා මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ට ස්වයං නිවාස



මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ රෙජිමේන්තු ආධාරක බළඇණිය, ශ්‍රීලපාහි නිලධාරී අණදෙන කපිතාන් අයිපීආර්පී බෝගොඩවත්ත, ශ්‍රීලපාහ විසින් 3 ශ්‍රීලපාහ ඒකකයේ සිට ආබාධිත තත්ත්වයට පත්වූ සෙ/301009 සාසෙ තිස්ස ඒකේපී යන රණවිරුවාගේ නව නිවස 96.05.22 දින 0856 පැයට යෙදුණු සුභ මොහොතින් පිත්ත පටිය කපා විවෘත කරන අයුරුයි.



මෙම ඡායාරූයෙන් දැක්වෙනුයේ නව නිවස විවෘත කිරීමෙන් අනතුරුව චිරානුගත සම්ප්‍රදායට අනුව රෙජිමේන්තු ආධාරක බළඇණිය, ශ්‍රීලපාහි නිලධාරී අණදෙන කපිතාන් අයිපීආර්පී. බෝගොඩවත්ත, ශ්‍රීලපාහ විසින් පොල්තෙල් පහන දල්වන අයුරු. රෙම ශ්‍රීලපාහි සුභසාධක නිලධාරී කපිතාන් (උපා) අයිකේයූ දයානන්ද, ශ්‍රීලපාහ පසෙකින් සිටී.



මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ 6 ශ්‍රීලපාහ ඒකකයේ සිට මියගිය සෙ/11561 සැරයන් ප්‍රේමරත්න ඩබ්ජී වෙනුවෙන් ඔහුගේ බිරිඳ හා දරුවන් හට තනා නිම කරන ලද නව නිවස ශ්‍රී ලංකා පාබල හමුදාවේ ආඥාපති බ්‍රිගේඩියර් එස්එච්එස් කෝට්ටේගොඩ, ආර්ඩබ්පී, ආර්එස්පී විසින් 96.05.29 දින 0931 පැයට යෙදුණු සුභ මොහොතින් පිත්ත පටිය කපා විවෘත කරන අයුරුයි.

# ආබාධිත රණවිරුවන්ට හා මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ට ස්වයං නිවාස

මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ නව නිවස විවෘත කිරීමෙන් අනතුරුව චිරානුගත සම්ප්‍රදායට අනුව මියගිය සෙ/11591 සැරයන් ප්‍රේමරත්න ඩබ්ජ් රණවිරුවාගේ බිරිඳ විසින් පොල්තෙල් පහන දල්වන අයුරුයි. ශ්‍රී ලංකා පාබල හමුද ආඥාපති බ්‍රිගේඩියර් එස්එච්එස් කොට්ටේගොඩ, ආර්ඩබ්පී, ආර්එස්පී හා රෙම ශ්‍රීලපාහි සුභසාධක නිලධාරී කපිතාන් (උපා) අයිකේයූ දයානන්ද, ශ්‍රීලපාහ පසෙකින් සිටී.





මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ 2(සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ සිටි මියගිය සෙ/22824 ලාකෝ ඩයස් එම් එස්එස් වෙනුවෙන් ඔහුගේ දෙමව්පියන් හට තනා නිම කරන ලද නව නිවස කර්නල් යුධ සේවා ලේකම් කර්නල් ටීවීආර් ද සිල්වා, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී විසින් 96.05.30 දින 0917 පැයට යෙදුණු ශුභ මොහොතින් පීත්ත පටිය කපා විවෘත කරන අයුරුයි.



මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ නව නිවස විවෘත කිරීමෙන් අනතුරුව මියගිය සෙ/22824 ලාකෝ ඩයස් එම්එස්එස් ගේ පියා හට මෙම උත්සවයේ ප්‍රධාන අමුත්තා වශයෙන් පැමිණි කර්නල් ටීවීආර් ද සිල්වා ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී විසින් තිළිණයක් ප්‍රධාන කරන අයුරුයි.

# ආබාධිත රණවිරුවන්ට හා මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ට ස්වයං නිවාස

මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ 6 ශ්‍රීලපාහ ඒකකයේ සිට ආබාධිත තත්ත්වයට පත් වූ සෙ/300205 සාසෙ ගුණරත්න අයිපීඑල්පී හට දානා නිම කරන ලද නව නිවස 3 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරී ලුතිං කර්නල් එල්බී තල්ගහගොඩ, ආර්ඩබ්පී, ශ්‍රීලපාහ විසින් 96.05.20 දින 1057 පැයට යෙදුණු ශුභ මොහොතින් පීත්ත පටිය කපා විවෘත කරන අයුරැයි.





මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ නව නිවස විවෘත කිරීමෙන් අනතුරුව ආබාධිත තත්ත්වයට පත්වූ සෙ/300205 සාසෙ ගුණරත්න අයිපීඑල්පී ගේ මැණියන් හට මෙම උත්සවයේ ප්‍රධාන අමුත්තා වශයෙන් පැමිණි 3 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිළධාරි ලුතිනන් කර්නල් එල්බී තල්ගහගොඩ, ආර්ඩබ්පී, ශ්‍රීලපාහ විසින් තිළිණයක් ප්‍රධාන කරන අයුරැයි.

# නෑනේ සෙබලෙකුට ප්‍රේමය අහිමි

රෑ කල  දවල් කළ නැති යුධ බිම සටනේ
මගේ තනි නොහනියට අවියයි අත රැඳුනේ
හෙට දිනයෙදිත් මෙහෙයුම දිගටම යන්නේ
මාසෙ දී ලබන ඔබ බැලූමට ගම එන්නේ

සැදුවේ ගෙපැල ගම තනිකර දමන්නද
නැනේ සෙබලෙකුට ප්‍රේමය අහිමිද
රෑ තුන්යමේ මේ දුක්ගිනි දරන්නද
සිහිනෙන්වත් ඇවිත් මා හමු වෙනව ාද

එගොඩ ගොඩේ මාමාගේ දුව වුවාට
ගම ඉන්දැද්දී ප්‍රේමෙන් අපි බැඳුනාට
අප්පච්චිත් කැමති නෑ දැන්නම් ඊට
නාඩන් මස්සිනේ සෙබලෙක් වුවාට

නැනා නැතත් කුමරියකගේ අත ගන්නයි
කුල කුමරියක් සැදු ගෙපලට වඩින්නයි
යුද්ධය නිමාවන දින සිහි කරන්නයි
සියලුම දෙවිවරුන් ඔබේ පණ රකින්නයි

**සෙ/00029 සැරයන් හේරත් එච්එම්එස්**
9 වන ශ්‍රී ලංකා පාබල හමුදාව, මූලස්ථානය
යුධ හමුද කඳවුර පොන්නාලෙයි, යාපනය.

# සමුගත් ඔබට

මගේ ජීවිතයේ ලස්සන දවස් ගෙවිල ගියා මටත් හොරාම. ආදරය, සෙනෙහස ගව් ගානක් දුරක ඉඳන් මට හිනා වුනා. කල්ප කාලයක් එක මග ආවා ඔබත් දැන් දුර ඈතක. පාට පාට හීනයක් වගේ මුළු අතීතයම කඳුලට සුසුමට දුක හහවන්න බැහැ වගේ ඔබට, පෙර දිනේ පිදූ පෙම සිතේ කොනක සද ලැඟුම් ගෙන මා රිදවූ වාර අනන්තයි. මා හදට දහසක් පැතුමන් ඇතිකර නොසිතු ලෙස ඔබ මගෙන් සමු ගත්තා. මගේ ජීවිතයට හසරැල්ල මෙන්ම කඳුලැල්ලටද එකසේ නොසැලී සිටි ඔබ මෙසේ සමු ගැන්ම මගේ දිවිය ඇති තුරාවට ඔබේ රුව මසිතින් දුරස් නොවනු ඇත, අහිමි කුමරියේ.

**සෙ/90966 සාසෙ දහනායක ජේජී**
'බී' කණ්ඩායම 7 ශ්‍රීලපාහ

# ආබාධිත රණවිරුවන් හා මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ට ස්වයං නිවාස තනාගැනීම පිණිස රු. 150000/= ක් ලබාදීමේ ව්‍යාපෘතිය

ඉහත සඳහන් ව්‍යාපෘතිය යටතේ නිත්‍ය / ස්වේච්ඡා ශ්‍රීලපාහ ඒකකවලට අයත් මියගිය / ආබාධිත රණවිරුවන් 07 දෙනෙකු සඳහා ස්වයං නිවාස තනාගැනීම පිණිස රු. 150000/= ක් බැගින් යුහමු අතිදුසාඅම වෙතින් ලබාදෙන ලදී.

ඉහත කී නිවාස ව්‍යාපෘතිය යටතේ 1 වන අදියරෙහි අවසන් නිවස වන පහත ලිපිනයේ සඳහන් 2(සේවි) ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/21144 ලාකෝ සුනිල් ඩබ් ඒ (මියගිය) ගේ පියා හා දරුවන් දෙදෙනා වෙනුවෙන් ඉදි වූ නිවස 1996 ක් වූ ජූනි මස 24 දින 1104 පැයට යෙදුණු ශුභ මොහොතින් ශ්‍රී ලංකා ජනරජයේ කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු සී. වී ගුණරත්න මැතිතුමා අතින් විවෘත කර එකී රණවිරුවාගේ පියා හා දරුවන් දෙදෙනාහට භාර දෙන ලදී. එකී උත්සවය සඳහා පහත සඳහන් නිලධාරීන් සහ ආරාධිත අමුත්තන් සහභාගී වන ලදී.

සෙ/21144 ලාකෝ සුනිල් ඩබ්ඒ (මියගිය) 2 (සේවි) ශ්‍රීලපාහ ඩබ්. ඒ පියදස (පියා), අංක 02,4 වන අදියර, බඩඹිවිට, අත්තිඩිය, දෙහිවල.



මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු සී.වී ගුණරත්න මැතිතුමා විසින් 1996 ක් වූ ජූනි මස 24 දින 1104 පැයට යෙදුණු ශුභ මොහොතින් පීත්ත පටිය කපා නව නිවස විවෘත කරන අයුරුයි

i. දෙහිවල ගල්කිස්ස හිටපු නියෝජ්‍ය නගරාධිපති නාගරික මංත්‍රී සිරිසේන දසනායක
ii. රෙම ශ්‍රීලපාහ මානි II මේජර් කේජේ ජයවීර, ශ්‍රීලපාහ
iii. 2(සේවි) ශ්‍රීලපාහ ඒකකය වෙනුවෙන් මේජර් එස්ඩබ්එන්ටීබී හුළුගල්ල, ශ්‍රීලපාහ.
iv. රෙජි: ආබ ශ්‍රීලපාහි නිලධාරී අණදෙන කපිතන් අයිජීආර්ජී බෝගොඩවත්ත, ශ්‍රීලපාහ
v. රෙජි: ආබ ශ්‍රීලපාහි උපකරණ පාලන නිලධාරී කපිතන් (උපා) ඩී එච් බ්ලොක්, ශ්‍රීලපාහ
vi. රෙම ශ්‍රීලපාහ සුභසාධක නිළධාරි කපිතන් (උපා) අයිකේයූ දයානන්ද, ශ්‍රීලපාහ
vii. දෙහිවල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක තෙන්නකෝන් මහතා.

# "ආදරයේ ජීව උල්පත අම්මා"

හිරුගේ එළියෙනුත් මවගේ කිරි වලිනුත් මුළු මහත් විශ්වය රැඳී පවතිනු ඇතැයි ඔබ දකිනවා සේම මාද දකින බව සාඩම්බරව පවසන්නෙමි.

කෙනෙකු ලොව පුරා විහිදී ඇති සුන්දරම වචනය, සිංහල හෝඩි පොතෙහි අකුරු අතුරෙන් පෙළ ගස්වන්නයි කියා මා හට ඇරයුම් කලේ නම් මාගේ සුරතෙහි රැඳී පත්හිදෙන් මෙසේ ලියැවෙනු නියතය.

අම්මා.... අම්මා.... අම්මා...

ඒ වදනෙහි අරුත ගැන්වෙන්නේ බිළිඳකු මෙලොවට බිහිකල කාන්තාව පමණක් යැයි කිසිවෙකුවත් පැවසිය නොහැක. සකල විශ්වයෙහිම පරම, පිවිතුරු, සුන්දරත්වය, දයාව 'අම්මා' යන වදනින් උපත ලබයි.

ආදරයේ ජීව උල්පත වන්නේ ද අම්මාය....

මේ මුළුමහත් විශ්මිත නිර්මාණයෙහි අභ්‍යන්තරය ගැන බිඳක් සිතන කල අම්මා කෙනෙකු හට හිමි වනුයේ කුමන තැනක් ද යන්න පැනයක් හට නොගනී ද?

ඉතින් අම්මා කෙනෙකු හට ලොවින් උරුම විය යුතු ආදරය, දයාව, කරුණාව හිමිවිය යුතු යැයි පැවසීම වරදක් නොවනු ඇත. ඇය නොවන්නට ලොවක් ඇත්දැයි සිතීම ද අපහසු කාර්යයකි.

ඉර, හඳ, තරු, ගහකොළ, මල්, නිල්, විල්, ජලාශයන්ගෙන් සැදුම්ලත් විශ්මිත ලෝකයෙහි අම්මා නොමැතිව දැනෙන අඩුපාඩුව කොතරම් ද යන්න සිතීම ඔබ හට බාරය.

අම්මේ ඔබ මතු බුදු වන්නයි.

මා පැතුමන් පැතුවේ.

සැකසුම :-සෙ/306304
**සාසෙ ද සිල්වා ආර්ඒපී**
3 ශ්‍රී ලංකා පාබල හමුදව
පාලන කණ්ඩායම
යුධ හමුදා කඳවුර පනාගොඩ හෝමාගම

# රණවිරු පවුල් වෙනුවෙන් මොහොතක්



රණවිරු පවුල් ඥාතීන් කැළණිය රජමහා විහාරයේ දී අටසිල් සමාදම් වීම

සියොතුන්ගේ මිහිරි ගී නාදය තුරු මුදුන් සිසාරා පැතිරෙන්නට විය. කොවුලන්ගේ නාදය ඒ සමගම තවත් අපූර්ව පණිවුඩයක් කියාපාන්නට විය. ඒ 1995 වර්ෂයේ බක් මාසය සමග වසන්තය ඇරඹි බවයි. එය 2 (සෙවි) ශ්‍රී ලංකා පාබල හමුදාවට තවත් සුවිශේෂ වූ මාසයක්ම විය. ඒ අප බක් මාසයේ දී අපගේ 114 වන ඒකක සංවත්සරය සැමරීයි.

වසර 114 ක නොසැලෙන අතීතය කියා පාමින් පැවැත්වූ අපගේ උත්සවය අවසන් වූයේ ජාතික මෙහෙවරට කැපවූ ඒ මතින්ම තම ජීවිත පවා ලක්මවට පූජා කල උදාර රණවිරුවන් ද සිහිපත් කරවමිනි. අපගේ උපහාරය එම රණවිරුවන්ට පමණක් නොව ඔවුන්ගේ පවුල්වලට ද වන බව පෙන්වීම අපගේ අභිලාශය විය. එම අභිලාශය ද ඇතිව අපි උදාර මෙහෙවරක යෙදුනෙමු. එම උදාර මෙහෙවර නම් 2(සෙවි) ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ජීකේ වික්‍රමසිංහ, ශ්‍රීලපාහ මැතිතුමාගේ මග පෙන්වීම යටතේ රණවිරු පවුල් සාමාජිකයින් 275 ක ගෙන් යුත් වන්දනා චාරිකාවක් ඇරඹීමයි. එහිදී අපගේ පරමාර්ථය වූයේ තම දරුවා, තම පියා, තම ස්වාමියා, තම සහෝදරයා 'තමාගෙන් වියෝවූයේය' යන හැඟීමත්, වේදනාවත් මදකට හෝ තුරන්කරලීමය. එම රණවිරු පවුල් ද තමන්ගේ දුක් සුසුම් සෝ සංකා මදකට අමතක කරමින් කඳසුරිඳු පුරවරයේ කිරි වෙහෙර අසල දණින් වැටුණේ තමාගේ ඥාතියාට 'මතු අත් භවයක දී' හෝ මෙවන් අකල් මරණයක් නොවේවායි ප්‍රාර්ථනා කරමිනි. තම ඥාතීන්ට පින්පෙත්දී අනුමෝදම් කළ ඔවුහු කඳ සුරිඳුන් අභියස දී කාවාඩි පෙරහරක් ද පවත්වා අනතුරුව තම ඥාතියාගෙන් ලැබුණු ආරක්ෂාව රැකවරණය මතුවට දෙවියන්ගෙන් ලැබෙන ලෙස ආයාචනා කළා ය.

1995 වර්ෂයේ පවත්වන ලද බළඇණි උත්සව මාලාවේ දෙවන අදියර ද අධ්‍යාත්මික ගුණවගාවට ඉවහල්වන කටයුත්තක් බවට පත්කරලීමු. ඒ අනුව වසර 2500 ට පෙර සිරිලක සාමය උදෙසාම අප බුදුරජාණන් වහන්සේ මෙහි වැඩම කළ කැළණි පුරවරයම



රණවිරු පවුල් සාමාජික සාමාජිකාවන් හිටාචි දුම්රියෙන් බදුල්ල බලා ගමන් ගනිද්දී



මුතියංගන රජමහා විහාරස්ථානයේ දී අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ජිකේ වික්‍රම සිංහ ශ්‍රීලපාහ සහ එම මැතිණිය විසින් රණවිරු පවුල් සාමාජිකයින් සඳහා ත්‍යාග පිරිනැමීම

ගේ මූලිකත්වයෙන් විධායක අධිකාරි කපිතන් ටීඑච් කරුණාදාස ශ්‍රීලපාහ, කපිතන් ආර්එම් රණසිංහ, ශ්‍රීලපාහ, කපිතන් ටීජීජේබී කරුණානායක, ශ්‍රීලපාහ කපිතන් යූකේකේ රත්නමලල ශ්‍රීලපාහ කපිතන් එච්ඒපී පෙරේරා, ශ්‍රීලපාහ සහ ඒකකයේ රෙජිමේන්තු සැරයන් මේජර් බනි I ඩබ් ජිනපාල, බනිII පෙරේරා එම්එස්, බනි II ධර්මදාස කේඩී, සමගින් සෙසු නිළ පිරිසක් ද කැටුව 1996 අප්‍රේල් මස 09 දින කොළඹ කොටුව දුම්රිය ස්ථානයෙන් අප ගමන අරඹනු ලැබිණි. මෙම රණවිරු පවුල් පිරිස අතර, කුඩා දූ දරුවන් පිරිසක් ද විය.

රණබිමේ මරුනේ සිංහළයකු නම්
පපුවේ වෙඩි සලකුණු ඇත්තේ
සතුරට ලය දී මිස මැරුනේ නැහැ
ලේ පැල්ලම් නැහැ පිට පැත්තේ

පුංචි දරුවන් ඔවුන් සිහිති හඩින් මෙම ගීතය ගයද්දී හමුද පිරිස් වූ අපට

ඒ සඳහා අප ඉලක්ක කර ගත්තෙමු. එදා ඒ බිමේදී බුදුන්වහන්සේ නාග ගෝත්‍රිකයින් හා යක්ෂ ගෝත්‍රිකයින් අතර තිබූ යුද්ධය සමථයකට පත්කළහ. එම කරුණ ද සිහිපත් කළ අප මෙද පොසොන් පුර පොහොද එක් රැස්වී මියගිය රණවිරුවන්ගේ දෙමාපියන්, දූ දරුවන් වැනි රණවිරුවන්ගේ ඥාතීන් 75 දෙනෙක් අටසිල් සමාදම් කරවා බණ භාවනාවන්හි යෙදවූහ. එමගින් එම පවුලෙන් වෙන්වූ රණවිරුවාණන්ට පින් පමුණුවන ලදී. මෙහි දී අප ඒකකයේ සියළුම නිළධාරීන් ඇතුළු සියළුම සෙසු නිලයින් ද එක්වී උපාසක උපාසිකාවන්ට ඇප උපස්ථාන කලහ. දනය පිළියෙළ කර පිළිගැන්විය. මියගිය අය වෙනුවෙන් අප ද පින් පමුණුව මෙම කුරිරු යුද්ධය ඉක්මණින් නිම වේවායි සැම දෙනාම එකම සිතින් ප්‍රාර්ථනා කළේ ය.

හේමන්ත කාලය එළඹීමත් සමග නව වර්ෂය ද උදා වූයේ ය. එය 1996 වර්ෂය උදාවනවාත් සමගම දහසක් බලාපොරොත්තු කරපින්නා ගත් අපත් සමග අප ඒකකය ද 115 වන වර්ෂයට පා තැබීය. මෙවර ද අපි අපගේ බළ ඇණි දිනය සැමරීමේ දී මියගිය රණවිරු පවුල් ද අමතක නොකළෙමු. අප මෙවර ද වන්දනා චාරිකාවක් සඳහා අප ඒකකයේ විධායක අධිකාරී කපිතාන් ටීඑච් කරුණාදාස, ශ්‍රීලපාහ සහ පසුමූල නිලධාරී අණදෙන කපිතාන් ආර්එම් රණසිංහ, ශ්‍රීලපාහ විසින් සංවිධානය කෙරිණ. එය වන්දනා චාරිකාවක් පමණක් නොව විනෝද චාරිකාවක් බවට ද පත් කිරීමට කටයුතු සැලසුවෙමු. ඒ අනුව මෙවර වන්දනා චාරිකාව සඳහා බදුල්ල මුතියංගන රජමහා විහාරය තෝරාගනු ලැබීය. මේ සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මගින් කාරුණික අනුග්‍රාහය ද අපට ලැබිණි. අප වන්දනා චාරිකාව සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මගින් වායු සමනය කරන ලද හිටාචි (Hitachi) දුම්රිය ලබා දෙන ලදී.

රණවිරු පවුල් 80 ක සාමාජිකයින් 207 පිරිසක් වූහ. ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ජිකේ වික්‍රමසිංහ, ශ්‍රීලපාහ



දුන්හිඳ ඇල්ල අසල රණවිරු පවුල් සාමාජිකයින් පිරිසක්



බදුල්ල මුතියංගන රජමහා විහාරස්ථානයේ දී රණවිරු පවුල් සාමාජික පිරිසක්

ඇති වූයේ අමුතු ම ධෛර්යකි. එඩිතර භාවයකි. ඒ සමගම ඔවුන්ගේ පුංචි සිත් සතන් තුලට යුද්ධය කොතෙක් දුරට බලබා ඇත්ද යන්න අපට වැටහිණි. පුංචි සිත්වල මුල් බැස ඇත්තේ තම රට ජාතිය උදෙසා සේවය කිරීමට වඩා තම ඥාතියා තමාගෙන් කුරිරු ලෙස උදුරාගත් අයගෙන් මව්බිම බේරාගැනීම බව මනාව පිළිබිඹු විය. ඔවුන්ගේ ඥාතීන්ගේ එකම අභිලාශය වූයේ තමාගේ රට ජාතිය ආගම බේරා ගැනීම බව ද එය හැම පුද්ගලයෙකු සතු යුතුකම බව ද අප ඔවුන්ට වටහා දුනි. අපගේ අනාගත පරපුර දැවෙන මේ පිළිගැනීමේ ගින්නෙන් ඔවුන් මුදවා පළිගැනීමේ චේතනාවෙන් ඔවුන්ගේ සිත්වලින් මුලිනුපුටා අප ද ඔවුන්ගේ දයාබර සහෝදරයින් පියාණන් සේ ඔවුන්ට ආදරය කරුණාව දක්වන බව වටහා දුනිමු.

තරුණ හිරු මඩල දැඩිවත්ම අපි නුවර නගරයට සේන්දු උනෙමු. ඉන් පසුව ශ්‍රී ලංකාද්වීපයේ මුදුන් මල්කඩක් වූ ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ වැඳ පුදා ගත්තෙමු. නුවර වැවේ ජලය මුසු මඳනල විඳ ගනිමින් දිවා ආහාරය ගතිමු. ඉන් අනතුරුව නැවත බදුල්ල බලා යන අදහසින් ගමන් ඇරඹුවෙමු.

බදුලු නගරය පුරා තුනී මිහිදුම් පටලයක් විහිදී තිබිණි. එහි චමත්කාර ජනක බව අප සිතට දැනෙන්නට වූ නමුදු නගරවාසීන්ට නම් ඔවුන්ගේ කටයුතු අතපසු කිරීමට තරම් විශේෂත්වයක් නොමැති බව එහි කලබලකාරීත්වය සාධක සැපයිය. නගරය වටා ඇති කඳු වළලු තුනී මිහිදුම් සළු පොරවාගෙන තිබුණි. එය ඉතා දැකුම් කළු මනස්කාන්ත දර්ශනයක් විය. බදුලු පුරවරය වඩා ප්‍රකටව ඇත්තේ මේ සිසිල් දේශගුණිකතාවය මතම නොවේ. එහි ජනප්‍රියත්වයට ඓතිහාසික රජමහා විහාරය ද දායක වේ. ඒ මුතියංගන රජමහා විහාරයයි. අප එම රජමහා විහාරය වන්දනා මාන කලෙමු. එදින රාත්‍රියේ අපගේ නවාතැන්පල වූයේ ද එම ස්ථානයයි.

සුන්දර පරිසරයක කන්කළු නාදයන් සමග අපි උදයේ අවදිවිමු. සිත්කළු දර්ශණයන්ගෙන් අපගේ නෙත් සිත් වශීකෘතව පැවතින. එහෙත් අපට අකමැත්තෙන් වුව ද එම දර්ශණීය පරිසරයෙන් මිදීමට සිදුවිය. ඒ එම උදෑසන අප පින්බර කටයුත්තකට වෙන්කර තිබිමයි. එම පැහැබර උදයේ බුදුරජාණන් වහන්සේ උදෙසා ගිලන් පස හා බුද්ධ පූජාවක් පවත්වන ලදී. ඉන් ලැබෙන පුන්‍ය බලය අප ඒකකයේ තම රට, ජාතිය, ආගම උදෙසා අභීතව සේවය කොට ජීවිත පවා පුදකල සියළුම රණවිරුවන්ට පමුණුවන ලදී. මතු සසරේ දී හෝ මෙවන් අකල් මරණයක් ඔවුන්ට අත් නොවේවා එම රණවිරු පවුල් සමග අප ද ප්‍රාර්ථනා කළෙමු. ඉන් පසු ශ්‍රී විෂ්ණු දිව්‍ය රාජයාට එම දෙවිලේදී දේව පූජාවක් පවත්වන ලදී. අප ඒකකයේ ඈනට සේවයේ නියුතු සියළුම දෙනාටත් රණවිරු සියල්ලන්ටත් සියළුම ආරක්ෂක අංශ වලටත් ශ්‍රී ලාංකික සියළු දෙනාටත් ශ්‍රී විෂ්ණු දෙවියන්'ගේ ආශිර්වාදයත්, ආරක්ෂාවත් ඉල්ලා සිටියෙමු. ඉන් අනතුරුව රණවිරු පවුල් වෙනුවෙන් වටිනා ත්‍යාග දහයක් කුසපත් ඇදීමෙන් ඔවුන්ට බෙද දුණිමි.

බදුරු පුරවරයට සොබාදම් දියණියගෙන් ඉතා අපූරු දායාදයක් හිමිව ඇත. එම අපූරු දායාදය නැරඹීම අපගේ චාරිකාවේ ඊළඟ ඉලක්කය විය. මෙදින දිවා කාලයේ මියගිය රණවිරු පවුල් සාමාජිකයින් සමග දුන්හිඳ දිය ඇල්ල නැරඹීමට ගියෙමු. ලෝකයේ දිය ඇලි අතරින් හත්වන ස්ථානය දුන්හිඳ දිය ඇල්ලට හිමි වුව ද එය ශ්‍රී ලංකාවේ දියඇලි අතරින් දෙවන ස්ථානය හිමිකරගෙන ඇත. එය මුහුදු මට්ටමින් අඩි 2100 ක් පමණ උසින් පිහිටා ඇත. දුන්හිඳ දිය කඳ අඩි 560 ක් උසින් ගලා හැලෙද්දී මැවෙන්නේ අපූර්ව චමත්කාරකි. ඒ දිය දහර අප සිත් තුළ මවන්නේ සුදෝ සුදු වළාකුලක සිතුවමකි. ඒ සමගම විසිරෙන ජල බිංදු වාතයට එක්වන්නේ පුංචි පිණිකැට සිහිගන්වමිනි. ජල බිංදු එක්වීමෙන් හමන මඳනල ශරීරයට ලබාදුන්නේ අපමණ සුවයකි. කළුගල් තලාව මත විසිරී හටගෙන නැවත බිඳෙන නැවත හට ගන්නා පෙන බුබුළු දෙස දවසක් වුවත් බලා සිටිය හැකි සේ නෙත් සිත් ඇදගන්නා ලදී. බිමට වැටෙන දිය දහර එතැන් සිට මග දෙපස පිහිටි තුරුලිය සිප ගනිමින් කඩිසරව බැස යනුයේ ගල්තලාවල වැදී දෝංකාරය හඬ නංවමිනි. ජල බිංදු තැන්පත්වීමෙන් නිරන්තරයෙන්ම තෙත් ගතියෙන් යුත් ගස්වල කොළ මඳ සුළඟට ලෙලදීම පවා අපූරු චමත්කාර ජනක බවක් දැක්විය. අප සියල්ලෝම මෙම මනස්කාන්ත දර්ශණයෙන් සමුගත්තේ සිතකින් නොවේ.

මේ දිනවල පවතින ඉඩෝරය නිසා දුන් හිඳ හි දිය දහරාව අඩුබවත්, එම නිසා එහි ලස්සන අඩු වී ඇති බවත්, එයට ප්‍රධාන හේතුව වන විනාශය බවත්, අපට හමුවූ ගම්වැසියෙකු පැවැසුවේ ය. මෙහි දී එය අපට තවත් දෙයක් සිහිපත් කර විය. එනම් අප අපගේ ස්වභාවික ජාතික සම්පත් ආරක්ෂාකර ගත යුතු බවයි.

දිවා ආහාරය ගැනීමෙන් පසු පෙරලා නැවත රජමහා මුතියංගන විහාරයට පැමිණි

අප ඒකක අණදෙන නිළධාරී ලූතිනන් කර්නල් ජීකේ වික්‍රමසිංහ ශ්‍රීලපාහ සහ එම මැතිණිය අතින් රණවිරු පවුල් සාමාජික පිරිසේ කුඩා දරු දැරියන් වෙත ත්‍යාග පිරිනමන ලදී. වැඩිහිටි අය සඳහා ද ත්‍යාග පිරිනැමිණි.

මේ අවස්ථාවේ දී මෙම චාරිකාවේ වැදගත්ම සිදුවීම වන්නේ රණවිරු පවුල් සාමාජිකයින් හා අප ඒකකය ද අතර, ඇති වූ සුහදතාවය වර්ධනය වීමත් සමගම 'ඔබ අප තනිකලේ නැත' යන හැඟීමය. එමගින් ඔවුන්ගේ සුභසාධක ලැබීම් රෙම ශ්‍රීලපාහ සමග අප ඒකකය ද එක්ව ලබාදීමයි. රණවිරු පවුල් වෙනුවෙන් ලැබිය යුතු හිමිකම් ද ඇත. සිවිල් වෛද්‍ය පහසුකම් හා නොමිලේ බෙහෙත් ලබාගැනීම ළමා ශිෂ්‍යත්ව ආධාර ලබාදීම රැකියා අවස්ථා ලබාදීම, ස්වයං නිවාස ඉදිකිරීම සඳහා මුදල් ආධාර ලබාදීම හා දරු දැරියන් රජයේ ජනප්‍රිය පාසල් සඳහා ඇතුළත් කර දීමයි. මෙයට අමතරව දැනටමත් අප ඒකකයේ මියගිය රණවිරු පවුල් තුනක් සඳහා රෙම ශ්‍රීලපාහ වෙතින් නිවාස තුනක් ඉදිකරවා පරිත්‍යාග වශයෙන් ලබා දී ඇත. ඉඩම් නැති රණවිරු පවුල් සඳහා ද පරිත්‍යාග වශයෙන් ඉඩම් ලබාදීමට කටයුතු කරයි. මෙම චාරිකාවේ දී මේ සඳහා ඔවුන් දැනුවත් කිරීම ද අවශ්‍ය ආකෘති පත් පිළියෙළ කරදීම ද සිදු වූ අතර, මීට අමතරව වෙනත් අපහසුතාවයන් පිළිබඳව ද විවෘතව කතා කිරීමට අවස්ථාව ලැබිණි. මෙම චාරිකාව සාර්ථක කර ගැනීම සඳහා අනභිත දූත් පිරිසක් ද වේ. මෙම ඒකකයේ නිලධාරීන් සහ සෙසු නිලයින්ගෙන් ද සහාය හා කැපවීම නොඅඩුව ලැබිණ. දිවයිනේ නොයෙකුත් ප්‍රදේශ වල දානපතියන්ගේ සහයෝගය ද අපට මේ සඳහා ලැබුණු බව දන්වන්නේ ඉතා හද පිරි සතුටිණි.

1996 අප්‍රේල් මස 11 වන දින කොළඹ කොටුව දුම්රිය ස්ථානයෙන් අපගේ චාරිකාව නිම කරන ලදී ඉන් අනතුරුව එම රණවිරු සාමාජිකයන් තමන් සහභාගී වූ මෙම චාරිකාවෙන් සතුටට පත් වූ බව ප්‍රකාශ කළහ. එසේම තමන් සහභාගී වූ මියගිය රණවිරු පවුල් සඳහා වූ මෙවැනි චාරිකාවකට කිසිද රණවිරු පවුලකට සහභාගී වීමට සිදු නොවේවායි ද සියළුම රණවිරුවන්ට දෙවියන්ගේ ආශිර්වාදය ද ආරක්‍ෂාව ද පතා සතුටින් විසිර ගියහ.


**බනි! ඩබ් ජිනපාල**

රෙ:සැ:මේ

2 (සේවි) ශ්‍රී ලංකා පාබල හමුදුව)




යාපාපටුන කොටි ත්‍රස්තවාදීන්ගේ මිලේච්ඡ පාලනයෙන් මුද ගත් ශ්‍රී ලංකා යුද හමුදව වෙනුවෙන් ප්‍රදේශවාසීන් විසින් පොන්නාලේ කෝවිලේ හි පවත්වන ලද ප්‍රථම හින්දු දේව පූජාව වෙනුවෙන් සහභාගි වූ 6 ශ්‍රීලපාහ සහ 9 ශ්‍රීලපාහ ඒකක නියෝජිතයින්.



නැවත තම නිවස්න වෙත පැමිණි යාපනයේ ජනතාව පොන්නාලේයි ප්‍රදේශයේදී ශ්‍රී ලංකා යුද හමුදව 9 ශ්‍රීලපාහ වෙතින් සහනාධාර ලබාගත් මොහොතක්



පොන්නාලේ ප්‍රදේශයේ ජනතාව තම නිවහන් කරා පැමිණ දෙවියන් යැද සාමය ප්‍රාර්ථනා කලහ. හමුදව අතින් සහනාධාර ලැබිණි. විඩාපත් ඔහුන් උදෙසා 9 ශ්‍රීලපාහ ඒකකය සිසිල් පැන් සංග්‍රහයක් ලබාදීම ඔහුන්ට ඉතා සතුටක් විය.

# අහිමි වූ සෙනෙහස

ඔබට අමතන්නට ඇමතුමක් සොයා, මා මෙපමණ වෙහෙසිණැයි කීවොත් ඔබ එය පිළිනොගන්නා බව මම දනිමි. එද මෙන් අදත් ඔබට අමතන්නට නිදහස මට ඇතොත් අමතන අයුරු මම දනිමි.

මියගිය අතීතයේ මිණිවල හාරා, අවුස්සා ලබාගත් ඇටකටු වලට කථා කල හැකි නම්, මා එද ඔබට ඇමතූ හැටි එයින් දැනගත හැකියි. එහෙත් අදත් ඒ ඇටකටු ගොළුයි. ගොළු ලොවක තනිවූ මා පෙරසේ ඔබට කෙසේ අමතන්න ද?...

දැන් ඔබට මා කෙසේ ඇමතුවත් එය වැරදි සහිත බව මම දනිමි. දැන දැන වැරදි කරන්නට මට නොහැකිය. එහෙත් එය වරදකැයි නිහඬ වුවහොත්, මගේ හදවතේ බර සඳහටම අයිති වේවි. මේ බර දරාගෙන මට මිය යා නොහැකිය. සැහැල්ලු හදවතින් මිය යන්නට මම කැමැත්තෙමි. එහෙයින් මම ඔබට පෙරසේම යලිත් අමතමි. එය වරදක් බව මම දනිමි. ආත්මයකට සංසිඳීමත් අපේක්ෂාවෙන් කරන සුළු වරදක් වරදක් ලෙස ගණන් ගන්නා අය ඇතොත් ඒ ඉතාම ටික දෙනෙකු පමණක්විය හැකිය. යලිත් පෙරසේම මම ඔබට අමතමි.

'ආදරණීය...'

මිරිගුව පසුපස දිවූ අසරණ මුව පැටියාගේ අවසානය ගැන බොහෝ දෙනා කියනා කථා මම අසා ඇත්තෙමි. ඒ කථා ඔවුන් කියන්නේ මා උදෙසා යැයි මම බොහෝ වාරවල සිතුවෙමි. නුවනින් මෙනෙහි කරන විට මිරිඟුවට දිවූ මුව පැටියා ඇතරත්, මා අතරත් එතරම් දුර පරතරයකනැති බව පෙනෙයි. එහෙත් මිරිඟුවට දිවගොස් මියගිය මුව පැටියා මට වඩා සිය දහස් ගුණයකින් තෘප්තිමත්වූ, ජයග්‍රහකයෙකු බව දන්නා ඇත්තතන් ඇතොත් කොතෙක් දෙනෙක් ද?

මුව පැටියා මියගියේ නොසංසිඳුන ආශාවෙනි. මම ද නොසන් සිඳුන ආශාවෙන් ජීවත්වෙමි. මුව පැටියා සමග උගේ ආශාවන් ද මිය ගියේ ය. යලි ඌ කොතනක හෝ ඉපදුනොත් උගේ ආශාවෙන් ද ඌ සමග උපදිනු ඇත. නව ජීවනයකින් උපත් ආශානිසා, ඌ යලිත් පෙරසේම දිවෙනු ඇත. මේ අන්දමින් ආශාවෙන් සංසිඳුවා ගන්නට දිවෙන මුව පැටියාගේ ගමනෙහි කෙලවරක් නැත. මිරිඟුව ඇතිතාක් උගේ ආශාව පවතී. ආශාව පවතිනතාක්, ඌ මිරිඟුවට දිවයයි. අවසානය මිරිඟුව ජීවමාන තත්ත්වයෙන් තබා මුව පැටියා බිල්ලට ගනී.

'මෙය තේරුම් ගත නොහැකි අභිදහමක් සේ ඔබ සිතනු ඇති. එහෙත් එවැනි කිසිවක් මෙහි නැත. මිනිස් සිතක් තේරුම් ගත යුත්තේ මිනිස් සිතකින් ය. තිරිසනුන්ගේ සිත් තේරුම් ගන්න මිනිසෙකුට බැරි ඇයි. සමහර විට තේරුම් ගත යුතු මිනිස් සිත තිරිසන් සිතකටත්, වඩා අන්ත එකක් යයි ඔබ සලකනු ඇති. පැවැත්මෙහි ගති ගුණවලින් තිරිසනුන් ද ඇති ඔබ තිරිසන් සිත මනින මිනුම් දණ්ඩ කුමක් දැයි හරිහැටි නොදන්නා, මා ඔබ මගේ සිත මනින්නේ කෙසේදැයි කෙලෙස කියන්න ද.....?

ඔබට මා ලියන මේ ලිපිය මහා හිසදරයක් විය හැකියි. නොසංසිඳුන ආශා ඇත්තා පිස්සෙක් නම් පිස්සෙකු ගෙන් වන කරදරයක් තාවකාලික බැවින් අතීතය මෙනෙහි කොට මේ තාවකාලික කරදරයට සොම්නසින් මුහුණ දෙන බව මට ප්‍රත්‍යක්ෂයි. පුහුදුන් මිනිස් සිතක පැලපැදියම් වී ඇති නොසංසිඳුණු ආශාවන්ගේ ප්‍රතිඵලය උමතු බව නම් උමතුවුවෙකු දොඩවන දේ, විකාර ලෙස සලකන බුද්ධිමත් ලෝකෙක හුදෙකලාවේ දුක් විඳින්නන් කෙරෙහි සමාජයේ අනුකම්පාව බලාපොරොත්තු විය හැකිය.

එවැනි සාධාරණ අපේක්ෂාවකින් රස්තියාදු වූ මට මා එපාවෙන තෙක්ම ආත්මයට ලැබුණු හැම වේදනාවක්ම හැම පරාජයක්ම, සිනාමුසු මුහුණින් පිළිගෙන ඒ හැම විටෙකම නිහඬව සිටි අයුරු ඔබ දන්නවා ඇති. දැන් ඉතින් ඔබ මා අසලක සිටිනවා නම් අසාවි.....

'මොනවාද මේ කථා කරන්නේ ඔයා පිස්සුවෙන් ද කියා. ඒත්.... ඇත්තම කියනවා නම් ඔබ හිතන තාලයේපිස්සුවක් මට නැති බව ඔබ පිළිගන්නවා ඇති. ඇත්තෙන්ම මා පිස්සු වැටුනා නම් කොතරම් හොඳද, එසේ නම් මාත් අපට පිස්සන්ය කියන බුද්ධිමතුන්ගේ තාලයට වී ඔබට පිස්සී කියනවානේ....

එහෙත් ඔබේ ප්‍රීතියේ දී මට සිදු වී ඇත්තේ දුක්වන්නටයි. එය මගේ දුබල මිනිස් බවේ අමරණීය සංකේතය විය හැකිය. ඔබ ප්‍රීතිවන හැම විටෙකම නොපැවසිය හැකි, නොදැරිය හැකි මහත් වේදනාවකින් පිරිපීඩනයට පත් වූ මා එද මෙන් අදත්, මේ දුක් විඳින්නේ එම වේදනාවෙන් බව ඔය දනීනම්.... එද හදිසියේ එවැනි පියවරක් නොගන්නවා ඇති. මිනිස් සිතක් තේරුම් ගැනීමට තවත් එවැනි මිනිස් සිතක් අපොහොසත්වීම එවැනි හදිසි පියවරක් ගැනීමට ඔබ පෙළඹුනු වැදගත් පියවරක අති විපාක හමුවුයේ ඔබ දුර්මුඛ වී සිටි විටෙක වේදනාවෙන් දුක් විඳි විටෙක, ඔබට දෙන්නට දිගුකල අත ඔබ අකාරුණිකව පා පහර එල්ල කලේ ඇයි දැයි යන්න විසඳ ගත නොහැකි ගැටළුවක් බවට පත් විය.

ඒ ගැටළුවට මහත් වෙරයෑයම් යොද මුහුණ පෑ ජීවිතයට ගැටළුවක් බවට පත්වන තුරු ඔබගේ කරුණාව අපේක්ෂාවෙන් වේදනාවිඳි අයුරු ඔබ නොදන්නවා නොවේ. එහෙත් ඒ දන්නා සියල්ල නොදන්නා ළදැරියක සේ බැලීමෙන් මගේ වණවුණු හදවත තව තවත් පෑරෙන බව ඔබ මොහොතකටවත් සැලකුවේ නැහැ.

වැදෙන තැනට සැමවිටම රිදීමත්, රිදෙන තැනටම නිතර, නිතර වැදීමත් ප්‍රවේණි උරුමයක් බැවින් ඒ ප්‍රවේණි උරුමයේ හිමිකාරයෙකු ලෙස මට අත්වූ වේදනාව මා කොතෙක්කල් නම් ඉවසන්න ද?


**සෙ/ 20946 කෝප්‍රල් සිරිමානිස්**
මූලස්ථානය 2 (සෙව්) ශ්‍රීලපාහ
යුධ හමුද කඳවුර සිංහපුර වැලිකන්ද.

# "ආබාධිත රණවිරුවන්ට පරිත්‍යාග භාණ්ඩ ලැබීම්"

1 වන කමාන්ඩෝ රෙජිමේන්තුවේ මේජර් වයිඑච්පීඑන්වයි සේනාධිපති, කරෙ ගේ මූලිකත්වයෙන් සිංහ සමාජයේ උප සිංහාධිපති මයිකල් රංජිත් මැතිතුමා හා කොළඹ සිංහ සමාජයේ සභාපති නලීන් පෙරේරා සහ එම මැතිණිය විසින් මෙම ඒකකයේ ආබාධිත රණවිරුවන් උදෙසා අත්වාරු යුවල් (ඇළුමිනියම්) 200 ක් පරිත්‍යාග කරන ලදී.

මෙම උත්සවය 1996.05.11 දින රෙජිමේන්තු මධ්‍යස්ථානය, ශ්‍රීලපාහි දේශණ ශාලාවේදී පැවැත්වුණු අතර, එකී උත්සවයට රෙම ශ්‍රීලපාහ මාහි II මේජර් ඩබ්ඩබ්එස්එල් ප්‍රනාන්දු, ආර්එස්පී, ශ්‍රීලපාහ රෙජි: ආබ ශ්‍රීලපාහි නිලධාරී අණදෙන කපිතන් අයිපීආර්පී බෝගොඩවත්ත, ශ්‍රීලපාහ ඇතුළු රණවිරුවන් විශාල සංඛ්‍යාවක් සහභාගී වන ලදී.

තව ද, එදිනම 7 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරී මේජර් කේඒඩීඒ කරුණාසේකර, ආර්එස්පී, ශ්‍රීලපාහ ගේ මහ පෙන්වීම මත ධානපති හේමක ඩයස් මහතා හා එම මැතිණිය විසින් පහත නම් සඳහන් රණවිරුවන් දෙදෙනා හට අත්වාරු යුවල් 02 ක් පරිත්‍යාග කරන ලදී.

සෙ/300054 කෝප්‍රල් උපුල්සිරි එච් 7 ශ්‍රීලපාහ
සෙ/301344 කෝප්‍රල් රණවීර එච්පීඑන් 7 ශ්‍රීලපාහ



මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ සිංහ සමාජයේ උප සිංහාධිපති මයිකල් රංජිත් මැතිතුමා විසින් මෙම ඒකකයේ ආබාධිත රණවිරුවෙකු වන 4 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/14217 ලාකෝ ප්‍රේමසිරි එම්එච් හට අත්වාරු යුවලක් පරිත්‍යාග කරන අයුරුයි. රෙම ශ්‍රීලපාහ මාහි II මේජර් ඩබ්ඩබ්එස්එල් ප්‍රනාන්දු, ආර්එස්පී, ශ්‍රීලපාහ සහ රෙජි: ආබ ශ්‍රීලපාහි නිලධාරී අණදෙන කපිතන් අයිපීආර්පී බෝගොඩවත්ත, ශ්‍රීලපාහ පසෙකින් සිටී.



මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ ධානපති හේමක ඩයස් මහතා හා එම මැතිණිය හා පුතණුවන් විසින් 7 ශ්‍රීලපාහ ඒකකයේ ආබාධිත රණවිරුවෙකු වන සෙ/301344 කෝප්‍රල් රණවීර එච්පීඑන් හට අත්වාරු යුවලක් පරිත්‍යාග කරන අයුරුයි.



මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ සිංහ සමාජයේ සභාපති නලින් පෙරේරා මැතිතුමා විසින් මෙම ඒකකයේ ආබාධිත රණවිරුවෙකු වන 4 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/14723 ලාකෝ රම්බණ්ඩා ආර්එම්ටී හට අත්වාරු යුවලක් පරිත්‍යාග කරන අයුරුයි. රෙම ශ්‍රීලපාහ මාහි II මේජර් ඩබ්ඩබ්එස්එල් ප්‍රනාන්දු ආර්එස්පී, ශ්‍රීලපාහ හා රෙජි: ආබ ශ්‍රීලපාහි නිලධාරී අණදෙන කපිතන් අයිපීආර්පී බෝගොඩවත්ත, ශ්‍රීලපාහ පසෙකින් සිටී.




සැකසුම:
කපිතන් ඩීඑම් විජේරත්න ශ්‍රීලපාහ

හිතවත් පාඨකය !

උතුරේ හා නැගෙනහිර බංකරයේ රාජකාරියේ යෙදී සිටින ඔබ වෙත නිරතුරුවම ගලාඑන කවි සිතිවිලි හා සංකල්පනා සඳහා මෙම පිටු කිහිපය වෙන්ව ඇත.

ඔබගේ උසස් නිර්මාණයන් "තල් අරඹේ සිට" වෙත ලැබීමට පහත සඳහන් ලිපිනයට තැපැල් කරන්න

සංස්කාරක, "තල් අරඹේ සිට", වයිට් හැකල් සහරාව, රෙම ශ්‍රීලපාහ, හමුද ජනපදය, පනාගොඩ

# සෙබල බිරිඳ නුඹද සෙබලියකි !

නීතියට ගරු කරන, විනය ගරුක එමෙන්ම දුකට හෝ සැපට එකලෙස මුහුණ දියහැකි ඉතාමත් දැඩි චිත්ත ශක්තියකින් හෙබි, මිනිස් සමාජය තුල ජීවත්වෙන කාර්යශූර අයවලුන් සෙබළුන් ලෙස හඳුන්වති. තමන් වෙත පැවරෙන කාර්යය නිමාවෙන තෙක් නොසැලී වගකීමෙන් එය ඉටු කිරීමට තමන් සතු උපරිම ශක්තිය යොදවන අතර ජය පරාජය එකලෙස දරා ගනිති. බොහෝ දෙනාගේ යහපත උදෙසා මරණය ඉදිරියේ සිනාසී තම ජීවිතය පවා පුද කිරීමට වුව ද ඔව්හු නොපැකිලෙති.

උතුරු නැගෙනහිර වියරු කතරේ දෙමාපියන් දූ දරු සහෝදර හිත මිත්‍රාදීන්ගෙන් ඈත්වී මේ පුංචි ලංකාද්වීපයේ ඒකීයභාවය උදෙසා සටන් වදින්නේ මතු පරපුර වෙනුවෙනි. මේසා සුවිශාල කාර්ය භාරයක් කිරීමට මේ මිනිසා බිහිකර ඔහුට ශක්තිය, ධෛර්යය සිත තුල ජනිත කලේ 'ගැහැණියයි'

ගැහැණිය යන පොදු නාමය යෙදුවේ, සෙබලා මෙලොවට බිහිකල මවගේ සිට එක් එක් කාලයන් අතරතුර විටෙක සහෝදරියක් ලෙසින් ද විටෙක පෙම්වතියක් ලෙසින් ද, විටෙක දයාබර බිරිඳක් ලෙස ද, ඔහුගේ සෙවනැල්ල සේ හිඳ ඔහු දිරිමත් කරනු ලැබුවේ ද, ලබන්නේ ද ගැහැණියයි. මිනිසෙක් යුග පුරුෂයෙක් වන්නේ ඇයගෙන් ලද ශක්තියෙනි. යුධ සෙබලාගේ බිරිඳ ගැන කථා කලොත් ඇයට පැවරී ඇති කාර්ය භාරය අති දුෂ්කර ය. ඇය අන්බිරියන්ට වඩා බැරෑරුම් දිවි පෙවෙතකට ඇතුළු වී සිටියි. එයට ප්‍රධාන හේතුව තම ස්වාමියා අවිනිශ්චිත කටයුත්තක නියැලී ඇති බැවිනි. එහෙත් ඇය ඇයගේ යහපතට, සුවසෙතට වහල්වී ඔහු අධෛර්ය නොකරයි. තම දූ දරුවන්ගේ වැඩ කටයුතු එමෙන්ම තම පවුල නගා සිටුවීමට ද දුක් කරදර එක ලෙස විඳ දරා ගැනීමට ද සිදුවේ. අත්‍යාවශ්‍යය හේතුවකට වුවද යුධ පෙරමුණේ රාජකාරීන් අතපසු කර තම සැමියාට ගමරට ඒමට හැකිවේයැයි විශ්වාස කළ නොහැක. ඔහු නැති අතර තුරේ එදිනෙද දිවිගමන හරියාකාරව ගෙනයාමට ඇය දැඩි වෙහෙසක් දරයි. සෑම ප්‍රශ්ණයකටම ඉන්ද්‍රකීලයක් සේ නොසැලී ඉන්නට ඇයට ශක්තිය ඇත. යුධ බිමේ ඔහුගේ සෙවනැල්ල සේ ඔහුගේ සිතේ ඇය රැඳී ඇත. අනෙක විඳ ගැටළු දුක් වේදනා උහුලා ගැනීමට ශක්තිය සෙබලාට මෙන්ම ඇයට ද හුරුවී ඇත. සෙබල බිරිඳ මේ සියලු ගැටලු ආශාවෙන් විඳ දරාගෙන දැඩි ආත්ම ශක්තියකින් තම ස්වාමියා වෙනුවෙන් අවැසි කටයුතු ඉටු කරයි. තම දූ දරුවන්ට යහපත කියා දෙන්නට සිටින පියා ද, මවද, වැඩිහිටියා ද ඇය වේ. රට ත්‍රස්තවාදී උවදුරෙන් බේරාගැනීමට ඇයගෙන් ලැබෙන සහාය උපකාරය ප්‍රසංශනීයයි. මේ පන්නරය සෙබලාට හිමි වූයේ ඇයගේ ද ශක්තියෙනි.

සෙබල බිරිඳ නුඹ දිරිය දියණියකි! මතු දිනක නුඹ සිනාසෙනු ඇත. අද දුක් ගැහැට විඳිමින් තව තවත් ආත්ම ශක්තිය ධෛර්යය බලාපොරොත්තුව ඔහු තුල ඇති කර ත්‍රස්ත උවදුරෙන් මේ පුංචි මතු ඇටය බේරා ගැනීමට ඔබ දරණ උත්සාහය අගය කළ යුත්තකි. එබැවින් සෙබල බිරිඳ නුඹද සෙබලියෙකි.

සෙ/15432 ලා/කෝ ප්‍රනාන්දු පීඩීආර්එන්
රෙම ශ්‍රීලපාහ වාදක අංශය
පනාගොඩ කඳවුර

# අළුත ගෙනා මනමාලී

පොරෝණය තුළ උණුසුම් කර,
හිස සිඹ සතපා,
මා පසෙක වැතිරෙන නුඹ යැයි සිතා
තදින් පපුවට තුරුළු කර ගතිමි
ගිනි අවිය....

බනි II ගාමිණී කුමාර
4 ශ්‍රීලපා හමුදාව
මූලස්ථානය - 2 (සෙවි) ශ්‍රීලපාහ




# ශාපලත් කිඳුරියේ...

පාලු රැයාමයේ - වීදි කොතක සැරිසරන
සලෙල පහසක් පතා - සිත නොවේ ගත දිවෙන
පරාජිත හැඟුම් පිරි - මතුපිටින් සිනාසෙන
දයාබර නැගනියේ......
ශාපලත් ලෝකයට - නිලි රුවක් වෙලා අද.

හදවතින් හිනැහෙන - ජීවිතය ජයගන්න
දුක් ගැහැට කඳුලු මැද - ගෙවුනු රන් අතීතය
අතරමග හැරදමා - මහමගට පිවිසෙන්න
සිත හඬන කුමරියේ.....
ඇයි ලොවින් කොත් වුනේ - විමසනා අයකු වෙද....

නින්ද අසලට නැතිව - සතුට කිසි විට නොදැන
තව අයකු සනසන්න - සිත නොවේ ගත යොදන
සලෙල තිරිසන් ලොවට - ශරීරය මිලකරන
ශාපලත් කිඳුරියේ.....
ලොවට ඔබ පෙනෙන්නේ - කාමිනියක් ලෙස ද...

අහිංසක යුග දෙනෙත - මැලවිලා නිදි බරින්
එහෙත් ලොව දකින්නේ - රාගයක උමතුවන්
මේ කුරිරු රුදු ලොවේ - දිනෙක ඇස් පැදෙමින්
දකිනද සොඳුරියේ.....
මගේ සිත හඬන ඔබ - අප අතර හිඳීවි ද.....

සෙ/00388
**ලාකෝ චාමන් ඊ**
මූලස්ථානය - 9 ගිලපාහ ඉලේකාඩු - පලාලි

# සාමයේ පැතුම

| | |
|---|---|
| අවවන උගුල් බිහිසුනු කම් විවිධ | උපා |
| වවහා ගත යුතුයි බිහිසුණු ගතිය | නොපා |
| හෙට ජය බිමක් මත රඳවනු පිණිස | දෙපා |
| රට ගැන මිසක් ජාතිය ගැන සිතනු | එපා |
| ගම නගරය හරහා අවියෙන් අවිය | ගැටී |
| හැමද ගලනු ඇති උනු ලේ කඳුලු | කැටී |
| කිම තව දුවනු රණ බිමටම වියරු | වැටී |
| සමගිය සමාදානය මුළු ලොවම | වටී |
| දෙවියනු බුදුන් දෙසූ සාමය මගම | විනා |
| පිවිතුරු මගක් නැත ආදරය | විනා |
| සවිමත් වුව ද මහ යුධ බල මඩුලු | තනා |
| අවියෙන් නැසෙනු ඇත අවිගත් සියලු | දෙනා |
| හැමද අවුල් මත කලබා ජන | දිවිය |
| නිමකල හැකිය අප හට මේ යුධ | පිටිය |
| සමගිය වෙනොත් දියුණුව පදනම | සවිය |
| කුමට ද ජාති වාදය බිහිසුණු | අවිය |

සෙ/5D01686
සාසෙ සමන් කුමාර පී
5 වන ශ්‍රී ලංකා පාබල හමුදව

# දැන් ඔබගේ අවස්ථාවයි

අතීතයෙ සිට අද දක්වාම
අතරින් පතර සිටියා ඔබ,
නමුත්, කුමක්දෝ හේතුවක් නිසා
කොහේ හෝ තැනක ඔබ සැඟවුනා

මිතුර එපා එලෙස සැඟවෙන්න
ඔබෙන් ඉල්ලා සිටින්නේ
එපා සැඟවෙන්න කිසිදිනෙක
ඉක්මනින් රජයන්න ඔබ

**2/ලුතිනන් ඩීඒ පීරිස්**
ශ්‍රීලපාහ
4 ශ්‍රීලපාහ ඩී කණ්ඩායම
කිලාලි, මිරිසුවිල්

# ඇසගෙන් ඔහුව හසුනක්

ඇත සැඩදිය කරදිය වලල්ලේ
දැවෙන දුම්රොඩු විසුල ගුවනේ
දෙරණ ගිනිගත් වාළුකාවේ
කොතැනක ද ඔබ මා ද එතැනයි
මගේ සපුමල් කුමරුනේ....

ඔබ දිනූ බිම මා දිනූ බිම
දිනා රුපු එඩි සිඳදමා
එනතුරු ඔබ කප් සියක් වුව
හිඳින්නේ පෙර මග බලා - සෙනහසේ
කඳුලින් පුදන්නයි
මගේ සපුමල් කුමරුනේ....

එපා නද දෙන්න බක්මහේ කොවුලනේ
විරුනගේ ලේ සුවඳ හමනවා දස අතේ

රුදුරු ගිනි අවිය අත දරා උනුන් රැ
නිදි වරා මව්බිමේ නාමයෙන්
රකින්නේ මව් බිමයි - එඩිතරයි සුන්දරයි
මගේ රන් කුමරුනේ

සිතින් දහස්වර ඔබ සමග මා තනි නැතේ
කුමරුනේ
හෙට දිනක් ඇත අපට දුක් ශෝක ගිනි
නිවුනු....

කඳුලට සුසුමට ඔබේ හද වැලපෙන්න එපා
හමුවන බාධක ගණනට ගන්න එපා
හෙට දින රුපුන් වෙනුවෙන් මිය ගියත් නුඹ
නොනැසෙනු ඇතිය කිසිදින රණ විරු
සුවඳ....

**සෙ/304895 සාසෙ විජේනායක සීඒඑස්**
8 ශ්‍රීලපාහ ඩී කණ්ඩායම




# සෙබළ හදවතක ඔවදන්

සෑම විටම අන් අය සමග ප්‍රසංශාත්මකව කථා කරන්න. මූණට මුහුණ දී කතා කරන සෑම විටම අනෙක් පුද්ගලයාගේ දෑස දෙස බලන්න. කරුණාකර, ස්තුතියි වැනි වදන් ඔබේ ව්‍යවහාරික වචන මාලාවට නැතිවම බැරි වචන බවට පත් කර ගන්න. අන් අයගෙන් ඔබ බලාපොරොත්තු වන සැලකිලි ප්‍රසංගා සියල්ල ඔබ විසින් අනෙකුත් අයට ද ලබා දෙන්න අලුත් මිතුරන් ඇතිකර ගන්න. පැරණි මිතුදම් රැකගන්න. වංචා කිරීමෙන් වලකින්න. රහස් රකින්න. ඔබ අතින් වරදක් වූ හැම විටම ඒ වරද පිළිගැනීමට පුරුදු වන්න. අන්‍යයන්ට සවන් දෙන්නට පුරුදු වන්න. අන් අයගේ බලාපොරොත්තු බිඳෙන අයුරින් කථා නොකරන්න. බලාපොරොත්තුව ඔහුට හෝ ඇයට හිමි වූ එකම දෙය නම් ඒ බලාපොරොත්තුව බිඳ දැමීම ඔහුට හෝ ඇයට කරන ද්‍රෝහිකමක් වන බැවිනි. කෝපයෙන් සිටින කිසිවක් නොකියන්න නොකරන්න. හිස් වචන තෙපලීමෙන් වලකින්න. බැහැ, නොකියා වැනි වදන් තෙපලීමේ ආචාරශීලී ලෙස පැවසීමට පුරුදු වන්න. ජීවිතය සෑම විටම ඔබට සාධාරණ වේ-යැයි නොසිතන්න. නොදන්නා යමක් නොදන්නා බවකීමට මැලි නොවන්න. වරදක් වූ විට සමාව ගැනීමට පුරුදු වන්න. යමක් ලබා ගැනීමට ප්‍රාර්ථනා නොකර ඒ වෙනුවට නිදහස සහ ශක්තිය ලබා ගැනීමට ප්‍රාර්ථනා කරන්න. එවිට සෙසු සියල්ල නිකම්ම ඔබට ලැබෙනු ඇත.

ජය ගැනීමට අපහසු දෙයකට මුහුණ දෙන විට එය කිසියේත්ම පරාජය නොවන බව දැඩිව විශ්වාස කරන්න. ජීවිතය දෙස සුභවාදී ලෙසත් අපේක්‍ෂාගත ලෙසත් බලන්න. සිතට අවංකව කථා කරන්න. පැවරෙන රාජකාරිය සිතට එකඟව ඉටු කරන්න. නොදන්න දෙයක් කරනවිට තමා ගැන සහ අන් අය ගැන සිතන්න.

සෙ/14484 සැරයන් කරුණාරත්න එම්
'ආධාරක' කණ්ඩායම 7 ශ්‍රීලපාහ

# "අම්මා"

අම්මා ගැහැණියක් වී මෙලොව ඉපදීමට වරම් ලබා පසු කලක ලක් මැණියට මිණි කිරුලක් වී මවක් ලෙස කිරුල පලඳිනා අම්මා ජාතියේ මිණි පහනකි. මෙලොව අප කාටත් ලැබෙනා සෙනෙහස් ගඟුලෙන් උතුම්ම සෙනෙහස ලැබිය හැක්කේ අම්මාගෙනි. අපි වරක අම්මාට වැඳුම් පිදුම් පවා කරනුයේ අම්මා යනුවෙන් සිතමිනුයි. තවත් වරෙක ඇය අපෙන් පිදුම් ලබන්නේ ගෙදර බුදුන් යන වචනා කියමන මුදුන් පත් කරගෙන ය. අම්මා යනු මෙලොව එළිය කරන බුදු රුවකට සමාන අයෙකි.

රන් සේසත් මදි මැණිය ඔබට පුදන්නට  
ඔබ කළ පින් ඇතිය මතුවට බුදුවන්නට  
වෙහෙසෙයි සෑම දිනම අප ගැන බලන්නට  
අම්මේ පතමි ඔබ මතුවට බුදුවන්නට

සෙ/304822 සාසෙ කුලතුංග එස්පී
'ආධාරක' කණ්ඩායම 7 ශ්‍රීලපාහ

# අමතක වේද පාසැල් දිවියේ අරුමේ

පාසැල් දිවිය සරසන්නට විටින් විට  
ඇන්දෙ කොට කලිසමයි මම පාසලට  
එනමුත් හදේ දුක ඇති වන වෙලාවට  
මා නොදැනුවත් වම යයි එම අතීතෙට

හිතල ද සැහැලු කරගෙන අප සිනාසුනේ  
ගමේ වෙහෙස නොතකා අප දුව පැන්නේ  
කවුරුත් සමග පාසැල් දිවියේ වැඩුනේ  
කාටද නොදැනෙන්නේ පාසැල් දිවියේ අරුනේ

සමතල සිතුවිලිත් මගෙ හද ගත්තේ  
සුදුවත ගතයි නිතරම සරසා ගත්තේ  
මං මාවත් සුදු පිරිවරකට මෙන් ගත්තේ  
කාටද අනේ අමතක පාසැල් වරිනේ

එකම මවකගේ දරුවන් මෙන් පාසලේ වැඩුනේ  
හොඳ මිනිසුන් වෙන්නයි දෙගුරුන් පැතුවේ  
ටික කාලයක දී පාසැල් දිවියෙන් මිදුනේ  
අමතක වේද පාසැල් දිවියේ අරුමේ

සෙ/15513 කෝප්‍රල් ගුණතිලක එච්පී
"බී" කණ්ඩායම 7 ශ්‍රීලපාහ

## ශාපලත් යුද්ධය

මිනිසුන් සැමතැන කඳුළු සලන්නේ  
උත්තිට් තැන් ඔවුනට අහිමිව යන්නේ  
අසරණ මිනිසුන් ගැන සිතමින්නේ  
පිබිදුණු මල් වැල් පරවී යන්නේ

අවුරුදු ගණනක් යුද්ධය කරන්නේ  
දහස් ගණන් ඉන්කම්පා වන්නේ  
සදෙව් ලොවට අධිපති දෙවි යන්නේ  
'යුද්ධයේ ශාපය' නිම කරලන්නේ

සෙ/306905 සාසෙ රත්නායක ආර්එම්යුකේ
10 ශ්‍රීලපාහ. පලෙයි - යාපනය

# ඔවදන්

තමන්ගේ ජීවිතයේ වැරදි සොයා ගැනීමත් අන් වැරදි නොසෙවීමත් තමාගේම නිවරදි භාවයට මුල පිරිමකි

ජීවිතය ප්‍රීතිමත් වන්නේත්, කරන දෙය සාර්ථක වන්නේත්
තමා අසා කරන දේ කිරීමෙන් නොව කරන දෙයට ආසා දැක්වීමෙනි.

ලස්සනට වඩා ගුණ යහපත් කම අගනේ ය.
ධනයට වඩා දැන උගත් කමින්,
ලොව දිනිය හැකි වන්නේ ය.

සෙ/28203
ලාකෝ විජේරත්න එච්එම්
10 ශ්‍රීලංජාආබමු "බී" කණ්ඩායම

# සෙබල පැතුම්

රට උදෙසා දිවි පිදූ මාගේ  
වීර උතුම් හෙළ සෙබලුන්ගේ  
ගැලූ හෙළ රුධිරයෙන් උප වැටුණු  
සිංහ ධජය අපේ අභිමතයයි

ඔසවා සිංහ ධජ ලක් අඹරේ  
එහි සෙවනැලි යට තුන් සිංහලයේ  
ජීවත් වෙමු නැති නම් මැරිලා  
අපේ ලෙයින් එය පන පොවමු

සිංහලයේ සතුරන් නසලා  
රකිනෙමු ලක් මව දිවි පුදලා  
ජයබිම් මෙන් අපෙ මිනී වලෙන්  
සිහ කොඩි ලෙලදේවා....

සෙ/18930 බනි II හෙට්ට්ආරච්චි එච්. ඒ. ජේ
2(සෙවි) ශ්‍රීලපාහ ඉදිරි මූලය - සිංහපුර, වැලිකන්ද




# "මේ ඔබේ කාලයයි"

ගේ මුල්ලේ කුස්සියේ
නිද සිටි කාලය අවසන් ය.
දයාබර පතිනියෙනි, මව්වරුනි, ගෘහනියනි
අතහැර දමා ඔය හැලි වලං පසෙකට
යා යුතු ය දූ පුතුන් ගිය මගට
ඩාවින්, ලෙනින්, නේරු
බිහි කළේ දයාබර ඔබමය.
ඔවුන්ගේ උදරතර සේවයේ
ගෞරවය හිමි වන්නේ ද ඔබටමය.
ඉතින් පිළිගන්න
පන්නරය ලැබ ගන්න
යුක්තියේ නාමයෙන්
මිය ඇදුණු දසදහස්
සොහොයුරු, දූ පුතුන්, හිමිවරුන්
බිහි කලේ ද ඔබමය.
ඔවුන්ගේ අළු මතින් නැගිටින්න
නිද සිටි කාලය අවසන් ය.
දයාබර පතිනියෙනි, මව්වරුනි, ගෘහනියෙනි,
මිනිසුනේ, මිනිසුනේ
එක් වී බලමි.
මුලාවක් වී මුසාවක් නොව
පත්හිදෙන් මා ලියන්නේ
බිදුනු තල් වැටේ මුල්ලක තනිවී
අපේ අසල්වැසි අසරණ යුවතිය
කෝවිල දෙස නෙත් අයා සිටින්නේ
දෙවියන් කොහිදැයි.... දෙවියන් කොහිදැයි
ෂෙල් වෙඩි යුද්දෙන්
දෙවියන් පන්නා
අවි අත ගත් උන්
තල් වැට බින්දෝ
හිමි අත ගන්නට
දැවැදි නැති අය
ගිනි අවි ගත්තී
තල් වැට රැකුමට

සෙ/5ඩී 01686
**සාජේ සමන් කුමාර පී**
5 ශ්‍රීලපාහ
පල්ලෙකැලේ - කුණ්ඩසාලේ.

# සාමයේ පැතුම

අටවන උගුල් බිහිසුණුකම් විවිධ උපා
වටහාගත යුතුයි බිහිසුණු ගතිය නොපා
හෙට ජයබිමක් මත රඳවනු පිණිස දෙපා
රට ගැන මිසක් ජාතිය ගැන සිතනු එපා

ගම නගරය හරහා අවියෙන් අවිය ගැටී
සැමද ගලනු ඇති උණු ලේ කඳුළු කැටී
කිම තව දුවනු රණ බිමටම වියරු වැටී
සමගිය සමාදානය මුලු ලොවම වටී

දෙවියනු බුදුන් දෙසූ සාමය මගම විනා
පිවිතුරු මගක් නැත ආදරය විනා
සවිමත් උවද මහ යුධබල මඩුලු තනා
අවියෙන් නැසෙනු ඇති අවිගත් සියලුදෙනා

සැමද අවුල් මත කලබා ජන දිවිය
නිමකල හැකිය අපහට මේ යුධ පිටිය
සමගිය වෙනෙත් දිවුණුව පදනම සවිය
කුමට ද ජාතිවාදය බිහිසුණු අවිය

සෙ/5ඩී 01686
**සාජේ සමන් කුමාර පී**
5 ශ්‍රීලපාහ පසු මූලස්ථානය
යුධ හමුද කඳවුර - පල්ලේකැලේ - කුණ්ඩසාලේ.

# යුද්ධය සහ පවුල් ජීවිතය

සතුරන් සොයා වනයේ සැරි සරන විට
මිතුරන් සමග මල් හසරැල් සලන විට
ගුවනින් බිමින් සතුරන් ප්‍රහු බඳින විට
සිහිනෙන්වත් ඇවිත් තොරතුරු කියනු මට

සිතළ සුළං ගත දැවම් හමන විට
පුපුරණ වෙඩි හඩින් දෙසවන් සැලෙන විට
සිහිව ඔබට පුතනුව සිත හඩන විට
සිරිලක් මව ද ජය ලබනව පෙනෙයි මට

කොටි කඳවුරු සොයා කැලයේ තැනින් තැන
බල ඇනි පිටත්වෙයි ජයගොස නගා ගෙන
වටකර කඳවුරක් කොටියන් මරා ගෙන
සිංහල ධජය එසවුනි බලකොටු බිඳ ගෙන

ලා/කෝ චන්ද්‍රපාල ආර්ඩීජී
සංඥා අංශය 5 ශ්‍රීලපාහ පෙර මූලය
කට්ටපරිච්චන්, මුතූර්

## යෞවනය

යෞවනයේ නැගෙන මන්ද රාවය
ආසාව පරමාර්ථය හා අධිෂ්ඨානය
ජයග්‍රහනයේ මුල් දොරටුව වේ,
එය විවෘත කිරීමට ඇති එකම යතුර
ආත්ම විශ්වාසයයි......

සෙ/15905
**කෝප්‍රල් නවරත්න බංඩා ටීඑ්**
'බී' කණ්ඩායම 7 ශ්‍රීලපාහ

# යුධ බිමේ මිය ගිය විරුවනට උපහාරයක් වේවා!

වීර සෙබලාණනි ඔබ මිය ගියේ නැත
කුසුමක් ලෙසින් ඔබ වික සිත විය
සඳ සුවඳ දෙන අප හද නම් උයනේ
රට දැය සමය රකිනු වස්
උදර මෙහෙවරක නිරත වූ ඔබගේ
ළය මඩලින් ගලා ගියේ
උණුසුම් ලේ දාරා නොව
වීර සිංහල මාතාවක් විසින්
පොවනු ලැබුවා වූ
සුදෝ සුදුවන් කිරි ගංහාවකි
ඔබ ඔබේ රුහිරු බිඳෙන්
ලක් මව පෝෂණය කලේ ය
ඔබ වැනි උදර විරුවන් වෙනුවෙන්
සැමද රතු රෝස මලින්
සුවඳවත් වනු ඇත
ඔබ මිය ගියේ යැයි මා නොසිතමි
සිදුවූයේ විරුවෙක් ලෙසින්
වෙන්වීම පමණි
එබැවින් ඔබේ ජීවන සුවඳ
ලක් මාතාවගේ හදවත තුළ
සද රැදෙනු ඇත....
ඔබට නිවන් සුව ලැබේවා,

සෙ/5ඩී00552
**ලා/කෝ අමරවීර අබේකෝන් බීඑ්ඊ්**
5/ වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව
'සී' කණ්ඩායම, කුඹුරුපිටිය ත්‍රිමලේ

# සාමයේ මල් පිපේවා

අතීතයේ සිට අප මව්බිම වරින්වර සතුරු ග්‍රහණයන්ට ලක් වී තිබූ බවට අද වන තුරුත් එහි ලක්ෂණ සහ සිහිවටන දුටු සැනින් අප හා හටත් පෙනී යයි. නමුත්, එයින් අවසන් වී නොමැති භීෂණකාරී හා විනාශ කාරී යුද්ධයක් අප මව්භූමියේ රජ වෙමින් පවතින අතර, ඉතා කුඩා දිවයිනක පිහිටි අපේ රටේ ජීවත් වන සිංහල, දෙමල, මුස්ලිම් සහ අනෙකුත් ආගම්වල සිටින ලක්වැසි සැම දෙනාටම එක සේ පවතින විපත්ති කාර විනාශයෙන් හා වටිනා ජීවිත මේවන විටත් නැති වී හමාරය.

කෙසේ වුවත්, මෙතෙක් ස්ථිර විසඳුමක් ලබාදීමට නිරතුරු වෙහෙසෙන දේශපාලන නායකයින් මෙන්ම අනෙකුත් සංවිධාන ද කැපවී සිටියි. වසර 10 කට අධික කාලයක සිට මෙතෙක් වර්ධනය වී පවතින යුද්ධය තුළින් සාමයේ මල් පිපෙන තුරු ලක්වැසි සැම ඉතා ඕනෑකමින් බලා සිටියි. නව නොබෝ දිනකින් අප කවුරුත් පතන සාමයෙන් පිරි නිවහල් ශ්‍රී ලංකාවක් උදෙසා ලස්සන හෙට දිනයක් කරා පා තබමු.

සෙ/28204 සාසෙ පීනදස කේපී
"බී" කණ්ඩායම 10 ශ්‍රීලංපාබ




## කුරිරු යුද්ධය

කුරිරු යුද්ධය නිසා ලක් පොළව මත
පතිත වන සදෑම ලේ බිඳුවක්ම පොලවට
උරා ගන්නේ,
මිතුරු ලේ හා සතුරු ලේ වශයෙන්
කොටස් කර නොව එකම මනුෂ්‍ය
ජීවියකුගේ ලේ වශයෙනි....

සෙ/302761
සාසෙ සුරවීර පීපී
"බී" කණ්ඩායම 7 ශ්‍රීලපාහ

## සඳු තනිවී

නොහැක යලි හමුවන්න
එක්වන්න හදවතින්
කල්පයක පැතුමන්
සුන් වෙලා මොහොතකින්....
රහසින්ම නුඹ පැතු
ඔහුගේම ලෝකයට
එක්වන්න සිත්තොසින්....
වෛර කෙරුමට නොහැක
පෙම් කෙරුව හදවතට
ඉතින් මා සිටින්නම්
සඳ තනිවී සිතින්....

සෙ/301379
ලාකෝ බංඩාර එච්කේපීඑස්
"බී" කණ්ඩායම 7 ශ්‍රීලපාහ

## නව ලොවක අරුණළු දකින්නට

නිමාවක් නොදකින යුධ බිමේ
ලයට තුරුළු කරගත් ගිනි අවිය දෝතින් දරා
තල් වැටෙන් එහා ලොව තරණයට
ලොවම නිදි මුන් රැය පහන් වනතුරු
බලා සටිමි හෙට දිනක්....
ඒත්....
නොමැත උදවක් එලෙස
වෙඩි හඩින් ගිගුම් දෙන
වේදනා පරිසරේ
ශෝකාන්තයක් පමණි

සෙ/303100 ලාකෝ ජයවීර ඩීඑස්
1 ශ්‍රීලපාහ. ආධාරක කණ්ඩායම
යුධ හමුද කඳවුර. චාවකච්චේරිය. යාපනය

## ගිනි අවිය මම ඔබට ආදරේ

රුදුරු ඉම නොපෙනෙන සණ කැලෑවේ
වග වලසුන්, බියකරු නාදය කන්
දෙදරණ
වෙඩි ශබ්දය, සතුරාගේ අනුකම්පා විරහිත
වෙඩි උණ්ඩය....

බලාපොරොත්තු නුවත් මට ලැබෙයි මේ
හැම මොහොතක්ම ඇය මා තනිකර
නොයයි.
මා නිදි වර්ජිත ව සිටින විට ඇය මා
ලඟින් සිට මා සනසවයි.

සතුරා සොයා මහ වනයේ යන විට ඇය
මා සමග ගමන් කරයි.
මා මෙන්ම සතුරාට නොබියව මුහුණ
දෙයි. රුදුරු සතුරාගෙන් කුරිරු වෙඩි
උණ්ඩයෙන් ලය සිදුරු කලත්, මා නුඹලා
වෙනුවෙන් සදකල් සැතපෙන විට ඇය මා
සමග හිඳුනු ඇත.

මා මෙන්ම ඔබට ආරක්ෂා කරන බැවින්
මා ඇයට ආදරෙයි... මා ඇයට ආදරෙයි

සෙ/15245
කෝප්‍රල් කීර්තිරත්න
"බී" කණ්ඩායම 7 ශ්‍රීලපාහ

## යුද්ධය නුඹට ශාප වේවා

දහසක් මිනිසුන්ගේ මරණය
ඇති කලේ නුඹය....
ලේ කඳුල තුලින් මහ පොළොව
තෙත් කලේ නුඹය.....
දයාබර වූ මිනිස් කම
දෙපයට දූවිලි කල ඔබ ඝාතනයේ
එක්තරා සාමාජිකයෙකි....
සද කල් මම නුඹට වෛර කරමි.
මිය යන්නේ ද අපය
සටන් කරන්නේ ද අපය
බේද වන්නේ ද අපය
සිනාසෙන්නේ ඔබය...සිත්පිත් නැති
මරණය ලහා කරන
කුරිරු අමනුෂ්‍යවාදී පිරිසක් බවට පත්
කරති...
ධෛර්යවන්ත වූ යුද්ධය ඔබ සැරිසරන්නේ
අප බිලිගැනීමට ද?
සදකාලයෙන් සාදකාලයට අපි නටඹුන්
වන විට
ඔබ නිරන්තර වනු ඇත...
සාමයේ පරවියෝ නිශාචර
ලොව වටා සිසාරා
බෙදපන් සාමයක් මිනිසුන්ට....

සෙ/301384
සාසෙ රාජපක්ෂ ආර්ඩීඑස්
"බී" කණ්ඩායම 7 ශ්‍රීලපාහ

# දෛවයේ කුණාටුව



හිරු සැහැවී ගොන්මන් කලූවර කඩා වැටුණි. සුපුරුදු පරිදි මා පියනැගුවේ ආරක්ෂක මුරකුටිය තුලටයි. ආරක්ෂක මුරකුටියේ කව්ලූවෙන් එපිට බැලූ මා හට දර්ශණය වූයේ කුරිරු යුද්ධයේ ප්‍රතිවිපාකයි. අඳුරු වළාවන් අතරින් නැගී ආ සඳ කිරණ මුළු මහත් පරිසරය පුරාම බැබලෙයි. ආරක්ෂක මුර කුටියේ කවුළුවෙන් දෙනෙත් යොමා සිටි මා හට දුක්බර අතීතයක වැළලූන මතකයක් අවධි වූයේ මා හට නොදැනුවත්මය. එම දුක්බර අතීතයයි මෙය.

හිරු පායා මල් පිපුනේ ය. සියතුන්ගේ ගී හඬින් නැවුම් ප්‍රබෝධයක් ඇති කළේ ය. අරුණෝදයේ පුරුදු සැනින් නැගිට ගත් මා යන්නට පිය නැගුවේ පාසල වෙතට ය. කාලය කෙමෙන්, කෙමෙන් ගෙවී ගොස් ය. එවකට මා ඉගෙනුම ලැබුවේ 3 වන ශ්‍රේණියේ ය. මා ඉගෙනුම ලැබූ පාසලේ ගොඩනැගිලි තිබුණේ කිහිපයක් පමණි. එම නිසා දහවන ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලැබීමටහැකියාවක් තිබුණි. මගේ පවුලට හිටියේ මවත්, පියාත්, නංගීත් පමණි. තාත්තා වැඩ කළේ 'සයිමන් මුදලාලිගේ' ගල් වැඩපලේ ය. දෙමව්පියන් දෙදෙනාගේ විවාහය කාගේත් අකමැත්ත මත සිදු වී තිබුණු බැවින් නන්නා හඳුනනා වෙනත් ප්‍රදේශයකට පදිංචිව ගොස් තිබුණි. නෑදෑ හිතවතුන් පිළිබඳ කිසිත් තොරතුරක් නොදත් මා බාල අවධියේ සිටියේ ය. එක්තරා දවසක මගේ පියා සයිමන් මුදලාලිගේ ගල් වැඩපළෙහි ගල් වෙඩිල්ලකට අසුවී සදහටම නෙත් පියා ගත්තේ ය. ගමේ අසල්වැසියන් මැදිහත්වී තාත්තාගේ අවසාන කටයුතු නිමා කර දැමීය. ඉන්පසු මමයි, අම්මායි, නංගීයි මේ ලෝකේ තනිවුවාසේ මට දැනිණ. කටුපොත කියන ගමේ කඳු බෑවුම් මත කටුමැටි ගෙයක සාද ගෙන ජීවත් වූ අපට අතහිත දීමට තරම් කෙනෙක් හිටියේ නැහැ.

අම්මාගේ නෙත් කඳුලින් පිරිතිබුණි. පුංචි නංගියා බඩගිනිවෙලා කෑගැසුවේය. තාත්තාගෙන් ඉතිරිව තිබූ මුදල් කිහිපයක් තිබී අම්මාටයි, නංගියාටයි සයිමන් මුදලාලිගේ කඩෙන් පාන්පෙති කීපයක් ගෙන දුන්නේ ය. අම්මාගේ කණේ තිබූ කරාබු දෙක විකුණා තාත්තාගේ සොහොන් කොත අපේ නිවසට මඳක් පිටුපසින් සාදන ලදි. මගේ පාසල් කාලය අඩාල වී තිබූ නිසා අම්මාගේ දැඩි බලකිරීම මත නැවතත් මා පාසල් ගියේ ය. අධ්‍යාපනයට අවශ්‍ය කිසිම දෙයක් මා හට නොතිබුණි. තිබුණේ පස්ස ඉරී ගිය 'කොට කලිසම්' යුගලක් සහ එක් මිසයක් පමණි. නිතරම අම්මාගේ දෑත හුරු වී තිබුණේ කුලී වැඩවලට ය. කුලී වැඩවලින් යම්තම් බඩ වියත රැකගත් අපි සයිමන් මුදලාලිගේ කඩයට 'කඩය්පම්' තම්බා විකුණා අපි එදිනෙද වේල පිරිමහා ගත්තෙමි. තාත්තා නැති අඩුව මවගේ සෙනෙහෙසින් මැකී ගොස් තිබුණි. මම පාසල් ගොස් පැමිණි වහාම අම්මාට උදව් කිරීමට අමතක නොකලෙමි. මා හට සෙල්ලම් කිරීමට යහලුවන් සිටියේ නැත. මට සිටියේ මගේම පුංචි නංගියා පමණි. කටුමැටි වලින් සෑදුනු අපේ නිවසේ පුංචි කාමර දෙකක් විය. ඉන් එක කාමරයක අම්මයි නංගියි සිටිය අතර මා පමණක් අනෙක් කාමරයේ සිටියේ ය.

තාත්තාගේ කැඩී ගිය බුරු ඇඳ මත නිදා සිටි මා හට පෙනුනේ වියළී දිරාගිය පොල් අතු අතරින් ගේ ඇතුලට වැටෙන 'සඳේ' ආලෝකයයි. තාත්තාගේ අභාවයත් සමගම අපේ පුංචි නිවත් අභාවයට ගොස් ඇති බව මට එතුලින් අවබෝධ විය. දිග සුසුමක් පිට වූයේ මා හට සිත සැහැල්ලු වෙන පරිද්දෙනි. කිසිදු කාලගුණ විපර්යාසයක් සැදෑ කාලයේ තිබුණේ නැත. එහෙත් රෑ දෙගෙඩ හරියාමේ ඇසුණු ශබ්දයකින් මා තිගැස්සී අවදි විය. මිදුලේ තිබූ මී අඹ ගහ වැටී තිබෙන අයුරු ජනේලයෙන් එපිට බැලූ මා හට විදුලි ආලෝකයෙන් දිස් විය. ඒ සමගම වහලේ පොල් අතු කිහිපයක් ගැලවී සුළගේ පා වෙන අයුරු ගෙතුළට වැටෙන වැහිපොද අතරින් මා තේරුම් ගතිමි. මහා අනෝරා වැස්සක් ඇද හැලෙනවා සමගම අම්මාගේ කටහඬ අවදිවන අයරු මට ඇසුණේ ය. සීතලට අඩන පුංචි නංගියා තුරුලට ගත් අම්මා කාමයේ නොතෙමෙන ස්ථානයක වාඩි විය. දැල්වී තිබූ 'කුප්පි ලාම්පුව' නිවී ගොස් තිබුණි. ගේ ඇතුළත නොතෙමෙන තැනක් නැතුවා සේ ය.මා නිද සිටි බුරු ඇඳ හකුලුවා පසෙක තබා ඉනේ දවටා තිබූ 'සරම් කඩමල්ල' පොරවා ගත්තෙමි. විටින් විට ඇසෙන පුංචි නංගියාගේ වේදනා බරිත කඩ හඬ සුළගේ පා විය. හමා යන සුළං රැළි අතරෙන් වැටෙන වැහි බිඳු අතරෙන් මා හැඳ සිටි සරම් කඩමල්ල තෙත් වී යන අයුරු මට හැඟී ගියේ ය. රිදී රේඛා අතරෙත් අහස්කුස පුරා විහිදෙන ආලෝකයත් සමගම මහා හෙණ හඬින් කන් දෙපලූවන්නාසේ මට දැනුනෙමි. කඳු මුදුනේ දියබත්වෙමින් පැවති ගල්කුලක් විදුලි වේගයෙන් පෙරලී අපේ පුංචි නිවසේ අඩක් හකුලා මහා විලාප හඬත් සමගම පහලට පෙරලී ගියේ. කටු මැටි බිත්තිය අතර හිරවී සිටි මා අමාරුවෙන් නැගිට ගත්තෙමි. මොහොතක් ගල්ගැසී සිටි මාගේ සිරුර උණුසුම් වී ගියේ ය. 'අනේ දෙවියනේ' මාගේ අම්මගෙයි නංගියාගෙයි අවසන් සුසුම් පොදක් සමගම ඒ හද සසල කරවන සෝචනීය විලාපය හමායන සුළං රැලි ඔස්සේ මහා වැස්සට මුසු විය. මුළු

ලෝකයම මගේ ඇහමත කඩා වැටෙනාසේ මට දැණිනෙ. සැණකින් දුවගත් මා කටුමැටි බිත්තියට යට වී ඇති අම්මාගෙයි නංගියාගෙයි නිසල සිරුර වැටී ඇති කටු මැටි බිත්තිය ඉවත් කිරීමට උත්සාහ ගත්තෙමි. එය නිශ්ඵල වී ගිය බැවින් මට කළ හැකි එකම දෙය වී තිබුණේ හැඬීම පමණකි.

අම්මාගෙයි, නංගියාගෙයි නිසල දේහය අභියස මුළු රැයක් පුරා හැඬුවෙමි. අපේ පිහිටට කිසිවෙක් ලඟපාත සිටියේ නැ. කඩා හැලෙන ධාරාණිපාත වර්ෂාව නිසා මගේ ශෝකාලපය කිසිවෙකුට නො ඇසෙන්න ඇති. සේදී යන කටුමැටි බිත්තියේ නටබුන් අතරින් කටුමැටි සේදී සේදී වතුරට මුසුවී ගියේ පාඩම් පොත් පිටු වතුරේ එහේ මෙහේ පාවී ගියේ ගලන උණුසුම් කඳුළු කැට වැහි පොදට මුසුවුනේ ය. තාත්තා නැති අඩුව මකාලවූ අම්මේ, ඔබේ නිර්මල සෙනෙහයේ අද මා දවන කඳුළු ගඟක් වෙලා. ඔබලා සියලු දෙනාම මා අඳුරු ලෝකෙක තනිකර සඳහටම දෙනෙත් පියාගෙන දෛවය නම් කුනාටුවට මම අසුවුනෙමි. ඉතින් අම්මේ ඔබේ එකම පුතුට උරුම වූ දේ කුමක් ද?

තිස් තුන් කෝටියක් වැඩ සිටින ලෝකයේ මගේ දුක නොපෙනුනේ ඇයි ද? අම්මේ නුඹ නැති ලෝකයේ ඉර සඳ පවා අඳුරුයි. ඉතිං මා කෙසේ සැනසෙම් ද. ශෝකින් ගිනිගත් සිතුවිලි මත මා නිහඬ වී ගියේ ය. යළිඳු දවසක් උදා වූ විට මම සිටියේ රෝහලක් තුළය. රෝහලෙන් නික්ම වුණ මා පැමිණියේ නිවස සොයාගෙන ය. අම්මගෙයි නංගියාගෙයි අවසාන වැඩ කටයුතු නිමා කර තිබූ අතර ගංවතුරින් උත්හිටි තැන් අභිමි වී ඇති අයුරු අවට පරිසරය තුලින් පැහැදිලි විය. මගේ පුංචි නිවස තිබූ ස්ථානයට ගිය මාහට දෙනෙතින් කඳුලු කැට කඩා හැලෙන්නට විය. ගෙට මඳක් පිටුපසින් තබූ තාත්තාගේ සොහොන් කොතට හෙණ ගසා කැඩී බිඳී ගිය අයුරු දැක මගේ සිත දහදියෙන් තෙත් වී ගියේ ය. මේ තරම් දේවල් දැක ගැනීමට මම මහා පව්කාරයෙක් වූයේ ඇයි ද? මෙම දේවල් දැකීමට වඩා හොඳයි මගේ නෙත් නොපෙනී තිබුණා නම් එම දර්ශණය දිහා වැඩි වේලාවක් බලා සිටීමට මට හැකියාවක් නොතිබුණි. යළිඳු ආපසු හැරුණු මා පිය නැගුවේ සුසාන භූමිය කරා ය. වේලී ගිය ගොක් කොළ අතර ලෙලදෙන සුදු කොඩි දැක වාවාගත නොහැකි ඉකි බිඳීමත් සමගම මම ඒ සෙට දිව ගියෙමි. එහෙත් මා හට අවසාන වශයෙන් අම්මාගේ සහ නංගියාගේ දේහය බැලීමට 'පිං' කර තිබුනේ නැ. වැළලී ගිය සිරු මත දමා ඇති බස් මිටක් සිපගත් මා හවතේ ඇති ශෝකය කඳුළු බිඳු අතරින් නැගී ආවේය. ලේ කිරිකර පොවා සෙනෙහසින් තුරුලේ හැදූ මා සැනසී සිටින්නේ කාගේ කුරුලේ ද, කඳුලු විල් තොරක ඔබ නොපනී ගිය ද ඔබ තුරුලේ මතු ආත්මයකවත් සද සැනසෙමි. එක වදනකින් හෝ මා සනසා ලන්න අම්මේ. මගේ දුක සැප විමසන්නේ කවුරුන්ද මතු උපදින ආත්මයක් ආත්මයක් පාසා මගේම මව් වී ඔබ ඉපදෙන්න.....

ඉකිබිඳීමත් සමගම පරිසරය පුරා දැඩි පාලුවක් පැතිරී ගොස් තිබුණි. අඩසඳ පායා ආවේය. සියතුන්ගේ ගී මැකී ගියේ ය. අඳුර කෙමෙන්, කෙමෙන් ළං විය. අම්මාගෙයි, නංගියාගෙයි සොහොන් කොත් අභියස අවසාන පහන් කිහිපය දැල් වූ මා අවුල් මනසකින් යුතුව අඩ අඳුරේම අපැහැදිලි අඩිපාර ඔස්සේ ගමන් කළෙමි. හරි හමන් අරමුණක් නැති මාවතක ගමන් ගත් මා ලඟා වූයේ සයිමන් මුදලාලිගේ කඩය අසලටයි. සයිමන් මුදලාලිගේ නෙත ගැටුනු මා කිසිදු හැඟීම්බර වචනයකින් අමතනවා ඇසුනෙමි. සයිමන් මුදලාලිගේ බල කිරීම මත යාමට තැනක් නැති නිසාත් මම එහේ නතර වුනෙමි. ඉන්පසු කඩේ වැඩ සහ වත්තේ පිටියේ සැම වැඩක්ම මගේ දැතින්ම නිම වුනෙමි. ගුරුපාර දිගේ පාසල් යන ළමයින් කිහිප දෙනෙකු දුටු මා හට සතුටක් මෙන්ම දුකක් ද ඇති විය. නොයෙකුත් ඇණුම් බැණුම් අසා මා දහදිය හෙලූ මා එක් දිනක් පාසල් යාමට අවසර ඉල්ලා ගත්තෙමි. පාසලේ දහවන වසර දක්වා ඉගෙනුම ලැබූ මා සයිමන් මුදලාලිගේ ලොකු පුතා විසින් කර ඇති මුදල් වංචාවක් නිසා කඩෙන් දොට්ට බැසීමට මා හට සිදු විය. ඉන් පසු කිසිත් කර කියා ගැනීමට නොහැකිව සිටි මා ඔවුන්ගෙන් සමුගෙන 'රටත් ජාතියත්' වෙනුවෙන් යුධ හමුදවට බැඳුනෙමි......

සෙ/00281
**සාසෙ රණවීර දිසානායක ඩීඑම්**
**9 ශ්‍රීලපාහ. ඩී කණ්ඩායම**
**මයිලඩී - පලාලි**

# සමුගත් කුමරියේ

ජීවිතය ඇති තුරා
ඔබ මගේ යැයි කියා
පැතුමුත් සැම දිනේ
ඒ පැතුම් සුන්වෙලා
ආදරේ වේදනා හදවතට ළං වෙලා
නොසිතූ ලෙස කිසි දිනෙක අද මාව
තනිවෙලා
ආදරයගැන සිතා
හෙළු කඳුළු මා එද
ඔබේ හද පිළිගන්න කඳුළු පලසක්
වෙලා
ඒ මගේ පා තගත ඔබ යනවා මා
බලා
නමුත් නැගූ වෛරයෙන්
බලනු මම ඔබ දිමා....

**සෙ/E00177 සැරයන් උපාලි ගුණවර්ධන කේ**
**9 ශ්‍රීලපාහ. ඒ කණ්ඩායම පලාලි**

# වඩින්න සුදු පරෙවියෝ

යෞවන වසන්තයේ
චමත්කාරයට පිටුපා
තුරුළු කරගත් ගිනි අවිය
පාළුවට එරෙහි වෙයි
කල් වැටෙන් එහා ලොව
ගිලගන්නට වෛර දරන
මළවුන්ගේ ලෝකයෙන්
මිදෙන්නට
කැප කලෙමි හදු යෞවනය

දෙමාපිය සොයුරියන්
දයාබර පෙම්වතිය
ඔවුන් හා එක්වන්න
කවදද ඉඩදෙන්නේ

වෙඩි හඩින් මුසපත් වූ
ගිම්හාන කටුකත්වය තුරන්කොට
දෙනුවන් පිහාලන
නිල්වන් ගුවන් ගැබේ
පියාඹනු සුදු පරෙවියෝ....//

**සෙ/303100 ලාකෝ ජයධීර ඩීඑස්**
**1 ශ්‍රීලපාහ ආධාරක කණ්ඩායම,**
**යුදහමුද කඳවුර , චාවකච්චේරිය**
**යාපනය**

# අනේ මෙහෙම සමාජයක්....

අඹ අතර ඉදුණු අඹ ඇත. අමු අඹත් ඇත. ඇතැම් අඹ ඉදුනු අඹ මෙන්ම කහ පාටය. නමුත් ඉදී නැත. අමුය ඒ අතර කහ පාට නැති ඉදුණු බවක් නොපෙනෙන අඹ ඇත. අමු අඹ වගේම පෙනුනත් හොඳට ඉදී ඇත. හොඳ ලස්සන සුවඳ ඉදුනු අඹ ඇත. නමුත් ඇතුල කුණුවෙලා ය. පණුවන් ගොඩකි. නොදැනුවත් කමින් හෝ කෑවොත් මහ විපතකි. ඒ අතර කෑමට සුදුසු හොඳ අඹත් ඇත. මේ අනුව හොඳින් විමසා බලා අඹ තෝරා බේරා ගත යුතු බව පෙනීයයි.

අඹ තේරීම තරමක් අපහසු වුවත් එය එතරම් බැරෑරුම් කාර්යයක් නොවේ. අඹ තේරීමටත් වඩා විමසිල්ලෙන් කළ යුතු අපහසුම කාර්යයක් ඇත. එනම් සමාජය තේරුම් ගැනීමයි. සමාජය යනු පුද්ගලයන් සමූහයකින් සැදුම්ලත් ආයතනයකි. එහෙත් සමාජය විවිධය. විෂමය, සංකීර්ණය. මේ නිසා සමාජය තේරුම් ගැනීම අපහසු කාර්යයක් බව පැහැදිලි වෙයි.

ඇතැමුන් ගමනින් ශාන්තය, කථා බහත් ශාන්තය, වඩා පැහැපත් සංවරශීලී බවකින් යුක්තය.

තවත් ඇතැමුන් කරන කථා බහ දේශණවලට සවන් දීමෙන් එතරම් උගතුන්, බුද්ධිමතුන් ගුණවතුන් තවත් මේ මිහිපිට සොයා ගැනීමට නොහැකි තරම් බව පෙනීයයි. ඒ තරමට ව්‍යක්තය. විනීතය විශාරදය, බුද්ධිමත් ය. මෙබඳු කර්ණ රසායන අයුරින් වදරන දේශණයන්ගේ ක්‍රියාවන් ගැන බැලූ කල එම උපදෙස් බලුකනේ බැඳපු මීයකට නොදෙවෙනි බව පෙනීයයි. දෙසන දේ ඔවුන් ළඟ ගෑවිලා වත් නෑ. ඔවුන්ගේ ක්‍රියාවන් දෙස බැලීමෙන් නයිපොලොන් වැනි කිරිසන්ගත සර්පයන් ඔවුන්ට වඩා ශ්‍රේෂ්ඨ බව හැඟෙයි. කිසියම් සුලු ගුණයක් හෝ එම සතුන් තුළ දැකිය හැකිය. කථාවෙන් අගතැන් පත් නොවූවත් හැසිරීමෙන් එය දැකිය හැකිය.

තවත් අයෙක් කිසිම ඝෝෂාවක් නෑ. පුරසාරම් නැත. නමුත් සැබෑම දක්ෂයෝය. ගුණ ධර්ම වලින් අනූනය, ශීලාචාර සිරිත් විරිත් වලින් පෝෂිතය.

ඇතැමෙක් කරන ක්‍රියාවන් ගැන කතා කිරීම පවා ලැජ්ජා සහගතය. පිළිකුල් ය, හිරිකිතය. පරිත්‍යාගයේ අනුහස් වදරති. තඹ ශතයක දෙයක් දුගියෙකුට නොදෙති ලැබෙන්නේ නම් රජ බොජුන් ද පිළිගනිති. නොලැබෙන දිනට කැඳ ටිකක්වත් සාද ගැනීමට මසුරු වෙති. සුලු ලාභයකින් පවා සිහිවිකල් වන මොවුන් ලවා ඕනෑම පහත් ක්‍රියාවක් වුව ද කර ගැනීම එතරම් අපහසු කරුණක් නොවේ. නමුත් මහා තේජස් වන්තයෝ ය.

මෙබඳු විවිධ, විෂම සමාජයක වාසය කිරීම සහ පුද්ගලයන් දැන හැඳින ගැනීම අඹ තේරීම තරම් ලෙහෙසි පහසු කාර්යයක් නොවන බව වැටහෙනු ඇත. එබැවින් මිනිසා තේරුම් ගැනීම ප්‍රථමයෙන් කළ යුතු වැදගත් කාර්යයක් බව පෙනී යයි.


**සෙ/1665 බනි II චන්ද්‍රදාස ආර්ආර්එම්**

10 ශ්‍රීලපාහ

'සී' කණ්ඩායම, මාදගල් - පලාලි


# මවගේ පැතුම

ආදරණීය පුතේ.....

නුඹ සෙබලෙක් වෙනවා දකින්න නුඹේ අම්මා කොතරම් ආශාවෙන් ද බලා සිටියේ. නුඹට හමුදාවේ සෙබලෙක් හැටියට බඳවා ගැනීමේ ලිපිය ආපු දිනයේ නුඹට එම ලිපිය නොදී සඟව ගත්තේ මව් සෙනෙහස නිසා පසුව නුඹ අප දෙන්නටම හොර රහසේම හමුදාවට ගිය බව නුඹ විසින් අප වෙත එවන ලද ලිපියේ සඳහන්ව තිබුණා.

එදා නුඹගේ ආදරණීය අම්මා කවදාවත් නැති විදියට නුඹගැන දුක්වුනා. වේදනාවෙන් කඳුළු පුරවා ඇඬුවා. මටත් නුඹ ගැන දුක නැතිව නොවෙයි මගේ පුතේ මටත් නුඹගේ අඩුව නුඹගේ අම්මට වගේම දැනෙනව. මම ඒ සේරම යටපත් කරගෙන නුඹේ අම්මව සැනසුවා නුඹ අපට වීරයෙක් බව කියලා. නුඹගෙ අම්මගේ හිත සති මාස ගෙවිලා යද්දී නුඹ එඩිතරයි කියල හිත හද ගත්තා. නුඹ වෙනුවෙන් නුඹේ අම්මා හැමදම පන්සලට ගිහින් නුඹටත් රට රකින අනිකුත් සෙබල දරුවන්ටත් බෝධි පූජා තියල සෙත් පැතුවා. කවදවත් දුකක් කරදරයක් වෙන්න එපා කියල ඉතිං මගේ රත්තරන් පුතේ මම කොහොම ලියලා එවන්න ද මේ පියාගේ අසරණ බව උඹේ අම්මා හැමදම බලන් හිටියේ නුඹ වීර සෙබලෙක් වෙලා හමුද ඇඳුම ඇඳන් ඉන්නවා දකින්න. ඒත් පුතේ නුඹේ අම්මා එච්චරටම වාසනාවන්ත නෑ. මම දන්නවා මේ ලිපිය නුඹට ලැබෙන විට නුඹ උදර රණ විරුවෙක් කියල නුඹේ විසිර යාමේ උත්සවය බලන්නවත් අපි පිං කරලා නැහැ මගේ පුතේ නුඹගේ අම්මගේ මලගම යෙදිලා තිබුනේ නුඹ රණවිරුවෙක් ලෙසට විසිර යනදිනයේ. මම දන්නවා නුඹට මගේත් අම්මගෙත් අඩුව හොඳටම දැනෙන්න ඇති කියලා. මේ ලිපිය වුනත් උඹට ලැබෙන කොට නුඹගේ ආදරණීය අම්මා අපි දෙන්නගෙන්ම සදහටම වෙන්වෙලා ඉවරයි. මම දන්නවා අම්මගේ වෙන්වීම නුඹට දරාගන්න බැහැ කියලා. නුඹට මේ ලිපිය ලැබුණු ගමන් ඉක්මනට නිවාඩුවක් අරන් ගෙදර වරෙන්. නුඹ එනතෙක් නුඹේ පියා කඳුළු පිරි දෙනෙතින් පෙරමග බලා හිඳින්නම්.

මේ නුඹගේ ආදරණීය පියා,


**ලාකෝ මහින්ද කේ**

1 ශ්‍රීලපාහ-ආධාරක කණ්ඩායම

යුහ කඳවුර, වාවකච්චේරිය, යාපනය.


# අහිංසක සිතිවිල්ලක්

ක්ෂිතිජය ඉමට නෙත් යොමුකොට
බලා හිඳිමි ගණ අඳුරේ
නැත ජායා දෙනෙතෙ ඇඳි
ඔබෙ රුව හැර ඇත් අයෙකුගෙ....
මා එනද දෙනෙත සලා
ඉකි ගසමින් ඔබ හැඬුවා
මට සිහිවෙයි කළුවර රෑ.....
නොහඬන් මෙග පෙම්වතියේ
කියා මට ද කිව නොහැකිය
මා ද ආවෙ ඉකි ගසමින්

නෙතින් කඳුළු සලන් නැතිව...
ගිනි අවියේ බර උසුලා
පතමි දිවා රෑය පුරාම
මේ යුද්ධය නිමා වෙන්න
දහසක් පැතුමන්....
එදිනට මගේ පෙම්වතියේ
ඔබගේ මුවහ සිනා රැල්ල
දැක ගන්නට හැකි වනු ඇත.
එයයි මගේ පැතුම....


තේමාව සෙ/00302

**ලා/කෝ ශාන්ත කුමාර එස්ජී**

9 ශ්‍රීලපාහ මූලස්ථානය, ඩී කණ්ඩායම - 29 බසේමුල ඉවනායි - පලාලි

# යුධ බිමට හසුනක්

මගේ පුංචි විරුවණේ. තල්වැට අද්දර සිට රුපුන් නසන්නට නුඹලා දරණ වෙර මම දනිමි. ගිණි අවිය සුරත දරා නිදි මැරුවා ඔබ: දිවාරය සතුරන් නසන්නට. නුඹලා පසුබට වුනේ නැහැ සතුරන් ඉදිරිපිට, මුලු ශක්තිය, යෙදුවා ගොඩ නගන්නට නිවහල් රටක් ජාතියක්.

හිරු පායන මද්දහනේ, සීතල සුළං අත වදින හිමිදිරියේත් සමහරු යහන්වල නිදි සුවය ලබද්දී, නුඹලා තල් වැට අද්දර බංකර තුළ රට වෙනුවෙන් අවදියෙන්. දකුණේ සැනකෙළි පවත්වද්දී, නුඹලා උතුරේ ජීවිතයත් මරණයත් අතර සටනක. ඔය හිත් වලට දැනෙන දුක, වේදනාව, තනිකම, පාළුව මොන තරම් ඇති ද. මගේ පුංචිම පුංචි රණවිරුවණේ නුඹලා විදින දුක් ගැහැට මමදනිමි. නුඹලාගේ ජීවිත අවිනිශ්චිත බව දනිමි. යුධ පිටියේ තනි වුණු ඔය හිත් වලට මම ධෛර්ය මම පතනන්නම්.

සතුරු වෙඩි පහරින් අපේ සොයුරන් බිම වැටෙද්දී මිතුරන් වෙනුවෙන් ඔය හිත් මොන තරම් දැවෙන්න ඇතිද, සතුරා ඉදිරියේ දී නපුරු උනත්, සටන්කාමී උනත්, මිනිසුන් හිතන තරම් එය හිත් නපුරු නැති බව මම දන්නව. දිනු දේශයේ රණ විරුවණේ. නුඹලායි ජාතියේ පහන් ටැඹ. පායන්න හිරු සඳු වී දිවා රය, එළිය කරන්න රණ පිටිය.

සොයුරණි, නුඹලා වෙනුවෙන් අද රටක් ජාතියක් ආඩම්බරයෙන් ආදරයෙන් සිහිපත් කරනව. කිසි විටෙකවත් පසුබට නොවන්න, අධෛර්ය නොවන්න, සතුරා ඉදිරියේ දී ත්‍රස්තවාදීන්ට ශාප කරන තරමට අපි නුඹලාට ආශිර්වාද කරමු. මගේ විරුවණේ නුඹලාට ජය නියතයි. ශක්තිය, ධෛර්ය, බුදු සම්දුන්ගේ පිහිට අපි ප්‍රාර්ථනය කරමු.

මේ පුංචි ලංකාවේ නිවහල් බව තහවුරු කරමු. මතු දිනයක රන් අකුරින් ඉතිහාසයේ ලියවෙන්නේ නුඹලා ගැනයි. විරුවණේ. මගේ පුංචි රණ විරුවණේ, එක්වෙමු, ජය ගනිමු අපි..

සෙ/304967 සාසෙ සමරවීර ඒපීආර්එම්
8 ශ්‍රීලපාහ. ඒ කණ්ඩායම

# සෙබළකුගේ සටහන්

ජාතියේ ජීව නාලිය තරුණ පරපුරය කීවොත් ඉතාම නිවැරදි ය. ගෙවී ගිය දස වසර තුළ සිය දහස් ගණන් ජීවිත බිලි ගනිමින් හමුදාවේ මෙන්ම සිවිල් ජනතාව ද මරණයටමෙන්ම අංගවිකලත්වයට පත් කරවූ අපේ ලක්බිමේ එක් කොටසක පවතින කුරිරු යුද්ධය දෙස දැන්වත් ඇස් ඇර බැලිය යුතු යි.

උතුරේ හෝ දකුණේ වේවා වෙඩි වර්ෂා තුළ විනාශ වෙන්නේ අපේ රටේ අනාගතය නොවේ ද? යුද්ධය නතර කර සිංහ දෙමළ මිත්‍රත්වයක් නොව එකම භූමියක් තුළ වෙසෙන ලෙසින් සැදුණු ජාතික මිත්‍රත්වය හා සාමාජිකත්වය පිණිස කටයුතු කිරීමට දැන්වත් කාලය එළැඹී ඇත. අද උතුරේ සටන් වදින ලක් පුතුන් යුධ පෙරමුණේ ද ලබන දුක්කම් කටොලු අමතක නොවිය යුතු යි. උතුරු නැගෙනහිර හැර රටේ අනෙක් ප්‍රදේශවල විවේකීව කාලය ගතකරන ඔබලා වෙනුවෙන් තම ජීවිතය පූජා කරන කල සෙබළකු වෙනුවෙන් ඔබලා සද ණය ගැති වේ.

දහස් ගණන් යුද්ධයේ සාපයෙන් මියැදෙද්දී අපි අද යුධ බිමට යන්නේ ජාති ආලයෙන් පමණක් නොව, තමන්ට ද තම පවුල ද ජීවත් කරවීම සඳහා ජීවනෝපායක් වශයෙනි. සෙබලු වශයෙන් අපි සියල්ලෝම ලේමස් ඇට වලින් සමන්විත ය. එසේ නම් අපේ ජීවිත මිල කළ නොහැක. අපේ තරුණ ජීවිත විනාශ විය යුතු තැන සතුරා පෙනි පෙනී බංකර වලට වී තුවක්කු අල්ලාගෙන සිටින අපි ද ඔබලාගේම සොහොයුරෙකි. ඔබලාට මෙන්ම අපට ද ආදරය, සෙනෙහස, කරුණාව. ආශාව නිරන්තරයෙන් ම අවශ්‍ය වේ.

රැයක් පහන් වන තුරු නිදි මරා, මදුරු සංහාරයේ පහර කමින් විශාල දුෂ්කරතාවක යෙදෙන්නේ මාස ගණන් තම දෙමාපියන්, නෑ හිත මිතුරන් අඹු දරුවන්, පෙම්වතියන් නොබලා, කුසට නිසි අහරක් නොලබා යුද බිමේ ඉන්නේ කා වෙනුවෙන් ද, යුධ බිමේ කොතරම් යුධ බිය තිබුණ ද දෙසවන් පුපුරා යන වෙඩි හඬ දසත පැතරේය. අපි ඒ සියල්ල අමතක කොට තම රටට සාමය හා සෞභාග්‍ය උද වේවා කියා සමු ගනිමි.

රන් මලක් ලෙසදෙවි බමුන් - දෝතින් පිදූ මේ පින් බිමේ
පස් පිඩක් ගිලිහී නොයන්නට - රන් වැටක් ඇත සිව් කොනේ.

සෙ/303453
ලාකෝ රාජපක්ෂ ආර්පීකේ
8 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම

# යුධ බිමේ පෙරටම ඇදෙමු

මගේ පුංචි විරුවනේ තල් වැට අද්දර සිට රුපුන් නසන්නට දරන වෙර අපි දනිමු. ගිනි අවිය අත දරා නිදි මැරුවා දිවා රැය සතුරන් නසන්නට පසුබට උන්නේ නෑ. සතුරන් ඉදිරිපිට මුලු ශක්තියම යොදමු. ගොඩනගන්නටත් රටක් ජාතියක්.

ගිනි හිරුපායන මද්දහනෙත් එන සුළං රැළි අත වදින හිමිදිරියෙත් සමහරු යහන්වල නිදි සුවය ලබද්දී අප තල්වැට අද්දර බංකරයේ රට වෙනුවෙන් අවදියෙන්. දකුණේ සැනකෙළි පවත්වද්දී අප උතුරේ සතුරා සමග ජීවිතයත් මරණයත් අතර සටනක. අපේ හදවත් වලට දැනෙන දුක වේදනාව තනිකම කොතරම් ද මගේ දයාබර විරුවනේ අප විදින දුක් ගැහැට හොඳින් හඳුනමි. අපේ ජීවිත අවිනිශ්චිත බව අපි දනිමු. යුධ පිටියේ තනි වුන අපි ධෛර්ය වෙමු.

සතුරු වෙඩි පහරින් අපේ සොයුරන් බිම වැටෙද්දී මිතුරන් වෙනුවෙන් අප හිත් මොන තරම් උණුවේද, සතුරන් ඉදිරියේ නපුරු වුනත් සටන් කාමී වුනත් මිනිසුන් හිතන තරම් අපේ හිත් නපුරු නෑ. දිනු දේශයේ රණ විරුවනේ ජාතියේ පහන් ටැඹ අප සැමගේ ද. පායන හිරු සඳු සේ දිවාර ය එළිය කරමු රණපිටිය අප වෙනුවෙන් රටත් ජාතියත් ආඩම්බරයෙන් මගේ දයාබර සෙබලුනි. අපට ජය නියතයි. බුදු සම්දුගේ සරණ හා දෙවියන්ගේම ආශිර්වාදය අප නිරතුරුව ලැබෙනවා. අපි එක හඬින් සතුරට විරුද්ධව දේශයේ ජාතියේ නාමයෙන් සටන් කරමු. මේ පුංචි ශ්‍රී ලංකාවේ නිවහල් බව තහවුරු කරමු. මතු දින ඉතිහාසයේ රන් අකුරින් ලියවෙන්නේ වීර සෙබල සේනා ගැනයි.

මගේ දයාබර සෙබලුනේ එක් වෙමු ජයගමු අපි එක හඬින්.

සෙ/304967 සාසෙ සමරවීර ඒපීආර්එම්
8 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම

# හට පිරිස් පාලනය

අප යුධ හමුද කඳවුරක උදෑසන 0530 පැයට අවදි වී මුහුණ කට සෝද හට නිවස්න සුද්ධ කර උදෑසන තේ බීමෙන් අනතුරුව උදෑසන 0600 පැයට ශාරීරික අභ්‍යාස සඳහා පෙළ සෑදීමෙන් පසු අසනීප සෙනීන් දැනගෙන ශාරීරික අභ්‍යාස උපදේශක විසින් නිලධාරී තුමාට රපෝර්තු කරන අතර, ඊට පසු අසනීප අයවලුන් මුද හැර දවසේ කාර්යභාර කෝප්‍රල් හට හරදී ශාරීරික උපදේශක ශාරීරික අභ්‍යාස කරගෙන යයි.

අසනීප සෙනීන් දවසේ කාර්යභාර කෝප්‍රල් දවසේ කාර්යභාර සැරයන් වෙත රපෝර්තු කර දවසේ කාර්යභාර සැරයන් විසින් දවසේ කාර්යභාර නිළධාරී වෙත රපෝර්තු කර දවසේ කාර්යභාර සැරයන් විසින් වාහනයක් ලබා දී දවසේ කාර්යභාර කෝප්‍රල් සමග අසනීප වී සිටින සෙනීන් වෛද්‍ය පරීක්ෂණාගාරය වෙත ගෙන යාම සිදුවේ.

උදෑසන ශාරීරික අභ්‍යාස 0700 පැයට අවසන් වූ විට සෙනීන් උදෑසන 0700 පැයට උදෑසන ආහාර සඳහා භෝජනාගාර වෙත යැවීම, සෙනීන් උදෑසන ආහාරයෙන් පසු 0800 පැයට උදෑසන නම් ලකුණු කිරීමේ පෙරට්ටුව සඳහා පෙළ සෑදී විට කෝප්‍රල් පෙළ සැදූ සැරයන් වෙත රපෝර්තු කිරීමෙන් පසු සැරයන් විසින් කණ්ඩායම් සැරයන් මේජර් වෙත රපෝර්තු කිරීම, ඉන් අනතුරුව බනි II තුමා විසින් නාම ලේඛනය ලකුණු කර දවසේ කාර්යභාර කෝප්‍රල් හා දවසෙ කාර්යභාර සැරයන් විසින් දිවා මුරය සඳහා සෙනීන් යොදවා දවසේ කාර්යභාර නිළධාරී තුමා හට රපෝර්තු කර මුරපති භාරයෙන් මුරයන් යැවීම සිදු කෙරේ. ඉන් අනතුරුව නිලධාරී අණදෙන තුමාගේ අණපරිදි සෙනීන් පුහුණුවීම් කටයුතු වල යෙදවීම සිදුවේ. පෙළ අණදෙන්නන් විසින් තම පෙලෙහි සෙනීන්ගේ ප්‍රශ්ණ සොයා බලා බණ්ඩ භාර සැරයන් වෙත දන්වා නිළධාරී අණදෙන තුමා වෙත දන්වා සෙනීන්ගේ ප්‍රශ්ණ නිරාකරණය කර දීම වේ.

දවසේ පුහුණුවීම් කටයුතු අවසන් වී සෙනීන්ගේ අවි ආයුධ ශුද්ධ පවිත්‍ර කිරීම පෙළ අණදෙන්නන් හා බණ්ඩ භාර සැරයන් වරු සෙනීන් දැණුවත් කළ යුතු යි.

ප:ව: 1230 ට සෙබළුන් දිවා ආහාර සඳහා භෝජනාගාරය වෙත යැවූ විට දවසේ කාර්යභාර කෝප්‍රල් හා දවසේ කාර්යභාර සැරයන් දවසේ කාර්යභාර නිළධාරී තුමා සහ රෙජිමේන්තු පොලිසියේ රාජකාරිව සිටින කෝප්‍රල් වරයෙක් භෝජන ශාලාව තුළ රැඳිය යුතු යි. දිවා භෝජනයෙන් පසු ප:ව 1400 පැයට කණ්ඩායම් මූලස්ථානය ඉදිරිපිට පෙළ සැදිය යුතුයි. කණ්ඩායම් සැරයන් මේජර් විසින් ආයතන රාජකාරි සඳහා සෙනීන් පිටත්කර යවා හට නිවස්න හා කඳවුරු පිරිසිදු කිරීම සඳහා සෙනීන් යෙදවිය යුතු යි.

කඳවුරු රාත්‍රි මුරයන් පරීක්ෂා කළ යුතු යි. ප:ව: 1600 පැයට 1600 පැයට රාජකාරි සිටින සෙනීන්ට අමතරව ආයතන 1630 ට අවසන් වී සෙනීන් හට නිවස්න තුළ ගිය අතර, ඔවුන් නාගෙන ප:ව: 1800 පැයට මියගිය සෙනීන් සිහිකිරීමේ බියුගල් වාදයෙන් පසු කඳවුරේ සිටින සියළුම සෙබළුන් උපක්‍රමික සීරුවෙන් යෙදවිය යුතු යි. ප:ව: 1900 පැයට රාත්‍රි ආහාර සඳහා සෙබළුන් භෝජනාගාරය වෙත යැවිය යුතු යි.

රාත්‍රි ආහාර ගැනීමෙන් පසු ප:ව: 2100 පැයට සියළුම සෙනීන් හට නිවාසයේ රැඳිය යුතු යි. දවසේ කාර්යභාර කෝප්‍රල් විසින් රාත්‍රි නාම පෙරට්ටුව අරගෙන කණ්ඩායම් වල දවසේ කාර්යභාර කෝප්‍රල් සියළු දෙනා සහ රෙජිමේන්තු පොලිසියේ රාජකාරි සිටින කෝප්‍රල් මාණ්ඩලික පෙරට්ටුව සඳහා පෙළ සැදිය යුත යි. ප:ව: 2200 පැයට දවසේ කාර්යභාර සැරයන් විසින් මාණ්ඩලික පෙරට්ටුවේ සිදුවීම් දවසේ කාර්යභාර නිලධාරී තුමා වෙත රපෝර්තු කළ යුතු අතර, පොත් වල සඳහන් කළ යුතු යි. ඉන් අනතුරුව දවසේ හට පිරිස් පාලනය අවසන් වේ.

**සෙ/13949 සැරයන් සිල්වා බීඒආර්**
"ඒ" කණ්ඩායම 7 ශ්‍රීලපාහ

# මොන්සූන් ක්‍රියාන්විතය

4 ශ්‍රීලපාහ ස්වාධීන කණ්ඩායමක් වශයෙන් මඩකලපුව ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරියේ නියලී සිටින වකවානුවේ දී කදිරවේලි ප්‍රදේශයේ පාල්වේලි වෙරළ වෙත ගොඩ බසින ලද ත්‍රස්තවාදීන්ට එරෙහිව මෙම ක්‍රියාන්විතය දියත් කරන ලදී.

92.05.06 දින උදෑසන නි:අ: මේජර් එන් විතාන ශ්‍රීලපාහ (මියගිය) වාලච්චේන කඩදසි කම්හල් භූමියේ කඳවුරේ සේවයේ යෙදී සිටින අප කණ්ඩායමේ සියලුම සෙනීන් එක්රැස් කොට ක්‍රියාන්විතයට සහභාගී වීමට අවශ්‍ය වන හෙයින් අද දින කදිරවේලි කඳවුර වෙත ලඟා විය යුතු බව දැනුම් දෙන ලදී. එහිදී වැඩි දුරටත් උපදෙස් දීමට නියමිත බව කියා සිටි අතර, අප කණ්ඩායමේ සියලූම නිළධාරීන් සහ සෙසු නිළයින් දිවා ආහාරය සඳහා කදිරවේලි කඳවුර වෙත ලඟා වෙන ලදී.

දිවා ආහාරයෙන් පසු 2 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී ලුතිː කර්නල් එදිරිසූරිය, ශ්‍රීලපාහ මෙහෙයුම යටතේ අප කණ්ඩායමේ නි:අ: තුමා විසින් ක්‍රියාන්විතයට කදිරවේලි කඳවුරෙන් පිටත් වෙන ලදී.

අප කණ්ඩායම ගමන් කරන ලද්දේ වෙරුගල් පාරෙන් දකුණ පස කැලෑ තීරයේ ය. උපක්‍රමික ක්‍රම උපයෝගී කරගෙන ඉදිරියට ගමන් කරන අවස්ථාවේ සතුරාට නොදැනෙන්න සතුරා වෙත ළඟා වීමට අප සමත් විය. එහිදී ටි 56 වර්ගයේ අවියක් සමග එක් ත්‍රස්තවාදියෙක් අත් අඩංගුවට ගැනීමත් සමග ත්‍රස්තවාදීන් විසින් ප්‍රවාහනය කරන ලද බඩු තොගයක් අත්අඩංගුවට ගැනීමට අපට හැකි විය.

ක්‍රියාන්විතය නියමිත වූ ස්ථානය වෙත ළඟා වන විට 92.05.07 දින පෙ:ව: 9.30 ට පමණ ළඟා විය. එම ප්‍රදේශය මනා පරීක්ෂා කිරීමෙන් මද දුරක් පසු බැස දිවා ආහාරය රැ ගෙන නැවත කදිරවේලි කඳවුර වෙත ලඟා වීමට පිටත් වෙන ලදී. මෙහි දී අප කණ්ඩායම පළමුව ගමන් කරන ලද්දේ කදිරවේලි පාර දෙපස ඇති කැලෑ තීරයේ ය. සතුරාගෙන් ලබා ගත් බඩු ප්‍රවාහනය කිරීමට අවශ්‍ය හෙයින් අප කණ්ඩායමේ ට්‍රක් රථය එවන අතර එයට සැඟවී සිට සතුරා ප්‍රහාරයක් එල්ල කල අතර, එය මනාසේ මැඩලීමට අප කණ්ඩායම සමත් විය.

කොමතලාමඩු ප්‍රදේශය පසු කරමින් අප කණ්ඩායම ඉදිරියට ඇදෙනවිට පසුපස ආ කණ්ඩායම් වලට සතුරා රැකසිට ප්‍රහාරයක් දියත් කරන ලදී. අපගේ මිත්‍ර කණ්ඩායම් මුදවා ගැනීමේ පරම චේතනාව පෙර දැරී කරගෙන අප කණ්ඩායමේ නි:අ:තුමා ඇතුළුසියලුම නිළයින් විසින් සතුරාට පැති ප්‍රහාරයක් එල්ල කරන ලදී. මෙහි දී අප කණ්ඩායමේ නි:අ:තුමා ඇතුළු සෙනීන් 05 දෙනෙකු ජීවිතක්ෂයට පත් විය.

**සෙ/15278 සැරයන් නවරත්න පීජී**
"ඒ" කණ්ඩායම 7 ශ්‍රීලපාහ

# කළු ජූලියට බිලිවූ "පාබල විරුවෙක්"

196.07.04 වන දින යාපනය නගරයේ ස්ටැන්ලි පාර ජනතාවගෙන් පිරී ඉතිරී තරමක කලබලකාරී ස්වරූපයක් දක්නට ලැබිණි. එදින යාපනය නගරයේ ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථා කාර්යාලය විවෘත කිරීමට නියමිතව තිබිණි. මෙම අවස්ථාවට නිවාස ඉදිකිරීම් හා මහජන උපයෝගිතා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා ඇතුළු රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ යාපනය ප්‍රදේශය භාරව කටයුතු කල 512 බළසේනාවේ සේනාධිපති බ්‍රිගේඩියර් ඒඑස්සේකේ හමංගොඩ යූඑස්පි. පීඑස්සී ඇතුළු හමුද නිලධාරීන් යාපනයේ වෙසෙන සාමාන්‍ය වැසියන් විශාල පිරිසක් සහභාගි විය. හරියටම දහවල් 1250 පැයට පමණ මරාගෙන මැරෙන කොටි කාන්තාවක් විසින් තම ඇහෙහි බැඳගෙන තිබූ බෝම්බයක් පුපුරා හැරීමෙන් බළසේනාධිපති ඇතුළු 21 දෙනෙකුට මරු කැඳවමින් අමාත්‍ය තුමා ඇතුළු 50 කට අධික පිරිසකට තුවාල සිදු කරමින් ඛේදජනක මිනිස් ඝාතනයක් සිදු කරන ලදී. සිදුවන්නට තිබූ තවත් ජීවිත හානි සහ දේපොල විනාශ වීම් වලක්වාලමින් ජීවිතය දෙවැනි කොට තම වගකීම කාර්‍යය මැනවින් ඉටුකළ විරුවෙක් ශ්‍රී ලංකා පාබල හමුදවට අහිමි විය. ඔහු 7 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදවේ සේවය කළ සෙ/15296 සාසෙ සෙනවිරත්න ඩබ් අයි එම් මේ අභීත රණවිරුවා ගැන සටහනක් තැබීම මතු හමුද පරපුරට ආදර්ශයක් සහ මියගිය විරුවාට කෙරෙන උපහාරයක් වනවාට සැකයක් නැත.

1969.05.03 වන දින ජන්මය ලද මේ රණවිරුවා කොබෙයිගනේ, කපුගම පදිංචි ඩබ්. අයි. එම් ගුණවර්ධන මහතාගේ සහ ආර්, ඒ පුංචිහාමි මහත්මියගේ දයාබර පුතුණුවන් ය. සොයුරු, සොයුරියන් 06 දෙනෙකුගෙන් සමන්විත කැදැල්ලක හැදුනු වැඩුණු මොහු අපොස (සාපෙ) දක්වා කොබෙයිගනේ මැදි මහ විදුහලෙන් සිප් සතර හදරන ලදි. ඉගෙනුමට මෙන්ම ක්‍රීඩාවට ද මනා දක්ෂතාවයක් ඇති මොහු පාසැලේ අත්පන්දු කණ්ඩායමේ කැපී පෙනුන ක්‍රීඩකයෙකි. ආචාර්ය මණ්ඩලයේ සහෝදර සිදු සිසුවියන්ගේ සිත දිනා ගනිමින් අධ්‍යාපනය හදරන ලද මේ විරුවා පාසැලේ දීප්තිමත් ශිෂ්‍යයෙකි. මේ වන විට රට තුල පැන නැගී තිබුණ බෙදුම්වාදී ත්‍රස්තවාදය නිසා හමුද සේවය රටට අත්‍යවශ්‍යය විය. තමාගේ සේවය රටට අවශ්‍ය මොහොතක එනම් 1987.08.05 වන දින ඩබ් අයි එම් සෙනෙවිරත්න ආධුනික සෙබළෙකු ලෙස ශ්‍රී ලංකා යුධ හමුදවට එක් විය. මාදුරුඔය යුධ හමුද පුහුණු පාසැලේ ආධුනික සෙබළෙකු ලෙස ශ්‍රී ලංකා යුධ හමුදවට එක් විය. මාදුරුඔය යුධ හමුද පුහුණු පාසැලේ ආධුනික පාඨමාලා අංක 06 සාර්ථකව හදරණ ලද මෙම රණවිරුවා 4 වන ශ්‍රී ලංකා පාබල හමුදව වෙත ඇතුලත් කරන ලදි. මොහු මෙම ඒකකයේ කලක් සේවය කරන ලද අතර, යුධ හමුදවේ ව්‍යාප්තිය සමගම අන්තර් ඒකක මාරුවීමක් ලැබ 6 වන ශ්‍රී ලංකා පාබල හමුදව නව ඒකකයකට එක් විය. අනතුරුව 1992.11.20 වන දින පාබල ඒකකයක් ලෙස අලුතින් ස්ථාපනය කරන ලද 7 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව වෙත ඇතුළත් කරන ලදී. ආධුනික සෙබළෙකු ලෙස යුධ හමුද සේවයට එක් වූ මොහු මියයන මොහොත දක්වාම ඊලාම් ත්‍රස්ථවාදයට එරෙහිව උතුරු/නැගෙනහිර ප්‍රදේශයන්හි සේවය කළ මේ රණවිරුවාගෙන් මිළ කළ නොහැකි සේවයක් ඒකකයට, ශ්‍රී ලංකා පාබල හමුදවටත්, යුධ හමුදවටත්, පොදුවේ ලංකා මාතාවටත් ඉටු වූ බව ගෞරවයෙන් සිහිපත් කළ යුතු යි.

මැතක දී සන්නද්ධ හමුද දියත් කළ 'රිවිරැස' 1 මෙහෙයුමට සහභාගී වූ මෙම රණවිරුවා ක්‍රියාත්විතයෙන් පසු 51 වන කාර්ය සේනාංකයේ ක්ෂණික විහිදුම් යතුරු පැදි බණ්ඩයට අනුයුක්ත කරන ලදී 'රිවිරැස' II ක්‍රියාත්විතයෙන් පසු ආරක්ෂක හමුද අණසක පවතින ප්‍රදේහවලට යාපනයේ සාමාන්‍ය ජනතාව පැමිණීම සුළබ දසුනක් විය. මේ නිසාම යාපන අර්ධද්වීපයේ සුහසාධක පුනරුත්ථාපන කටයුතු දිගින් දිගටම සිදුවන වකවානුවක් හැටියට සඳහන් කළ හැක. මෙම වැඩපිළිවෙළ යටතේ යාපනය නගරයේ ස්ටැන්ලි පාරේ ඉදිකරන ලද ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථා නව ශාඛා කාර්යාලය 1996.07.04 වන දින විවෘත කිරීමට නියමිතව තිබිණි. මෙම අවස්ථාවට නිවාස ඉදිකිරීම් හා මහජන උපයෝගීතා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා ඇතුළු රජයේ උසස් නිලධාරීන් සහ යාපනය ප්‍රදේශය භාරව කටයුතු කල බ්‍රිගේඩියර් ඒඑස්එස්කේ හමංගොඩ යූඑස්පී. පීඑස්සී ඇතුළු හමුද නිලධාරීන් යාපන ප්‍රදේශයේ සාමාන්‍ය වැසියන් විශාල පිරිසක් සහභාගී විය. උත්සවයට සහභාගීවන නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යවරයා ඇතුළු විශේෂ පුද්ගලයන්ගේ ආරක්ෂාව සඳහානම් කරන ලද ආරක්ෂක යතුරු බණ්ඩයට මෙම රණවිරුවාද නම් කර තිබුණි. ශාඛා කාර්යාලය විවෘතකල අමාත්‍ය තුමා සහ බළසේනාධිපති ඇතුළු නිළධාරීන් පිරිස එයින් පිටතට පිවිසියේ කච්චේරි ගොඩනැගිල්ලේ පැවැත්වීමට තිබූ සාකච්ඡාවකට සහභාගී වීමට ය. ඇමති නිමල් සිරිපාල ද සිල්වා මහතාත්, බළසේනාධිපති ඇතුළු අනෙකුත් නිලධාරී පිරිස ඔවුන්ගේ නළ රථයට ගොඩවී වාහනය පණ ගන්වනවාත් සමගම සාමාන්‍ය වැසියන් අතරින් එක්තරා කාන්තාවක් කලබලකාරී ස්වභාවයෙන් අමාත්‍ය වරයා සහ අනෙකුත් නිලධාරීන් පිරිස වෙතට ඇදෙන්නට විය. එවිට මෙම රණවිරුවා ක්ෂණිකව ක්‍රියාත්මක කළ තම යතුරු පැදිය ඉදිරියට ගෙන එම කාන්තාව පැමිණෙන ගමන් මාර්ගය අහුරන ලදී. ඒ අවස්ථාවේ තව දුරටත් ඉදිරියට යාමට නොහැකි බව ඒත්තු ගිය නිසා ඇය විසින් තම ඇහෙහි බැඳගෙන තිබූ බෝම්බය පුපුරුවා හරින ලදි. බෝම්බය පුපුරණවාත් සමගම කලු දුමාරයකින් මුලු යාපන නගරයම වසා ගන්නට විය. අන්ධකාර දුමාරය කෙමෙන් කෙමෙන් නිසසල අහසට එක්වෙද්දී මේ අභීත රණවිරුවාගේ සුසුම් පොදද වා තලය සමග මුසුවී හමාරය. සෙ/15296 සාසේ සෙනවිරත්න ඩබ් අයි එම් විසින් ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව ක්‍රියා කිරීම නිසාත්, ස්වේච්ඡාවෙන්ම තම ජීවිතය ගැන ද නොතකා වික්‍රමාන්විත වූත්, අභීතභාවය විදහා දක්වමින්, නිමේෂයකින් ක්‍රියා කිරීම නිසා වැදගත් පුද්ගලයෙකුගේ හා විශාල පිරිසකගේ ජීවිත විනාශය මර්ධනය කර ගැනීමට හැකිවිය. 1983 වසරේ පටන් සෑම වසරකම ජූලි මස 05 වන දිනට හෝ ඊට පෙර දින කලූ ජූලිය සැමරීම කුරිරු ත්‍රස්තවාදයේ ලේ පිපාසයයි. මෙවර යාපන නගයේ ස්ටැන්ලි පාරට තම මරාගෙන මැරෙන කොටි කෙල්ලක් 'ප්‍රභා' එවන්නට ඇත්තේ මේ පාබල රණවිරුවා සිටින බව නොදැන වෙන්න ඇති. මෙවන් විරුවන් අහිමි වීම ඒකකයට, ශ්‍රී ලංකා පාබල හමුදවට, යුධ හමුදවට පමණක් නොව අප මාතෘ භූමියටම දරාගත නොහැකි පාඩුවකි. සදදර විරුව ඔබමියගිය ද ඔබෙන් ඉටු වූ සේවය සද අනුස්මරණීයයි. ඒකකයේත්, ශ්‍රී ලංකා පාබල හමුදවේත්, යුධ හමුදවේත්, මුලු මහත් ජාතියේම උත්තමාචාරය සහ උපහාරය මෙලෙස පුද කරමු.


සැකසුම

**සැරයන් රත්නායක ආර්එම්එබී**

බුද්ධි අංශය 7 ශ්‍රීලපාහ

# ආදරයට විරාමයක්

ය සොයුර, සොයුරිය මේ අපේ කාලයයි. අපට මුහුණ පෑමට ඇති ප්‍රශ්ණ බොහෝ ය. යෞවන ජීවිතය තිබෙන ප්‍රධාන ප්‍රශ්ණයක් වන්නේ රයයි. ඇත්තටම ආදරය යෞවන ජීවිතය මැති ගංගාවේ පිපුණ ලස්සණ නෙළුම් ලක් වැනිය. එයමුළු ජීවිතයම සුවඳවත් රයි. එහෙත් නෙළුම් මල් පිපී ඇත්තේ කාටවත් නෙලා ගන්නට බැරි මඩ වගුරු වලින් ගහන ගංගාවේ අති දුෂ්කර ප්‍රදේශයක දී එසේ නම් මල තව තවත් ආරක්ෂාකාරීවේ. මලට කරදර කිරීමට කිසිවෙකු නොපැමිණෙනු ඇත.

එය අකාලයේ විනාශ නොවෙයි. එහෙත් ඈත අහසේ පියාසර කරන එකම බඹරෙකුට හෝ මලේ සුවඳ දැනෙනු ඇත. බඹරා මල සොයා පියඹන අතර එය ද සිදුවිය යුත්තකි. නමුත් බඹරා මල් පොහොට්ටු කාලයේ මල සොයා නොපැමිණේ. එය තිරිසන් ලෝකයාට ආවේණික ලක්‍ෂණයක් වුව ද දැන් දැන් වඩාත් වැදගත් වන්නේ තරුණයන් වන අපට ය.

යෞවන ජීවිතය තුල ද ආදරය නමැති බඹරාට ඔහේ පියාසර කරන්න ඉඩ හරින්න. පිපෙන්න පෙර මල් පොහොට්ටු විනාශ නොකරන්න වග බලා ගන්න. එය තරුණ අපේ වගකීමයි. බඹරා මල පිපෙන්න පෙර ද මල වටේ කැරකේන්නේ මල ආරක්‍ෂා කිරීමටයි. අප ද විෂ සහිත බඹරුන්ගෙන් මල් ආරක්‍ෂාකර බේරා ගන්නවා මිස අතික් බඹරුන් ආ පලියට අකාලයේ මල් පොහොට්ටු විනශ නොකල යුතු ය.

ප්‍රිය සොයුර මාලියුදේ ගැන ඔබට තේරුම් යන්නට ඇතැයි සිතමි. ඔබ ආදරය කිරීමට නම් ඔබ ආදරය කරන තරුණියට කිට්ටුවෙන් සිටිය යුතු ය. ආදරය කයන්නේ කුමක්දැයි ඇයට වටහා දිය යුතුය. ඇගේ ජීවිතය අකාලයේ විනාශ කිරීමට කිසිවිටෙකත් නොසිතිය යුතු ය.

ඔබ අවංකවම ආදරය කරනවා නම් ඇගේ දියුණුව බලාපොරොත්තු විය යුතු ය. ඇයට දියුණු වීමට හැකි අංග සොයා ඒවා වැඩි දියුණු කර ගැනීමට අනුබල දීම යුතුකමකි. අනවශ්‍ය වින්දන ඇගෙන් ලබා නොගැනීමට වගබලාගත යුතු ය. ඔබ එසේ අවංකව ආදරය කරන විට ඇයට එය නොතේරෙනවා ද.... එය ඇගේ වංක කමකි. කිසි විටෙක ඇය ඔබට නොගැලපේ. ඔබේ මානසිකත්වය තේරුම් ගැනීමට ශක්තියක් නැති ඇය ගැන බලාපොරොත්තු තබා ගැනීමත් ඔබ කරන්නේ ඔබටම ඔබේ ජීවිතය විනාශ වීමට ඉඩ හැරීමකි.

ඔබේ අවංකත්වය ඇයට නොතේරෙනවා නම්හැකි ඉක්මනින් ඇගෙන් ඈත් වෙන්න. එසේ නොකොලොත් ඔබ බලාපොරොත්තු නොවූ කරදරයක වැටීමට ඉඩ ඇත. ඔබ තවත් දියුණු වීමට උත්සාහ ගන්න. කිසි විටෙක ඇයට වෛර නොකරන්න. ඔබ සිටියාටත් වඩා සතුටින් සිටින්න. හොඳට අදින්න. පුළුවන්නම් ඉගෙන ගන්න. ඔබේ මානසිකත්වය ඇය තේරුම් නොගන්නවා විය හැක. ඒ නිසා ඔබේ ආදරය ගැන එක විටක පමණක් ඇයට ඉගියක් පමණක් දෙන්න. ඒ ගැන පැකිලීමක් නොවේ නම් ඔබ පසුබට වන්න එපා. ඇයට තවත් තරුණයෙක් සිටිනවා විය හැක.

ඒ වගේම ඔබටත් අවංකව ආදරය කරන තවත් තරුණියක් ලෝකයේ සිටිනවා ඇත. තරුණ ජීවිතය තුළ ආදරය ප්‍රශ්ණයක් කරගන්න එපා. එය අත්දැකීමක් පමණක් කරගන්න හේතුව... ආදරයෙන් ලබන ජය සතුටින් ලබන පොහොසත් බව වන අතර ආදරයෙන් ලබන පරාජය අත්දැකීමෙන් ලබන පොහොසත් බවයි.

'ආදරය පිදිය යුත්තේ ආදරයෙන්මයි ආදරය ලබාගත යුත්තේ ද ආදරයෙන්මයි ආදරය ජීවිතයේ උතුම්ම සැපතයි'

**සෙ: 20946 කෝප්‍රල් සිරිමානිස්**
මූලස්ථානය 2 (සෙවි) ශ්‍රීලපාහ
යුධහමුද කඳවුර, සිංහපුර,
වැලිකන්ද

# පිස්සුද සර්

සුමතිපාල යුධ හමුදවට බැඳි දීර්ඝ සේවා කාලයක් ගෙවුන ද තවමත් සාසෙ සෙබලෙකි. යුධ හමුද ක්‍රියාකාරකම් කෙරේ දක්වන අලසබව හා නිරතරව නිනොසෙනොවීම හේතුවෙන් සාසෙ නිළයෙන් ඉහළට ගමන් කිරීමට සුමතිපාලට නොහැකිවිය. මේ නිසාම ඔහු එතරම් උනන්දුවකින් රාජකාරියේ නිරත නොවිය. නිරතුරුවම තමන්ගේ අවශ්‍යතාවයන් පමණක් ඉටුකර ගනිමින් කාලය ගත කරන ලදි.

හදිසියේ'ම 'සුමතිපාල' ඇතුළු කණ්ඩායටම මඩකළපුව ප්‍රදේශයේ රාජකාරියේ නිරතවීමට සිදුවිය. සුමතිපාල මාර්ග බාධක රාජකාරීන්හි දෛනිකව නිරත වූහ මාර්ග බාධකය හරහා ගමන් කරන වාහන පරීක්‍ෂා කරන අතරම ඒවායේ රියදුරන්ගෙන් යමක් ලබා ගැනීම සුමතිපාලගේ දින චරියාව විය. මේ පිළිබඳව කළකිරුණ තවත් සෙබළුන් මේ පිළිබඳව නිලධාරීන් අණදෙන වෙත පැමිණිළි කරන ලදී. දිනක් මේ පිළිබඳව සොයා බැලීම සඳහා සුමතිපාලගේ මාර්ග බාධක රාජකාරි කෙරේ නිළධාරී අණදෙන විමසිලිමත්ව සැඟවී බලා සිටින ලදී. සුපරුදු පරදි මාර්ග බාධකය හරහා ගමන් කිරීමට පැමිණි වාහනයක් නතර කළ සුමතිපාල එය පරීක්‍ෂාකර රියදුරු සමග යමක් කථා කරන ලදී. පසුව රියදුරා විසින් 'සිගරට් පැකට්ටුවක්' සුමතිපාල වෙත පිළිගන්වන ලද අතර වාහනය පිටත්ව යන ලදි. වහා ක්‍රියාත්මක වූ නිලධාරී අණදෙන සුමතිපාල වෙත පැමිණ. මෙකක්ද තමුසේ ඒ වැඩේ තේරුම හැමදමත් තමුසෙ වාහනවලින් ඒක එක දේ ගන්නවා කියල මට පැමිණිලි ලැබිල තියනව අද අතටම අහුවුනා දැන් තමුසෙ මොකද කියන්නේ, 'මදක් නිහඬව සිටි සුමතිපාල 'පිස්සුද සර් ඒ ගියේ මගේ බාප්පාගේ පුතා බලෙන්ම වගේ මට සිගරට් පැකට් එකක් දීලා ගියා හොරවැඩක් කරනවා නම් සර් ලඟම ඉද්දී මම ඒක ගන්නවා ද'

සත්‍ය සෙවීමට නොහැක කාරය පිටත්ව ගොස් හමාරය නිලධාරියා ආපසු හැරී යනවාත් සමගම සුමතිපාල සිගරට් පැකට්ටුවේ ඉටි දවටනය ඉවත් කරන්නට විය.

**සැරයන් අශෝකබංඩාර ටීඑම්**
බුද්ධි අංශය - 3 ශ්‍රීලපාහ
මට්ටුවිල්

## "සැබෑ යැයි සිතෙයි නම් කාහටත් මේ වදන්"

- ජීවිතයේ උතුරා යන සතුට, අපරිමිත සෙනෙහස, සද මනකයේ සිහිවටනයක් වනනේ මිනිසාගේ මිනිස්කම හඳුනාගත් විටය.
- මිනිසා රැකිය යුතු උසස්ම පිළිවෙත සත්‍ය හෙළි කිරීමයි.
- විල්ලුද පලස් මත ඇවිදින පුද්ගලයාට වඩා බොරළු මත ඇවිදින්නෝ අනුනගේ දුක් දනිති. කරදර හඳුනතිඒ නිසා ඔවුන් යහපත් ය.
- අයථා ලෙස උපයන ධනයෙන් සැප විඳිනවාට වඩා දිළිඳුව සිටීම ගෞරවයකි.
- නොලැබෙන දෙයකට නිරන්තරයෙන් බැඳුන සිතකට සදකාලිකවම සැනසීමක් නැත.
- යුධ සෙබලා ජාතියේ මුර දෙවියාය එබැවින් ඔබ රකින සෙබලා රැකිය යුත්තේ ද ඔබ විසිනි.
- බිය විය යුත්තේ මරණයට නොවේ. මැරි මැරි ජීවත්වීමටය.
- රැස්කර ගන්න රන් රිදී නොව බුද්ධිය. මලෙහි වෙනසක් නැත.
- අප එකිනෙකාට උදව් කළ යුතුය. සොබා දහමේ නීතිය එයයි.
- හපන්කම නොවැටී සිටීම නොව වැටුන සෑම විටම නැගී සිටීමය.
- බොහෝ දෙනෙකුහට නැත්තේ ශක්තිය නොව අධිෂ්ඨානයයි.
- උතුම් මනසක් ඇති තැනැත්තා සෑම දෙයකින්ම ජය ගනී.
- පරාජයෙන් මිනිසකු අධෛර්ය කළ නොහැක. එය ඔහු දමනය කිරීමක් පමණි.
- 'සාමය' යනු සාධාරණ සිතුවිල්ලයි. ජීවිතය වනාහි කෙටි ක්‍රියාකාරී දිනයකි

**සෙ/14945 සාසෙ ජයසිංහ ජේපීආර්**
(4 ශ්‍රීලපාහ - නි.කා.ව)
මූලස්ථානය 2 (සෙව්) ශ්‍රීලපාහ - සිංහපුර, වැලිකන්ද

## රිවිරැස සෙබළ ඇසින්

මුළු ලෝකයේම නෙත් ශ්‍රී ලංකාවේ හමුදාව කෙරෙහි ඇදබැඳ ගැනීමට සමත් වූ මෙම මෙහෙයුමට සහභාගීවීමට ලැබීම මා වසර දහයක් පමණ ගෙවූ යුධහමුද ජීවිතයේ ලැබූ අද්විතීය අවස්ථාවක් ලෙස සලකන්නෙමි. එමෙන්ම 6 ශ්‍රී ලංකා පාබල හමුදාව වන අප ඒකකය මේ ක්‍රියාන්විතයේ මුලසිට යාපා පටුන ජයගන්නා අනතිබවනීය අවස්ථාව නෙක් ඉන්ද්‍රඛීලයක් ලෙස ඉදිරියට යෑම අපගේ සතුට දෙගුණ කරවන්නෙකි. එද රජදවස මද්දුම බංඩාර කුමරුගේ වැඩිමහල් සොයුරු මරණයට බියේ පිටුපසට ගමන් කරද්දී මද්දුම බංඩාර කුමරු ඉදිරියටවිත් අයියන්ඩියේ බිය නොවන්න මැරෙන සැටි මම පෙන්වන්නම් කියා ඉදිරියට විත් නොහියව මරණයට මුහුණ දුන් ආකාරයට මෙද ක්‍රියාන්විතයේ දී සමහර ඒකක නොයෙකුත් දැ කියමින් ඉදිරියට යැමට මැලිකම් දක්වද්දී හෙල රණවිරුවන් සිහි ගන්වමින් අප ඒකකය ඉදිරියට ගියේ මහත් අභිමානයෙනි. එය පාබල සෙබලුවන අපටත් අප රෙජිමේන්තුවටත් මහත් ආඩම්බරයකි.

අණදෙන නිලධාරි තුමන්ගේ සහ දෙවන අණදෙන නිලධාරි තුමා ඇතුලු සියලුම කණ්ඩායම්වල නිලධාරී අණදෙනවරුන්ගේ සහ බණ්ඩාහාර නිලධාරීන්ගේ මෙන්ම අනෙකුත් ජේෂ්ඨ හා කණිෂ්ඨ නායකයින් මෙන්ම සියලුම නිළයින් මෙම ඒකකයට නව පත්තරයක් දීමට මුලසිටම අධිෂ්ඨාන පූර්වකව කටයුතු කළේ ය. මෙහි දී අණදෙන නිලධාරීතුමාගේ උත්සාහය කාගේත් පැසසුමට ලක්වුණි.

මෙවැනි දැවැන්ත මෙහෙයුමක් ජයග්‍රහණය කරන්නට ලැබුනේ මුළු මහත් යුධ හමුදාවම එක්සත්ව කටයුතු මනාව සැලසුම් කළ බැවිනි. එමෙන්ම ක්‍රියාන්විතයට පෙර සෙබලුන් ඇමතූ ජ්‍යෙෂ්ඨ හමුද නායකයින් ඔවුන්ගේ කථා තුළින් සෙබලුන්ගේ චිත්ත ශක්තිය සහ සිත් ඇදබැදගැනීමට සමත් වන අයුරින් කථා පැවැත්වීම මෙම ජයග්‍රහණයේ එක් පැතිකඩක් ලෙස දකින්නෙමි. මේ අයුරින් ඉදිරියට යැමෙන් ද්‍රවිඩ ත්‍රස්ථවාදීන් විනාශ කිරීමට ඇති හැකියාව ඉතා ඉහල බව මට හැඟෙන්නෙකි. රිවිරැස තුළින් අපි යුද්ධය පමණක් ජය නොගත්තෙමු. සෙබලෙකු සතු විනීතකම මානුෂික ගුණාංග විනය මේ මගින් අපි ලොවට පෙන්වූයෙමු.

ඉතින් මේ ජයගත් දේ එලෙසින් රැක ගැනීම සෙබළ අපගේ යුතුකමක් වන්නේ ය. ඉදින් හෙට දින ඒ සඳහා ඊළඟ පියවර කල්යල් බැලීමකින් තොරව පා තබන්නට සූදානම්ව සිටින්නෙමු.

පසුවදන: නියම මග පෙන්වීමක් හා නායකත්වයක් යටතේ සිදුනොකළ හැකි දෙයක් නැත.

**සෙ/14713 කෝප්‍රල් කීර්තිරත්න කේපීඩීඒ**
6 ශ්‍රීලපාහ "සී" කණ්ඩායම

## සෙබළුන්ගේ චිත්ත ධෛර්ය උසස් මට්ටමක පවත්වා ගැනීමට කණිෂ්ඨ නායකයන්ට ගත හැකි සරල ක්‍රියා මාර්ග කිහිපයක්

1. පුද්ගලිකව සෑම සෙනියකුම සම්මුඛ පරීක්ෂණය කිරීම. මෙයින් සෑම සෙබලාගේම ජීවන මට්ටම, මානසික තත්ත්වය, සහ හැඟීම්, ආකල්ප දැනගත හැකිය. එවිට එම සෙබලා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී ඔවුන්ගේ ඉහත ලක්ෂණ සැලකිල්ලට ගත හැකිය.
2. වැඩ පැවරීමේ දී එක් එක් සෙනියාගේ හැකියාවන් පිළිබඳව ප්‍රමුඛත්වයක් දීම.
3. රාජකාරිය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාදීම මගින් එහි දුෂ්කරතා පිළිබඳ සෙබලුන්ගේ ඇති අප්‍රසන්න හැඟීම් මග හරවාගත හැක.
4. සෙබළුන් හට නිසි පරිදි විවේක ගැනීමට අවස්ථාව සලසා දීම.
5. සෙබළුන්ගේ පුද්ගලික සනීපාරක්ෂාව සඳහා කටයුතු කිරීම.
6. සෙබළුන්ට ඇති සුභසාධක ක්‍රියා මාර්ග ගැන ඔවුන්ට පැහැදිලි අවබෝධයක් ලබාදීම සහ ඒවා ලබා ගැනීමට ඔවුන් පෙළඹවීම/යොමු කිරීම.
7. විවේක අවස්ථාවන්හිදී විනෝද ක්‍රීඩා සහ විවිධ කලාත්මක කටයුතු (උදා: සංගීතය) සඳහා ඔවුන් යොමු කිරීම මගින් ඒකාකාරී බව මග හැරවිය හැක.

**නි/62421 2/ලුති : එස් විජේසිරිවර්ධන, ශ්‍රීලපාහ**
7 ශ්‍රීලපාහ

# කදිම බූට් පොලිස්

රිවිරැස ක්‍රියාත්විතයට අප ඒකකයද සහභාගී වීම සඳහා නියම කර තිබූ ස්ථානය වෙත පැමිණෙන විට හතර වටින්ම සණ අඳුර ගලාගෙන එමින් තිබුණි. රාත්‍රි ආහාර ගැනීමෙන් අනතුරුව පසුද අළුයම ක්‍රියාත්විතයට එක්වන හෙයින් එම තාවකිලිකව ස්ථාන ගත වී සිටි ස්ථානයේ ම විවේක ගන්නා ලෙස දැනුම් දී තිබුණි. සමහරක් අය පැළඳ සිටි සප්තු දෙක පවා නොගලවා නින්දේ පසුවුනි. කෙසේ වුව ද ක්‍රියාත්විතයට පෙර ක්‍රියාත්විතය සබැඳිව සියළුම උපදෙස් ලැබී තිබුණු අතර, නිළ ඇඳුම් නිසි අයුරු තිබිය යුතු සේම පැළඳ සිටින බූට් යුවල නිරතුරුවම පොලිස් තවරා තිබිය යුතු බැව් දැනුම් දී තිබුණි.

අනතුරුව අළුයම ගමන සඳහා සෙබලුන් සූදනම් වන අවස්ථාවේදී එක් සෙබලෙකු තමාගේ බූට් පොලිෂ් ටින් එක අමතක කොට දමා ඇවිත් තිබූ හෙයින් හිමිහිට වටපිට බලා ඒ අසල තිබූ පැක් එකට අත දමා අතට අසුවූ පොලිස් ටින් එකෙන් ලහිලහියේම බූට් යුවලේ හැකි තරම් පොලිස් තවරාගෙන එම ටින් එක අයිතිකරුගේ පැක් එකට දමා කිසිදෙයක් නොවූනාසේ ගමනට සූදනම් විය.

නියමත වේලාවට ක්‍රියාත්විතය ආරම්භ විය. කෙමෙන් කෙමෙන් අඳුර තුරන් වී හතර වටත් එළිය වැටෙමින් පැවතිණි. හොඳට එළිය වැටුන පසු තමන්ගේ බූට් දෙක දිහා බලා අවට සිටින තම මිතුරන් සිනාසෙන්නට වූයෙන් ක්ෂණිකව පැලඳ සිටි සපත්තු දෙක දෙස බැලිණ. ඔහුට කැරකිල්ල හැදුනේ එවිට ය. බූට් දෙක තනිකර සුදුපාට ය. කරකියා ගත හැකි දෙයක් නොමැතිව තරු විසි විය. මිතුරන් සිනාසෙති. ඔහුගේ හොරකම දැන් අතටම අසු වී ඇත. ගත වූයේ මොහොතකි තමන් හාරව සිටින සැරයන් වරයා පැමිණ කනෙන් ඇදගෙන ගියේ ය. ඒ මොහොතේ සැරයන් වරයාට යකා නැග තිබුණි. කරුණු සොයා බැලූ විට දැනගන්නට ලැබුනේ එම සැරයන් වරයාත් සෙබලාත් ක්‍රියාත්විතයේ දී කැෂුවල්ටි පාටියට අයත්ව සිටිය අතර, එම සැරයන් වරයා බුලත් කෑමට පුරුදුව සිටි හෙයින් පොලිස් අවසන්ව තිබූ හිස් ටින් එකක හුණු කිල්ලෝයට වශයෙන් පාවිච්චි කොට ඇති අතර, විශාල ක්‍රියාත්විතයක් හෙයින් ටින් එක පිරෙන තුරු හුණු රැගෙන ගොස් ඇත. පෙර දින රාත්‍රියේ පොලිස් යැයි සොරාගෙන සපත්තු දෙකේ අතුල්ලා ඇත්තේ එම හුණු කිල්ලෝටයේ හුණු ය. මෙයින් දින කීපයක් යනතුරු ම එම සෙනියාට සපත්තු දෙක කළු කර ගැනීමට නොහැකි වූ අතර, සැරයන් වරයාට හුණු නැතිව බුලත් කෑමට සිදුවිය. කෙසේ වුව ද වෙහෙසට පත්ව සිටි අපහට මෙය සිනහ පහල වුණ සිද්ධියක් විය.

කේඑස්එන්
"ඒ" කණ්ඩායම - 6 ශ්‍රීලපාහ

# මරණයේ සීනුව

මරණයේ සීනුව යුධ ගිණි අවි ළඟ රැව් දෙන්නේ
ජීවිත ඉරණම මරණය සමගින් හිනැහෙන්නේ
යුධ අවි පමණයි අප සිත් දැන හඳුනන්නේ
මේ ඉරණම කවද කොතැනද නැහැ දන්නේ

මාගේ වේවා සිත එක වාගේ දිස් වෙන්නේ
රට දූප්පත් කමටයි එරෙහිව ඉන්නේ
ණය ළඟ පෙනුනත් කොටින් නැහැ ඉඩ දෙන්නේ
යායුතු ඉරණම කොයි අත වේදැයි නැහැ දන්නේ

ඉතිහාසයේ හුරු සුවඳය අද මට ගෙන එන්නේ
කොටියයි අවියයි ලංවී තුවන් රවටන්නේ
මරණයේ සිතුවම කවද වේදෝ නැහැ දන්නේ
යුද්ධය අවසන් වනතුරු සටනේ ඉන්නෙම් දෙවියනේ

සෙ/13100
සාසෙ ජයසුන්දර ජේඑිඩීඑ්ඩබ්
1 ශ්‍රීලපාහ අණ සහ පාලන කණ්ඩායම
පලාලි සොයුරාගේ නැඟණිය සන්ධ්‍යා කුමාරි විසින් නිර්මාණය කරන ලදී.

# සොයුරෙකුගේ වියෝව!!

සුන්දර දිනයක අවසානයේ.. ඝණ අන්ධකාරය ක්‍රමක්‍රමයෙන් පරිසරය ගිලගනිමින් පවතී. ඒ අන්ධකාරය කිව නොහැකි තරම් භයංකාරයි. හරියටම මාරය ඇවිත් අපට අතවනනව වගෙයි. පරිසරය පුදුම නිහැඬියාවක් ව තියෙන්නේ ඒ නිහැඬියාවට විටින් විට බාධා පමුණුවන්නේ උතුරු ප්‍රදේශයට අරක්ගත් සතුරු රැළක් විසින් පමණයි.

ඉඳහිට පරිසරවය දෙදරවාගෙන එන වෙඩි උණ්ඩ වල ශබ්දයට නිදි දෙවුදුව මගෙන් ඈත් වෙනවා..'ඒයි, අන්න අරුන් ආයිත් ගහනවා. නැගිටපන් මිනිහෝ.... නැත්නම් අපි ඔක්කොම ඉවරයි...' ඔන්න නැවත පාරක් සතුරු රැළ විසින් අපට ප්‍රහාරයක් දියත් කරල අපි ස්ථානගත වන තැන්වලට නියමාකරව ගිහින්. සතුරන් මෙල්ල කිරීමට උත්සාහ ගත්තා: 'මුං ගහන්න එන්නේම රැට නේ': 'නැත්නම් දවල්ට එන්න ද? 'අම්මෝ... මං.... ඉවරයි'

මම ලඟ හිටිය යාළුව දිහා මට ඉබේටම බැලුණි. 'අයියෝ' මගේ මුවින් පිටවුණා. මගේ හොඳම යාළුවත් උන් බිල්ලට ගත්තා.

ඇයි සමාජය මෙතරම් කුරිරු. හරිම අහිංසක දූප්පත් කොල්ලෙක්. දූප්පත්කම තුරුලුකරගෙන ලොවට පා තැබූ දවසේ ඉඳල වින්දේ දුක පමණයි. තාත්තාට අංසභාගෙ, අම්මයි, නංගියි මොනව කරන්න ද?.... නංගීට උගන්වන්න? තාත්තාට බෙහෙත් ගේන්න? ගෙදර වියදම්? සේරටම පිළිතුරු තිබුණේ මෙයා ළඟ. ඒත් අහෙ'... කරුමෙ මේකද? දැන් ඉතිං මුළු පවුලම අන්ත අසරණයි නේද?...

'කමක් නැහැ, මොනව කරන්නද දෛවය විසින් උඹට උරුම ඔච්චරවයි මචං.' උඹව අපි හිරු නැගන එන මොහොතත්, හිරු බැස යන මොහොතත් සිහිපත් කරන්නෙමු.'

'මට කරන්නපුළුවන් එච්චරයි.... මොකද උඹේම පත්තියේ තවත් එකෙක් නිසා මමත්'...

සෙ/15459 ලා/කෝ බන්දුසිරි අයිපීඑි.
1 ශ්‍රීලංපාහ



